ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2015 ක් වූ මැයි 24 ඉරිදා 149 වෙළුම 49 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 - පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදී. QD/20/NEWS/2015

ආරම්භය : 1866 ජුනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## සුපුවත මේ ඉරිදා

දේවමාතාවන් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂී ගති ලක්ෂණ අළලා සැකසුනු සුපුවත කතෝලික රූපවාහිනි වැඩසටහන් මැයි මස 24 ඉරිදා ප.ව. 6.00 ට ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය වේ.

මෙවර සුපුවත වැඩසටහනට හයිසින්ත් විජේරත්න, රිචඩ් මානමුදලි සහ ජූඩ් අයිවන් රඟපෑමෙන් දායක වෙති. ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමන් ගේ තිර රචනයක් වන මෙය රංජුල සේනාධීරගේ අධ්‍යක්ෂණයකි.

## සිනගෝගය

මැයි 22 හා 29 දිනවල ප.ව. 7.30 සිට 8.00 දක්වා ස්වදේශීය සේවය 91.7 FM , 91.9 FM ඔස්සේ සිනගෝගය වැඩසටහන විකාශනය වේ. ඥානාර්ථ ප්‍රදීපය පුවත්පත වසර 150 වසරට පියනැගීම නිමිත්තෙන් මේ වැඩසටහන් විකාශය වන අතර ජූඩ් අයිවන්ගේ නිෂ්පාදනයකි.

## ජුබිලි වසර ප්‍රකාශය ජුනි 06 සෙනසුරාදා



දැනට මෙරට පළවන ඉපැරැණිම සිංහල පුවත්පත වන "ඥානාර්ථ ප්‍රදීපය" සිය 150 ජයන්ති වසරට පිවිසීම නිමිත්තෙන් ලබන ජුනි 06 සෙනසුරාදා ජුබිලි වසර ප්‍රකාශයට පත් කිරීමේ නිල මෙහෙයක් පැවැත්වීමට කටයුතු සංවිධානය වෙමින් පවතී.

1866 ජුනි 07 වැනිදා උපත ලද ජාතික කතෝලික පුවත්පත වන "ඥානාර්ථ ප්‍රදීපය" කාලයේ තාලයට හැඩගැසෙමින්, සියලු අභියෝග හා ගැටලු ජය ගනිමින් පැමිණි ගමනට දෙවි මහෝත්තමයාණන් වහන්සේට තුති පිදීම මෙදින සිදු කරන්නට නියමිතව ඇත. සියලු විස්තර සඳහා නොවරදවාම ලබන ඉරුදින ඥානාර්ථ ප්‍රදීපය කියවන්න.

## කරිටාස් මුල් පුටුව ආසියාවට!



ලෝක කතෝලික සභාවේ දයා සේවා හස්තය වන කරිටාස් ජාත්‍යන්තරයේ සභාපති තනතුරට ඉතිහාසයේ පළමු වරට ආසියාකරයේ පිලිපීනයේ මැනිලා අගරදගුරු අති උතුම් ලුයිස් ඇන්ටෝනියෝ කාදිනල් ටැග්ලේ හිමිපාණන් පත්ව සිටී.

ආසියාතික සසුන් පිය සංචාරයේදී එතුමන් හද බැඳ ගත් මෙතුමා දිළිඳුන්ගේ සැබෑ හිත මිතුරකු සේ නමක් දිනා ඇත.

## රාගම සා. ජෝශප් බිහිරි විදුහලේ 80 වන සංවත්සරය

රාගම, සා. ජෝශප් බිහිරි විදුහලේ 80 වන සංවත්සරය නිමිත්තෙන් දෙවිඳුන්ට තුති පිදීමේ දිව්‍ය යාගය හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මැයි මස 29 වන සිකුරාදා උදේ 9.00 ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වීමට විදුහල්පතිනි ගරු ඇන් නිර්මලී පැවිදි සොහොයුරිය ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය විධිවිධාන යොදා ඇත.

# වනිතා පැවිදිවරයේ අනුහස් ප්‍රතිභාව සසුන් පිය ඇගයීමට

- පැවිදිවරය දෙවියන් වහන්සේ වෙතින් ලත් තිළිණයක්
- පැවිදි සොයුරියන් මරිය අප ස්වාමිදුවගේ සළකුණයි
- වනිතා පැවිදිවරයේ සළකුණ අපූර්ව පතිභක්තියයි
- කතෝලික සභාවේ ප්‍රේමය මාතෘකයි මාතෘක ප්‍රේමය දේව මාතාව තුළින් අප අත්දකිනවා
- ආත්මික පිය තනතුරට ඔබේම ආත්මික මවක් පත් කරගන්න



අති උත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියතුමා පැවිදි වසර වෙනුවෙන් මැයි 16 සෙනසුරාදා රෝමයේ දී විසිපන් දහසකට අධික පැවිදි සොයුරු සොයුරියන් පිරිසක් හමුවිය. එහිදී ඒ අය නැගූ ප්‍රශ්න වලට සසුන් පියා දුන් පිළිතුරු අතර ඉහත සඳහන් කරුණු ද මූලික වශයෙන් කැපී පෙණුනු බව වතිකාන ආරංචි මාර්ග සඳහන් කරයි.

ඥානාර්ථ ප්‍රදීපය

## රදගුරු පදවි වගතුග

# පදවියෙන් පදවියට

ක්‍රිස්තු වර්ෂ 2015
මැයි 24 ඉරිදා



හැඳල බලගල නව මීසම් සේවක ගරු නුවන් රුද්රිගු පියතුමා පසුගියදා මීසම් වාසීන් විසින් මහත් හරසරින් පිළිගන්නා ලදි. හිටපු මීසම් සේවක ගරු තුසිත් ප්‍රනාන්දු පියතුමා සහ ගරු රුවන් දේශප්‍රිය පියතුමා සමග නව මීසම් සේවක පියතුමා දෙව්මැඳුර වෙත කැඳවාගෙන පැමිණි අවස්ථාව.

**නිමල් පෙරේරා**

# ගොඩැල්ල මඩු චාරිකාව ජූනි 5 සිට 7 දක්වා

ගොඩැල්ල මීසම් සංඝයට අයත් ගොඩැල්ල තඹරවිල මෝරුක්කුලිය දන්කොටුව දෙව්මැඳුරු හතරට අයත් සැදැහැවතුන්ගේ සහභාගිත්වයෙන් මරද මඩු සිද්ධස්ථානයේ පවත්වන වාර්ෂික මඩු මංගල්‍යය ජූනි 05-07 ඉතාමත් උත්සවාකාරයෙන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

ගොඩැල්ල මීසම් සංඝය විසින් තෙවන වරටත් පවත්වන මෙවර මංගල්‍යයේ මංගල දිව්‍ය යාගය කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන් විසින් සිදුකරනු ලැබේ.

**එච්. ඒ. සිරිල් පෙරේරා**



පේරාදෙණිය මීසම් සේවක ගරු ලලිත් තුෂාර අමරසිංහ පියතුමන් නව පත්වීම ලද කඩියන්ලෙන මිසමට එතුමන් සමග පැමිණ පේරාදෙණි මීසම් වාසීන්, ගරු ඇන්ටන් ගවස්කර් පියතුමන් සහ ගරු සහෝදර කුමාර් සහ පැවිදි සොයුරියන් ප්‍රදීප ඡායාරූපයකට මුහුණ දුන් අයුරු.

**ජූඩ් ජේ. ප්‍රනාන්දු**

# සුබාසිංසන



මඩකලපුව රදගුරු අතිඋතුම් ජෝශප් පොන්නයියා හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය මැයි 24 දාට යෙදේ. එතුමනට සුබ පැතුම්!



භාග්‍යවත් ජුසේවාස් මුනිතුමන් සුදුවරයට එසවීම නිමිත්තෙන් තුති පිදීමේ දේව මෙහෙයක් මහනුවර සාන්ත අන්තෝනි ආසන දෙව්මැඳුරේදී මහනුවර රදගුරු අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ජුසේවාස් මුනි ජාතික ලේකම් කාර්යාලය මෙහෙයවීමෙන් පැවති මෙයට ගාල්ල, රත්නපුර, මහනුවර, කොළඹ පදවි වලින් නියෝජිත පිරිස් සහභාගි වී සිටි අතර රදගුරු හිමි දෙපසින් ජාතික කාර්යාංශයේ ලේකම් ගරු ඇන්ටන් ප්‍රනාන්දු පුල්ලෙ හා ගරු බීඩ් සිල්වා පියතුමෝද වෙති.

**තියබෝල්ඩ් සමරතුංග**



අගරදගුරු පදවියේ මරියහමුදා සම්මේලනයට සමගාමීව, අක්‍රියව තිබූ තලවිල සිද්ධස්ථානයේ මරිය හමුදා ප්‍රසීඩියම නැවත ආරම්භකිරීම සිද්ධස්ථාන පාලක ගරු නෙල්සන් සමන්ත පියතුමාගේ ඉල්ලීම මත සිදුකැරිණ. සාමාජිකයන් දාසය දෙනකුගෙන් සමන්විත කාන්තා ප්‍රසීඩියමක් මෙහිදී ආරම්භ කරන ලදි. මේ අවස්ථාවට හලාවත කොම්ටිසියම් සභාවේ ආත්මික අධ්‍යක්ෂ ගරු ග්‍රෙගරි හැරල්ඩ් පියතුමා හා නිළධාරීන් දෙදනෙකු සහභාගි වූහ. කොළඹ කොම්ටිසියම් සභා ලේකම් බෙනී ජයමාන්න සහෝදරයා එහිදී කතා කළ අයුරු.

ඡායා - **බෙන්ජමින් කිරිහෙට්ටි**



වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සංවිධානය කළ පසන් ගායනා තරගාවලියේදී ළමා අංශයේ ප්‍රථම ස්ථානයද, වැඩිහිටි අංශයේ දෙවන ස්ථානයද, තරුණ අංශයේ තෙවන ස්ථානයද හිමි කර ගත් සිරිගම්පල මීසමේ සන්තානාපුර, ශු. ආනා තුමියගේ දේවස්ථානයට අත් ජයග්‍රාහී කණ්ඩායම් මීසම් සේවක ගරු හයසින්ත් තිසේරා පියතුමා සහ ගරු සංජීවනී පැවිදි සොයුරිය සමග ප්‍රදීප ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**පී. ආර්. පී. එන්. අල්මේදා**



කටුකුරුන්ද රෝ. ක. මහා විදුහල හා මග්ගොන සාන්ත මරියා විදුහල අතර දෙවන වරටත් මෙවර පැවැති එල්ලේ තරගයෙන් කටුකුරුන්ද රෝ. ක. මහාවිදුහල ජය ලැබීය. මග්ගොන සාන්ත මරියා විදුහලේ විදුහල්පති ඩබ්ලිව්. ඒ. ඩී. අජන්ත චානක, කටුකුරුන්ද රෝ. ක. මහා විදුහලේ විදුහල්පති, ඩබ්ලිව්. ඒ. පුබුදු සම්පත් යන මහත්වරුන්ගේ මඟපෙන්වීම මත ආදි ශිෂ්‍ය සංගම්වල සහයෝගයෙන් මෙය සංවිධානය කෙරිණ.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



හලාවත පදවියේ ඉලන්තිඅඩිය මීසමට අයත් පනියඩිය ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ ගම්වාසී සියලු දෙනාගේ දායකත්වය මත ඉදි කෙරුණු ශු. ජුසේ මුනිඳුන්ගේ ප්‍රතිමාව තැන්පත් කිරීමේ මංඩපය හලාවත කරිටාස් අධ්‍යක්ෂ ගරු වයමන් කෲස් පියතුමා විවෘත කළේය. ඉලන්තිඅඩිය මීසම් සේවක ගරු රනිල් සඳරුවන් පියතුමා ද, ගරු මරියගොරිත්ති පැවිදි සොයුරියද මීසම් ජනතාවද ඊට එක් වූහ.

**ප්‍රිසිල්ලා ෂර්මිලා**

# 91 වැනි සංවත්සර උලෙළ

විල්ලෝරාවත්ත මීසමේ පැරණිම ගිහි සංවිධානය වන ශුද්ධ වු කාර්ලෝ බොරෝමයෝ මුනිඳුන්ගේ පිහිටාරක්ෂක සමිතියේ 91 වැනි වාර්ෂික මහා සභා රැස්වීම පසුගියදා මීසම් සේවක ගරු ටෝනි පිංතු හා සහායක ගරු ටෙගන් ප්‍රියදර්ශන පියතුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

ඉදිරි වර්ෂය සඳහා සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ලෙස ලලන්ත සිල්වා, ඇන්ටනි ගෝමස් හා සුසිල් සිල්වා මහත්වරුන් තේරී පත්වූ අතර කාරක සභාවක් ද පත් කර ගැනිණි.

**ට්‍රිසිල් ඇෆ්. මැන්දිස්**



කොරළවැල්ල සහ අවට ගම් වල මන්ද බුද්ධික දරුවන් වෙනුවෙන් අවුරුදු 15 ක් පුරා සේවයක් කරමින් මෙත් මිහිර ආයතනය ආරම්භ කිරීමට පුරෝගාමීවු ගරු ජසින්තා පැවිදි සොයුරිය ස්ථාන මාරුවක් ලැබ කඩොල් කැලේ මීසමට යාම නිමිත්තෙන් කොරළවැල්ල ජනතාව සමුදීමේ උත්සවයක් පැවැත්වූහ. එහිදී මීසම් වාසීන්ගේ පරිත්‍යාගය මීසමේ දහම් පාසල් ගොඩනැගිල්ලේ වැඩ නිම කිරීමේ කටයුතු වෙනුවෙන් එතුමිය විසින් නැවතත් මීසමට පරිත්‍යාග කරන ලදි. මීසම් සේවක ගරු ෂිහාන් ඉන්දික පියතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සව කටයුතු සංවිධානය කරන ලදි.

**රොෂාන් පී. ප්‍රනාන්දු**



උතුරු පයාගල ශුද්ධ වු ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුර සඳහා නව සීනුකූඩුවක් ඉදිකිරීම වෙනුවෙන් මුල්ගල් තැබීම මීසම් සේවක ගරු සිසිර සමරකෝන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. සීනු කූඩුව ඉදිකිරීම සඳහාද දෙව්මැඳුරු මීසම් සභාවට අයත් සැදැහැවත් බැතිමතකු දායකත්වය ලබා දීමට ඉදිරිපත් වී ඇත.

**පී. නිහාල් ප්‍රනාන්දු**

# පල්ලන්සේනෙන් තරාලට

පල්ලන්සේන සහයක ගරු සුරංග නිරෝෂන් පොන්සේකා පියතුමා තරාල මීසම් සේවක වශයෙන් පත්වීම් ලැබ සමුගත්තේය.

මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමාගේ මඟපෙන්වීම යටතේ අධ්‍යාත්මික සේවාවක් කළ එතුමා වෙත බැතිමතුන් විසින් පුදන ලද මුදල් ත්‍යාගය ශුද්ධවු ත්‍රිත්ව දේවස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා නැවත ජනතාවටම ස්තුතිපූර්වකව බාර දුනි.

**මෙල්වින් ද කොස්තා**

# මල්පිටිය මීසමට මහඟු සේවාවක් කර පියතුමා නික්ම යයි

කුරුණෑගල පදවියට අයත් මල්පිටිය ශුද්ධ වූ සෙබස්තියන් මුනිතුමාගේ දේවස්ථානයේ දහම් කෙත අස්වැද්දූ ගරු මොන්ටි පෙරේරා පියතුමා වසර දෙකක සේවා කාලයකින් අනතුරුව කටුපොත දේවස්ථානය වෙත ස්ථාන මාරුවීමක් ලැබීමෙන් අනතුරුව පැවති සමුගැනීමේ උත්සවයේදී මල්පිටිය සැදැහැවත් කිතුනු ජනතාව සමුදුන්හ.



ගරු පියතුමාගේ කෙටි සේවා කාලය තුළ මල්පිටිය ශුද්ධවූ සෙබස්තියන් මුනිතුමාගේ දේවස්ථාන ගොඩනැගිල්ල පුළුල් කිරීම සඳහා දියත් කළ ගොඩනැගිලි අරමුදල රුපියල් ලක්ෂ 40 ක් බවට පත් කර ගැනීමට මහත් පරිශ්‍රමයකින් යුතුව මල්පිටිය සැදැහැවත් කිතුනු ජනතාවට නායකත්වය ලබාදීමට ක්‍රියාකළ අතර මරිය හමුදාව ස්ථාපිත කිරීම, කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් වහන්සේගේ මීසම් බැහැදැකීම අර්ථවත් හා ආදර්ශයක් අනුව සිදුකිරීම, මල්පිටිය ශුද්ධ වු සෙබස්තියන් මුනිතුමාගේ දේවස්ථානයේ 125 ජුබිලි මහෝත්සවය හරසරින් සැමරීම ඇතුළු ආගමික හා අධ්‍යාත්මික වැඩ සටහන් රැසක් ජනතාවගේ ක්‍රියාකාරි සහභාගිත්වයෙන් පැවැත්වීමට හැකිවිය.

**බී. කේ. ටී රෙජිනෝල්ඩ්**

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

# රදගුරු පූජක ආකල්ප වල වෙනසකට වනිතා පැවිදි අනුහස් ප්‍රතිභාව ක්‍රියාත්මක විය යුතුයි

අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන් විසින් 2015 වසර පැවිදි වසර ලෙස නම් කිරීම සැබවින්ම මුළු මහත් ලෝකයේම පැවිදිවර උතුමන්ගේ ශාසනික කැපවීම තිව්‍ර කරන්නට මහත් සේ උපකාරී වී ඇති බව සසුන් පුවත් දැන් දැන් නිරන්තරයෙන්ම සිහි කැඳවීම් කරයි. 'ඥානාර්ථ ප්‍රදීපය' අප පුවත් පත පවා මේ වසර පුරා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විවිධ වනිතා හා පුරුෂ පැවිදි නිකායන් හා සංඝයන් පිළිබඳව සවිස්තරාත්මක දෑ සැම සතියකම පාඨක ජනතා අවධානයට ලක් කරන්නට වෙහෙසක් ගන්නේ ඒ නිසාවෙන්මය.

සුදුතුම් පියාණන්ගේ මේ අප්‍රතිහත ඉලක්ක ගත උත්සහය නිසා අද මුළු මහත් ලෝකයේම කිතුනු ඇස වඩාත් හිතකර අයුරින් පැවිදි සංඝ වෙත යොමුවී ඇති බව ප්‍රශංසාත්මක මුවින් බිනිය හැකි තත්ත්වයකට පත්ව තිබේ.

මේ වසර පුරා වතිකානයේ චතුරශ්‍රය වටා රොද බැඳ ගන්නා පැවිදි සංඝවල උතුරා යන ප්‍රීති හඬ අවට සිසාරා නිංනාද දෙන තත්ත්වයට පත්ව තිබෙන්නේ ඔවුන්ගේ සහා මූලික කැඳවීමට හා වැයවීමට අපමණ අගයක් ලබා දෙන්නට සුදුතුම් පියතුමා ගත් නිර්භීත තීරණය මුල්කොට ගෙනමයි.

වනිතා පැවිදි සංඝවල තිබෙන්නාවූ නෛසර්ගික වනිතා ප්‍රතිභාව ගැන උදම් අනමින් මෑතකදී සුදුතුම් පියාණන් වතිකානයේදී කළ දෙසුම්, ප්‍රශ්න උත්තර ලබා දෙමින් කළ හමුවීම් සියල්ල මධ්‍යයේ වනිතා හා පුරුෂ පැවිදි සංඝ තුළ තිබෙන ක්‍රියාකාරිත්වය, අනුහස් ප්‍රතිභාව හා විබුද්ධික පැවැත්ම නැවතත් ඉහළ අගයක් ගනු ලබමින් පවතී. ආලේප කළ තැනැත්තන්ගේ හා තැනැත්තියන්ගේ ජීවිත ආභාෂයේ ඇති කැපවීම් අත්දැකීම් මෙන්ම මරිය මවුන් තුළ ගැබ්ව ඇති මාතෘක හා පිතෘක ප්‍රේම පාරමිතා ලක්‍ෂණ කැටි කරගත් ඒ කැපවුණු ජීවිත සුවිශේෂී ලක්‍ෂණ අද සභා මාතාවට අත්‍යවශ්‍ය බව පුන පුනා පවසන සුදුතුම් පියතුමන්ගේ බස් සැහැල්ලුවෙන් නම් ඉවතලිය හැකි නොවන බව පෙනේ. ඒ ගැඹුර තුළ මීසම් මට්ටමින් හා පදවි මට්ටමින් යම් උද්දීපන ප්‍රවනතාවක් නම් අප දේශයෙත් පදවි හරහා ඇති විය යුතුමයි.

වනිතා නෛසර්ගික අනුහස් ප්‍රතිභාව සභා මාතාවට අත්‍යවශ්‍යයි. ලබාගත් විවිධාංගිකරණ තලෙන්තු කරිස්මාවන් තුළ විවිධත්වයෙන් ඒකත්වයක් කරා සභා මාතාව ගෙන යා හැක්කේ පැවිදි පංතීන් වලට යයි සුදුතුම් පියතුමා පවසන්නේ ඒ නිසාවෙනි. සංවෘත පැවිදි නිකායන් හා විවෘත පැවිදි නිකායන් තුළ යාච්ඤාවේ අනුහස් ආකර්ෂණීය ආධ්‍යාත්මික පැවැත්ම ගැන අගයාලීමක් මීසම් මට්ටම තුළ ඉටුකළ යුතු බවට හඬක්ද දැන් පැන නැගෙමින් පවතී.

සභාව මාතෘක ප්‍රේමයේ සංකේතයක් බව පවසයි. ඒ මාතෘක ප්‍රේමය තුළ සභාව ගොඩ නැගෙන්නේ නම් සහකාර සහකාරියන් පිළිබඳව ඇති ආකල්පයන්ද පැවිදි නිකායන් හරහා හඹා යා යුතුයි. මේ මතය ඉස්මතු කරන්නේ සුදුතුම් පියාණන්මයි. මෘදු බව, ලෙන්ගතු බව, ආත්මීය බව, සෙනෙහෙවන්ත බව, ප්‍රේමාන්විත බව පැවිදි නිකායන් තුළ වර්ධනය වන්නාක් මෙන් වනිතා පැවිදි වරියන් තුළින් මතු කරවන ඒ හැඟුම් බර චෛතසික පරිකල්පනය සැබෑ අරුතින්ම ගිහි ජනතා සංවේදි බවට හා ඇල්මට මුසු විය යුතුමයි. මෙහිදි තරගයක් නොතිබිය යුතුයි.

අභාග්‍යයකට අද බොහෝ තැන්වල රදගුරු හිමිපාණන් සමග ඇති ඝට්ටන නිසා පැවිදි සංඝයන් කොන් වී යන දුර්වල වී ඇති ආකාරයක් දැකිය හැකියි. ඒ නිසාම විවිධ ආරාම හා පැවිදි නිවාස වැසෙන තත්ත්වයක් ද විවිධ පදවි වල දැකිය හැකියි. අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන් මෙය හෙළා දැක ඇති අතර 'අන්‍යෝන්‍ය සබඳතා' යන 1978 රදගුරු කතිකාවේ එළි දැක්වූ අනුශාසනා පත්‍රය ගැන නැවතත් අවධානය යොමුකළ යුතු බවට රදගුරු හිමිපාණන් වෙත නියෝග යක්ද නිකුත් කර තිබේ. මීසම් වල පූජක සංඝය අනිවාර්යයෙන් පැවිදි සහය ලබාගත යුතු බවට අවධාරණය කරන සුදුතුම් පියාණන් එය නිසි අයුරින් පදවියක ඉටු නොවන්නේ නම් එය අදාළ රදගුරු හිමිපාණන්ගේ දුබලතාවයක් බවද අවධාරණය කරයි.

වනිතා පැවිදි සංඝ කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන සසුනිසුරාණන් ලිංග භේදය තුළ සභා ක්‍රියාකාරිත්වයේ අධි තක්සේරු - අවතක්සේරු නොතිබිය යුතු බවට අවධාරණය කරන අතර වනිතා පැවිදි නිකායන් තුළ ආධ්‍යාත්මික පියවරුන් නොව මෑණිවරුන්ම සිටිය යුතු බවද පැහැදිලිවම පවසයි. එය අභියෝගයකි. පූජක සැමටද අභියෝගයකි. පැවිදි සංඝයනටද අභියෝගයකි. නමුත් එය ජයගත හැකි බව සුදුතුම් පියාණන් පවසන්නේ දැඩි විශ්වාසයෙනි.

අවශ්‍ය රදගුරු, පූජක ආකල්ප වල වෙනසක් පමණි.

# කොන්ස්තන්තිනෝපලයට! බෙත්ලෙහෙමට සිදුවූදේ!!

# මඩු පුදබිමටත් සිදුවේද?

මන්නාරම ප්‍රදේශයට අයත් පුල්ලිකුලම්හි පිහිටි කිතුනු දේවස්ථානය ප්‍රදේශයේ ජනතාවගේ ඉඩම් කඩම්ද හමුදාව අත්පත් කරගෙන එහි ජනතාව කැලෑ ප්‍රදේශවල තාවකාලික ආවරණ යට ජීවත්වන තොරතුරු හා එම ප්‍රදේශයේම අලුතින් ගොඩනැගුණු විශාල නිවාස ව්‍යාපෘතියක් හා ඊට සම්බන්ධව ගොඩනැගුන මුස්ලිම් දේවස්ථාන තුනක් පිළිබඳ තොරතුරුත් ගෙවුනු සමයේ අප ඇසුවේ දුටුවේ 'රයිට්න්' නම් ආයතනය ප්‍රකාශයට පත් කරන 'සමබිම' මාසික සඟරාවක් තුළිනි. එතෙක් එම තොරතුරු දේශීය වෙනත් ජනමාධ්‍යයකින් නිරාවරණය වූවාදැයි නොදනිමි.

එම සමයේම දේශයේ පෞද්ගලික දෘශ්‍යමාධ්‍යයක් තුළින් අප දුටුවේ මන්නාරම ආශ්‍රිත 'විල්පත්තු භූමිය' අයත් ප්‍රදේශවල වනය විනාශ කරමින් මුස්ලිම් ජාතිකයනට භූමිය බෙදාදෙන දර්ශනය. ඒ මහින්ද පාලන සමයයි. එම වනවිනාශය කළේ එම රජයේ සිටි මුස්ලිම් ඇමතිවරයකු විසින් බව පැහැදිලි කරුණක් වූ පසුබිමේ හෙළඋරුමය සංවිධානය විසින් එහි ගොස් ඊට විරෝධය පානුද එම ජන මාධ්‍යය තුළින්ම අපි දුටුවෙමු.

මහින්ද පාලනය පරාජය වී 'මෛත්‍රී යුගයත්' දූෂණයට එරෙහි වූ ජනතාව විසින් සිය ජීවිත අවදානමද නොතකා කැපවීම් කර ගොඩනැගූ පසුත් පෞද්ගලික ජන මාධ්‍යයක් තුළින් දුටුවේ යුද්ධයෙන් අවතැන්වූ මුස්ලිම්වරුන් නැවත පදිංචි කිරීමේ මුවාවෙන් 'විල්පත්තු අභයභූමිය' සීමාවේ සීමා මායිම් නොතකමින් මහා වන විනාශයක් කරමින් අලි මිනිස් ගැටුමකටද මඟ පාදමින් ගහකොල කපා නිවාස සාදාගැනීමට මුදල්ද පරිත්‍යාග කර මුස්ලිම් ජනපද ගොඩනගන්නට බලය යොදන පෙරකී රජයේ සිටි ඇමතිවරයාමය. ඒ වත්මන් රජයට රිංගා ඇමතිකම් ලබාගෙන තම බලය අයුතු ලෙස යොදා ගනිමින්මය.




එයින් පසු එම පෞද්ගලික ජනමාධ්‍යයට පින් සිදුවන්නට දිගින් දිගටම දුටුවේ එම පුද්ගලයාම ප්‍රදේශයේ නීතිය අතට ගෙන ක්‍රියාකරන ආකාරයක්මය. එනම් මන්නාරම් මඩු රක්ෂිත කැලෑව විනාශ කරමින් ඈව ජාවාරම සමඟ 'මඩු රක්ෂිතය' තුළත් මුස්ලිම් ජනාවාස පිහිටුවන ආකාරයකි!

ඇත්තෙන්ම නිදහසින් පසු මේ දේශය විනාශ කළේත් ජාති හා ජනතාව නොව දේශපාලකයෝමය.

"වර්ගවාදි ගැටුම් වලින් මේ දේශයම හෙම්බත් වෙලා." දැන් ඇති යයි බොහෝ දෙනාගේ

**යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්ටනි එඩේරමුල්ල**

පැතුමය. එහෙත් ඉදිරියටත් යළි එවැන්නක් ඇති වුවොත් නොවන්නේය. එය දෙමළ හා සිංහලුන් අතරද, දෙමළ හා මුසල්මානුවන් අතර දැයි කිව නොහැකිය.

මඩු කියූ පමණින් අතීතයේ සිට කිතුනු අපගේ සිත් තුළ මැවුනේ ශාන්ත දසුනකි. ඒ සුන්දර නිසල වියලි වන වියනයි. අතීත කිතුනුවෝ මඩු වන්දනා ගියෝ මඩු මෑණියන් නැමැද සාන්ත පරිසරයක ගිලී සිත කය පව්කාරයන් ගිනිලෑ යුද්ධයෙන් පසු අප දුටුවේ පෙර දුටු සිත, කය, නිවූ දසුන් අතුරුදන් වී ඇති සෙයකි. අතර මඟදීම දකින්නට ලැබුනේ වන සතුන් ගැවසුන සුන්දර වනය වෙනුවට කාෂ්ඨක මුඩු බිම්ය. දේශයේ බලය වැපිරූවන් ඒවා කොටු කරගෙනද තිබිනි. ඒ යුද්ධය මුවාවෙන් කළ වනස්පති දූෂණයයි. කොල්ලයයි.

ජීවිත පරදුවට තබා සාමකාමි අහිංසක ජනතාව ගොඩගත් යහපාලනයේද එල්ලුන ඒ පාලනයේ සිටිවුන් මේ කරන්නේද එවැනිම කාරියක්මය. වෙනස එදා තිබූ සිංහල ජාතිවාදය වෙනුවට ඉස්ලාම් ජාතිවාදය ඉස්මතුවී තිබීමත්, එය මඩු වනාන්තරය දක්වා පැතිරී යන සේයාවත්ය.

අප දන්නා තරමින් මඩු ප්‍රදේශයේ මුස්ලිම්වරුන් සිටින්නට ඇත. එහෙත් බහුතරය ද්‍රවිඩයන් මෙන්ම කිතුනුවන් වන්නට ඇත. මුස්ලිම්වරුන් යුද්ධයේදී ගම්බිම් හැර ගියත් දැන් සිදුවන්නේ යළි පදිංචි කිරීම් වස් යෝනක ජනපදකරනයක්ම විය යුතුය. ඒවාට විදේශිය ඉස්ලාම් මුදල් නොඇදෙනවා යයි කිව හැක්කේ කාටද?

තවත් සුළු කලකින් ඔවුන් මඩු පුද බිමත් ආක්‍රමණය කරතොත් පුදුම විය යුතු නැත!! මන්ද විනිසුරුවන්ටද රදගුරුවරුන්ටද අභියෝග කළ යෝනක දේශපාලකයෙක් මේ ප්‍රදේශයේ එදත් අදත් බලවත් වී සිටිති. විදේශවලට ඇතුල්වූ වන් 'ISIS' නාමයෙන් මිනිමරන හැටි ලෝකයටම ප්‍රශ්නයක් වේ යයි පෙරකල කිසිවෙක් සිතන්නට නැත.?

මේවා විද්‍යුත් මාධ්‍යයන් තුළින් දකින සාමකාමි ජනතාව ප්‍රශ්න කරන්නේ මේවා සොයන්නට කිසිවෙක් නැතිද කියාය. එසේම ආගමික නායකයන් මෙන්ම ආගමික ඇමතිවරුද සිටින්නේ පීත්ත පටි කැපීමට පමණක්දැයි ඔවුහු කුතුහලයෙන් විමසති. ජනතාවගේ කුතුහලය පහකිරීම වගකිව යුත්තන්ගේ යුතුකමකි.



ඥානාර්ථ ප්‍රදීපය

අපේ මීසමේ වගතුග

මීසමෙන් මීසමට

ක්‍රිස්තු වර්ෂ 2015
මැයි 24 ඉරිදා

# මහ ගල්ගමුවේ ජුසේවාස් පුරයේ
# සා. ජුසේවාස් මුනි ජාතික සිද්ධස්ථානයක්!

## කතෝලික රදගුරු සමුළු අනුමතිය ලද බව රදගුරු හිමි පවසයි

**මහ ගල්ගමුව ජුසේවාස් පුරයේ සාන්ත ජුසේ වාස් මුනිඳුන් නමට කැපකළ නව ජාතික සිද්ධස්ථානයක් ගොඩනැගීමට පසුගියදා පැවැති ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේදී පූර්ණ අනුමතිය ලැබිණැයි ඇතුගල්පුර රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ ප්‍රකාශ කළහ.**

කුරුණෑගල කතෝලික මධ්‍යස්ථානයේ පැවැති පදවි දූත සේවා ලේකම්වරුන්ගේ රැස්වීමේදී රදගුරු හිමි එසේ පැවසීය.

තවදුරටත් කතා කළ රදගුරු හිමි මෙසේද පැවසීය.

කුරුණෑගල රදගුරු පදවිය තුළ නව පූජක මාරුවීම් සමග කිතුනු දූත සේවා මංඩල ව්‍යවස්ථාව සංශෝධනය කර කිතුනු ඒකක තුළින් ක්‍රියාකාරි කමිටු සක්‍රිය කර සහභාගිශිලි සභාවක් කරා ගෙන යාමට පදවි ගිහි ජනතාවගේ සහාය සහභාගිත්වය අවශ්‍ය බවත්, අ.පො.ස (සා. පෙ) අසමත් වන සිසුන් සඳහා මල්කඩුවාවේ අභිනවයෙන් පිහිටුවා ඇති ශා. පේදුරු අධ්‍යාපන ආයතනය මගින් විෂයයන් හැදෑරීමට දක්ෂ ගුරු මංඩලයක් පත් කර ඇති බවත්, එමගින් අප දරුවන්ට ටියුෂන් පංති කරා යෑමට අවශ්‍ය නොවන බවත් උන්වහන්සේ පෙන්වා දුන්හ.

මේ අවස්ථාවට පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස්, පදවි අපෝස්තලික සේවා සම්බන්ධිකාරක ගරු ලයනල් ප්‍රනාන්දු, පදවි කුඩා කිතුනු සංඝ සම්බන්ධිකාරක ගරු ජාමික පෙරේරා පියතුමන්ද සහභාගි විය.

**නිමල් ඒ. අල්මේදා**

## කම්කරු ශ්‍රමය අඩුවෙන් තක්සේරු කළ නොහැකියි



රටක සංවර්ධන කාර්යයෙහි ලා කම්කරු දායකත්වය අඩුවෙන් තක්සේරු කළ නොහැකිය. වී වපුරා අස්වනු නෙලන තෙක් දහසකුත් එකක් අභියෝගවලට මුහුණ දීමට ගොවියාට සිදුවේ. පුරාණයේ සිට අස්වනු හා දෙවියන් වහන්සේ අතර විශාල සම්බන්ධයක් තිබුනි. ගොවියා දෙවියන්ට පූජා කළේ හොඳම අස්වැන්නයැයිද යක්කඩුව ග්‍රාමයේ අති බහුතර බොදුනු ජනතාවද මේ දේව මෙහෙය විශාල කුඹුරු යායක් මැද සුන්දර ගොවිබිමක පැවැත්වීමට සැලසුම් කළේ එකී ගොවි කම්කරු ජනතාවගේ ශ්‍රමයට වටිනාකමක් එක්කරමින්, ඔවුන්ගේ ඉදිරි වගා කටයුතු සාර්ථක කරගැනීමට දෙවි පිය ආසිරි ලබාදීමට යැයි බයිබලීය නවෝදය අපෝස්තලික සේවා අධ්‍යක්ෂ යක්කඩුව ශාන්ත හෙලේනා දෙව්මැඳුරේ නේවාසික ගරු ටෙරන්ස් කිත්සිරි පියතුමා පැවසීය.

එතුමා එසේ පැවසුවේ ශුද්ධ වූ ජුසේ මුනි මංගල්‍ය හා ලෝක කම්කරු දිනය මුල්කරගෙන යක්කඩුවවෙල්යායේ පැවති දේව මෙහෙයේ ප්‍රධාන දේශනය පවත්වමිනි. දේව මෙහෙය අවසානයේ ගොවිකම්කරු මහතුන් හා උපකරණ ආසිරි ගැන්වූ අතර ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ ප්‍රතිමාවෙන් ආසිරි ගැන්වීය. බෞද්ධ ගොවි කම්කරු විශාල පිරිසක් මෙයට සහභාගි වූහ.

**ආර්. එල්. හෙක්ටර් ජයතිලක**



**රාගම වැලිසර ළය රෝහලේ දේව දයාවේ දේවස්ථානයේ 6 වැනි වරට පවත්වන වාර්ෂික මංගල්‍ය රෝහල් උපාධ්‍ය ගරු රුවන්ත කුමාර පියතුමාගේ මඟපෙන්වීම යටතේ කතෝලික සංගමය විසින් සංවිධානය කරන ලදි. ගරු ගිහාන් පීරිස් සහෝදර තුමාද දිව්‍ය පූජාවට සහභාගි විය. ගරු නුවන් බුද්ධික පියතුමා මංගල්‍ය දිව්‍ය පූජාව පැවත් වූ අතර දේව දයාවේ ප්‍රතිමාවෙන් ජනතාව ආසිරි ගැන්වූ අයුරු.**

**රේකා දෙනිපිටිය**

## අස්ගිරිය වාර්ෂික මංගල්‍යය ජයයි

මාතලේ මීසමට අයත් මාතලේ බටහිර අස්ගිරිය දේව සුවදායකයාණන් වන ක්‍රිස්තුන් වහන්සේගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය, ගරු සුවේදාසන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් ඉකුත්දා මහා ඉහලින් පැවැත්වුනි.

වතු ජනතාව නියෝජන වන මේ සභාවේ කතෝලික පවුල් 60 ක් පමණ ජීවත්වන බවද ඔවුන්ගේ දැඩි කැපවීම මත මේ සඳහා වාර්ෂිකව දායකත්වයන් සිදුකරන ලදි.

මංගල්‍යය සංවිධානය කටයුතු මාතලේ මිසම් සේවක ගරු ඇන්තනි, මේරියස් පියතුමා ඇතුලු සහයක පියතුමන් විසින් සිදුකරන ලදි.

**ඒ. ආර්. ඇන් මඩසේකර**

**වැලිවිට සණස සමිතියේ 29 වන සංවත්සර උත්සවය පසුගියදා වැලිවිට සාන්ත මරියා විදුහල් ශාලාවේදී පැවැත්විනි. ඒ සඳහා සහභාගි වූ ගරු අර්නස්ට් ද මෙල් පියතුමා හා පැවිදි සොයුරියන් ඇතුළු ආරාධිත පිරිස සභාපති තුමා සමගින්.**

**සුසිල් හැරිසන්**





**දුම්මලදෙණිය ශාන්ත නිකුලා දේවස්ථානයට අයත් කුඩා කිතුනු සංඝ වෙන්නප්පුව ශු. පවුලේ පැවිදි සොහොයුරියන්ගේ 'මෙත් නිවස' මහලු නිවාසයේ මහලු අම්මාවරුන් බැහැදැක ඔවුන් හා මොහොතක් ගත කළ අයුරු.**

**නෙලී ප්‍රනාන්දු**

## වකුගඩුවක් ඕනෑ !



**මහර ජිනසේන මාවතේ පදිංචි අවු. 23 ක් වයසැති නිර්මාල් ලේල්වල පුතුගේ වකුගඩු දෙකම අක්‍රියව ඇති හෙයින් වකුග ඩුවක් බද්ධ කළ යුතු බව කොළඹ මාලිග ාවත්තේ පිහිටි ජාතික වකුගඩු රෝහලේ විශේෂඥ වෛද්‍යවරු නිර්දේශ කරති.**

ඒ සඳහා 'A' පොසිටිව් (A+) හෝ 'O' පොසිටිව් (O+) වර්ගයේ වකුග ඩුවක් දියහැකි කෙනෙකු වෙතොත් දුරකථන අංක 011-2927847 හෝ 071-6861000 ට ඇනුම් දෙන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටියි.

ප්‍රතිකාර සඳහා ඉතා විශාල මුදලක් වැයවන බැවින් ඒ සඳහා පරිත්‍යාගිශිලින්ගේ ආධාර මහර, මහජන බැංකු ශාඛාවේ අංක 21720034308162 දරණ ගිණුම් අංකයට යොමු කරන මෙන් ඉල්ලා සිටියි.

## වකුගඩුවක් ඕනෑ !

කැළණිය මීසමේ ඒ. එල්. ඩී. අයිරින් සිල්වා මහත්මියගේ වකුග ඩු රෝගයට වෛද්‍ය උපදෙස් මත ඉතා ඉක්මනින් 'B' පොසිටිව් හෝ 'O' පොසිටිව් වකුගඩුවක් බද්ධකිරීමට අවශ්‍ය වී තිබේ. ඔබේ කාරුණික අවධානය මේ මව වෙත යොමුවී, මේ සඳහා උපකාර අපේක්ෂා කරයි. 0770810218, 011918802 අංකයට අමතන්න.

## පොතානෙගම ශු. එව්ජින් ද මැසනඩ් මුනිඳුන්ගේ දෙව්මැඳුර

පුත්තලම - අනුරාධපුර ප්‍රධාන මාර්ගයේ අනුරාධපුර නගරයට පිවිසෙන 2 කණුව හන්දියට නුදුරින් පිහිටා ඇති, මෙම දෙව් මැඳුර ඓතිහාසිකව වැදගත් වන්නේ, ශු. එව්ජින් ද මැසනඩ් මුනිඳුන්ට පිදුන, ශ්‍රී ලංකාවේ ප්‍රථම දෙව්මැඳුර වීම නිසාවෙනි. 1974 දී අනුරාධපුර මීසම් සේවක ගරු හෙන්රි ගුණවර්ධන පියතුමා (පසුව අනුරාධපුර රදගුරු) මෙම ඉඩම මිලදී ගෙන, මෙම දෙමහල් දෙව් මැඳුර තැනූ බව ඉතිහාසය සාක්ෂි දරයි.

මේ දෙව් විමන ප්‍රථමයෙන් භාවිතයට ගැනුනේ ළදරු පාසලක් ලෙසයි. අතලොස්සක්වූ කිතුනු ජනතාව වෙනුවෙන්, මුලින්ම දිව්‍ය පූජාව සිදු කළේ, කොරකහවැව හා පොතානෙගම ගම් පියස් වෙනුවෙන් නිවෙස් දෙකකය. පසුව බොදුනු පරිසරයක් තුළ අභියෝග රැසක් මධ්‍යයේ ඉතාමත් අසීරුවෙන් දිව්‍ය පූජාව සිදුකළේ මසකට එක්වරක් පමණි. ඉන්පසුව ගරු වික්ටර් විල්ප්‍රඩ් නි.ම.නි සහෝදර තුමා, මෙහි සේවයට පැමිණ, 1978 වසරේදී අනුරාධපුර රදගුරු පදවි අනුනායක අතිගරු රෙජිනෝල්ඩ් සිල්වා පියතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම දෙව්මැඳුරේ ප්‍රථම මංගල්‍යය පැවැත්වූයේ නොමඳ කැපවීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

17 වසරක් සේවයේ යෙදුන ගරු වික්ටර් විල්ප්‍රඩ් නි.ම.නි සොයුරු තුමා, හිස් පතුලෙන් ඇවිද, දුප්පතුන්, රෝගීන් හා අසරණයින් සොයා ගියේ, ආගම් භේදයකින් තොරවය. ගරු සරත් පෙරේරා ගරු ගිල්බට් පෙරේරා, ගරු එමිල් පෙරේරා, ගරු නෝබට් අන්ද්‍රාදි අද අනුරාධපුර රදගුරු හිමි වැනි පියවරුන් මෙම දෙව්මැඳුරේ කටයුතුවල නියැලෙමින්, දුප්පතුන් හා අසරණයන් වෙත ගියේ මැසනඩ් මුනිඳුන්ගේම ප්‍රතිරූප විලසිනි. මෑත යුගයේ ගරු ඩඩ්ලි සපරමාදු. ගරු ශ්‍රීනාත් පියතුමන් අසරණයින්ට හා රෝගීන්ට පිලිසරණය වෙමින්, පිය දෙවිඳුන්ගේ නැතිවූ බැටලුවන් ඒකරාශි කරමින්, අප මීසම් ජනතාවට දැක්වූ දයාව මැසනඩ් තුමාගේ කැඩපතක් බවට පත්විය. වත්මන් මීසම් සේවක. ගරු ඇන්ටන් ශිවන්තවාස් පියතුමන්ද, ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමන්ද අප දරුවන්ගේ දහම් දැනුම නගාසිටුවීමටත්, දෙව්මැඳුරු සංඝයේ අනාගතය ශක්තිමත් කිරිමටත්, දරණ වෑයම අති විශාලය. තවද ල.ක්‍රි.වි. සමිතිය මගින් අප පියතුමා, නායකත්ව පුහුණු වැඩ සටහන් තුළින්, දරුවාගේ ස්ථානය දරුවාට දීමට උත්සාහ කරයි. එසේම පූජා උදව් සමිතියෙන් කෙරෙන්නේද විශාල වැඩ කොටසකි.




දෙව්මැඳුරේ අවමංගල්‍යාධාර හා සුභ සාධන සමිතියෙන් කෙරෙනා මෙහෙවර මෙතෙකැයි කියා නිමකළ නොහැකිය. තවද මෙම දෙව් මැඳුරේ තරුණ සමිතිය දෙව්මැඳුරු සංඝයේ ක්‍රියාකාරිත්වයට මහා මෙහෙවරක් ඉටු කරයි. වසරේ සෑම බ්‍රහස්පතින්දා දින අප සංඝයේ කොට්ඨාශ තුනෙන්, එක නිවසක් තෝරාගෙන දිව්‍ය පූජාව සිදුකරයි. එදිනට නියමිත දේව වචනය මෙනෙහි කරමින්, තම තමන් ලද අත්දැකීම් බෙදාගනිමින්, පියතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයමින්, අගනා දිව්‍ය පූජාවක් සිදු කරන්නේ ගරු ශිවන්තවාස් පියතුමාගේ ප්‍රධානත්වයෙනි. සෑම අඟහරුවාදා දින සවස ජනවන්දනා කමිටුව රැස්වී, දේව වචනය මෙනෙහි කරමින්, ඉදිරි සතිවල අප සංඝය ක්‍රියාවට නැංවිය යුතු දෑ ගැන සාකච්ඡා කරති. වසර ගණනාවක් පුරා නි.ම.නි පියවරුන් මගින් පිය දෙවිඳුන්. අප සංඝයට දුන් වරප්‍රසාද වලට තුති පිදීම සඳහා මැයි 24 ඉරිදා (අද) 38 වන වරටත් ශු. එව්ජින්ද මැසනඩ් මුනිඳුන්ගේ මංගල්‍යය සමරමු.

**එලිසබෙත් අබේසිංහ**

# "මගේ සභාව නැවත ගොඩනගන්න"

## අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ට ඇසුණේ ද.....?



අද කතෝලික සභාව දරුණු ඛේදවාචකයකට මුහුණ දී ඇත. ඇගේ ශ්‍රේෂ්ඨත්වය සෝදා පාළුවකට ලක් වී ඇති හෙයිනි. සුදු සබේ සුදු බව පිළිබඳ කුකුසක් ද ඇත. බොහෝ කිතුනුවන් මෙන්ම නායකත්වය දරණ බොහෝ දෙනා ද බලය, ධනය, සමඟ මුසු වී කිතුනු මග හැර පියා අන්දමන්දව ඇති සේය.

අට සියවසරකට පෙර අසීසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් තුමන් විසුවේ ද කතෝලික සභාවේ මෙවන් වියවුල් හා අර්බුදකාරී වකවානුවක ය. සාන්ත දමියානු නම් වූ ගරා වැටුනු දේවස්ථානය තුළ වූ ශුද්ධවූ කුරුසිය ඉදිරියේ යැදුමෙහි නියැලී සිටි තරුණ ප්‍රැන්සිස්ට එම කුරුසියෙන් හඬක් ඇසුණි. "මාගේ සභාව නැවත ගොඩනගන්න" ඒ වදන් මුළු හදින් අයිති කරගත් හෙතෙම දැඩි අධිෂ්ඨානය ද දේව භක්තිය ද තරුණ ජවය ද එක් කොට මහත් වූ ජ්වලිත බවකින් යුතුව එම දූත මෙහෙවර කෙරෙහි සිය දිවි කැප කළේ ය. එතුමන්ට පින් සිදුවන්නට දහතුන්වන සියවසේ දී කතෝලික සභාව තුළ පරිවර්තනයක් ඇති විය. ඇය නිසි මගකට එළඹුනාය.

නව සුදුතුම් පියාණන් ප්‍රැන්සිස් යන නාමය වැළඳ ගත්තේ ඇයි? එය අහඹු සිදුවීමක් විය නොහැකිය. එතුමන් තෝරා ගත්තේ නමක් පමණක් ද? අර්බුදකාරී තත්ත්වයක පවතින සභාවක නායකත්වය බාර ගන්නා විට අවුරුදු අටසියයකට පෙර කුරුසියෙන් නිකුත් වූ දේව ආඥාව එතුමන්ගේ සවන් වැකුණි ද? එහි දෝංකාරය හදට වැදුනි ද?

"මගේ සභාව නැවත ගොඩනගන්න" සුදුතුම් පියාණන් සිය මෙහෙවර ඇරඹූ මොහොතේ සිටම සිය ප්‍රකාශයන් මෙන්ම ක්‍රියාවන් තුළින් ද ලොව මවිත කොට ඇත. බලය, ධනය, මාන්නය පිනුම් ගසන අද ලොව තුළ, එතුමා ගෙවන්නේ මේ ත්‍රිවිධ බලවේගයන්ට පරස්පර වූ සරල දිවි පෙවෙතකි. එතුමන්ගේ ජීවිත රටාව කිතුනුවන්ට පමණක් නොව මුළු මහත් ලෝ වැසියන්ටම අභියෝගයකි. කිතුනු පූජක, පැවිදි, ගිහි අප සැමගේ සිත් ඒ අභියෝගය තුළින් කැළඹීමකට පත් විය යුත්තේ නොවේ ද? ශුද්ධෝත්තම පියාණන්ගේ මූලික අපේක්ෂාව වී ඇත්තේ ශුද්ධවූ සභාව "දිළිඳුන්ගේ සභාවක්" වශයෙන් නැවත ගොඩ නැගීමය.

කතෝලික සභාව දිළිඳුන්ගේ සභාවක් වන්නේ සභාවේ මූලික අවධානය දිළිඳුන් වෙත යොමු වූ දිනක බවය. සුදුතුම් පියාණන් පවසනුයේ එදිනටය සභාව ක්‍රිස්තුස් වහන්සේගේ සභාව වනුයේ. විශේෂයෙන් අද පවතින ආර්ථික අර්බුදය හමුවේ කිතුනුවන් වශයෙන් අප දිළිඳුන් හා මුහුවන ඔවුන්ගේ ජීවිත අරගලය තුළ එක්ව සිටින සබැඳියාවක් පවත්වා ගන්නේ කෙසේද? රජයේ ආර්ථික ප්‍රතිපත්ති දිළින්දන් ප්‍රපාතයට ඇද දමන විට අපගේ ප්‍රතිචාරය කුමක් ද? අප ඔවුන් හා බෙදා ගන්නේ මොනවාද? නැති බවේ අරුමය අපට ද දැනෙන ලෙස දිළින්දන්ගේ අගහිඟ සපුරන්නට පරිත්‍යාගී වන්නට අපට හැකි ද? ලූක් තුමාගේ සුවිශේෂයේ 21:1-24 තුළ ජේසුස් වහන්සේ තමා සතු සියල්ල පරිත්‍යාග කළ වැන්දඹු කාන්තාවගේ පරිත්‍යාගී බව... බෙහෙවින් පැසසුමට ලක් කරන සේක. අප දිවි දෙස බලා ජේසු සමිඳුන් එලෙස අගයන්නට යමක් ඇද්ද? අසීසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් මුනිඳුන් ද එලෙස තමන් සතු සියල්ල අත්හළේ ය. ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ ශ්‍රාවකයන් වනු සඳහා එලෙස අප සතු දේ අත්හරින්න අප කොපමණ සූදානම් දැයි සිතා බලමු. යමක් ඇති අය තමන් සතු අතිරික්තයන් පරිත්‍යාග කිරීමට සූදානම් නම් සිය මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට දිළින්දන්ට හැකිවනු ඇත. ශ්‍රී ලංකාව තුළ පවතින වර්තමාන තත්ත්වයේ වෙනසක් ඇති කිරීමට අප සූදානම් ද? අවමයෙන් පාරිභෝජනය කිරීමට යොමු වන්නට ආරාධනයකි මේ. මහත්මා ගාන්ධිතුමන් පවසන ලෙසට "සියල්ලන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමට මෙලොවෙහි ඇති සම්පත් ප්‍රමාණවත් වුවද සෑම අයකුගේ ගිජුබව පිරවීමට ඒවා නොසෑහේ."

කිතුනු සභාව නැවත ගොඩනැගීමේ මෙහෙවර දියත්කොට පවත්වාගෙන යාමට නවමු බලවේග යක් ස්ථාපිත කිරීමට අසීසියේ ප්‍රැන්සිස් මුනිඳුන්ට හැකි වුයේ එතුමන් දෙවිඳුන් සමඟ පවත්වාගෙන ගිය ගැඹුරු සම්බන්ධතාවය යි. ස්වභාව දහම සහ මනුෂ්‍යයන් සමඟ පවතින ගැඹුරු සම්බන්ධතාවයක් තුළින් විශ්වීය සාංඝික බවක් තුළ ජීවත් වීමට දෙවියන් වහන්සේ එතුමන් මෙහෙය වූයේ දෙවිඳුන් සමඟ තිබූ ඒ ගැඹුරු සබැඳියාව තුළින් ය. ස්වභාව දහමට හා මනුෂ්‍යයන් අතර ද මැවිල්ල සහ දෙවිඳුන් අතර ද සබැඳියාවේ දැඩි වියවුලක් පවතින මෙවන් සමයක අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් දෙවිඳුන් සමඟ ද අප එකිනෙකා අතර ද ස්වභාව දහම සමඟද නිවැරදි සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට අපව මෙහෙයවයි. බලයට, ධනයට, තනතුරට ගිජු වී මිනිස් සමාජය මෙලෙස සබැඳියාවන් අහිමි කරගෙන ඇත. කාර්යබහුලත්වය දෙවිඳු ඇසුරට මං අසුරන්නේ ය. නිහඬ නිසල වීමට මනසට ඉඩක් නැති සේය. දේව සම්මුඛයෙහි බිඳක් රැඳෙන්නට ගුණාත්මක හෝරාවක දෙවිඳුන් සමඟ ගත කිරීමට ඇති අවශ්‍යතාවය අවබෝධ කරගන්නේ අල්පයකි. එවන් භාවනාත්මක දිවි පෙවෙතක් තුළින් පමණි වත්මන් අර්බුදකාරී තත්ත්වයට පිළිතුරක් සෙවිය හැකි වන්නේ. පැරණි චින්තන රාමු සහ මති මතාන්තර ඉවතලා අවදි වීමට අභියෝග යක් අප හමුවේ ඇත. කාර්යබහුල බවට හුරු වූ අප ජීවිත පැවැත්ම විකල්ප මඟකට මෙහෙයවමින් දේව සම්මුඛයෙහි අවදිව නිසලව දිවි ගෙවන්නට සිත් පහදා ගනිමු. අප ස්වභාවය තුළ ද අප වටා ද නිරන්තරයෙන්ම වන දේව වැඩ සිටීමට අවදි වෙමු. එවන් භාවනාත්මක දිවි පෙවෙතක් තුළ අන් අයට සංවේදී වීමේ හැකියාව අප තුළ ඇති වේ. අප අවට ස්වභාව දහම තුළ සිදුවන දේ වැද සංවේ දී වීමට පොළඹවන්නේ ය. සුදුතුම් පියාණන් අපට නව මගක් පෙන්වයි.

නොඅනුමානවම සභාව නැවත ගොඩනැගීමේ කාලීන මෙහෙවරට කිතු සමිඳාණෝ අපවද කැඳවන සේක. එයට ශුද්ධවූ ප්‍රැන්සිස් තුමා අපට කියා දුන් "සාම යැදුම" සිත්හි අවධාරණය කර ගනිමු. "සාම යැදුම" ශුද්ධවූ ප්‍රැන්සිස් තුමා සමඟ ජීවත් වූ සොහොයුරන් අත් දුටු එතුමන්ගේ දිවිය යැදුමක් ලෙස පෙළගැස්වීමකි.

**ගරු නිලංගනී මුදලිගේ පැවිදි සොයුරිය**
මරියතුමියගේ ප්‍රැන්සිස්කාන ධර්මදූතික නිකාය

දේව වචනයෙන් හික්මීම්

ධර්ම සංග්‍රහය

ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

# දෙවියන් වහන්සේ සහ දූෂිත පාලකයන්

**පසුගිය සතියෙන්**

මේ සෑම තත්ත්වයකටම විසඳුමක් සකස් කර ගැනීමට පදනමක් ඇත. එනම් තමා විසින් කර ඇති සියලුම පාපකාරී ක්‍රියාවන් ගැන අවංකව, ගැඹුරින් සහ සම්පූර්ණයෙන්ම මනස්ථාපනය වීමයි. තම ජීවිතය පරිවර්තනය කර ගැනීමයි. සම්පූර්ණ ජීවිත පෙරළියක් සඳහා පදනම දමා ගැනීමයි. එසේ නොවේ නම් ඔවුන්ට අයත් වන ඉතා දරුණු ඉරණම ගැන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මෙසේ වදාරන සේක.

"සර්පයෙනි, පොළොං වංශයෙනි, ඔබ නිරයේ දඬුවමින් ගැළවෙන්නේ කෙසේ ද?" (මතෙව් 23:33)..."කෛරාටිකයන් වූ ඔබට වන විපතක මහත! මන්ද, ඔබ හුණු ගා සුදු කළ සොහොන් වලට සමානය. ඒවා පිටතින් ශෝභනව පෙනෙතත් ඇතුළත මළවුන්ගේ ඇටකටු වලින් ද සියලු ආකාර කැළි කසළින් ද පිරී තිබේ. එලෙසම ඔබත් මිනිසුන් අබිමුවෙහි පෙනුමට පිටතින් සිල්වත්ය. එහෙත් ඇතුළතින් කුහකකමින් හා දාමරිකකමින් පිරී සිටින්නහුය" (මතෙව් 23:27-28). දූෂිත, දුෂ්ට, බලලෝභී, හිංසාකාරී, පීඩාකාරී, පාපකාරී, ආත්මාර්ථකාමී, බඩජාරී, කුහක සහ දාමරික පාලකයන් පිළිබඳ අවසාන විනිශ්චය පවතින්නේ ශ්‍රේෂ්ඨාධිකරණය සමඟ නොව, සකල මානව සංහතියේ ම ගැලවුම්කරුවාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමඟය. "එවිට උන්වහන්සේ වම් පසෙහි සිටින්නන්ට කතා කොට, 'සාප ලද්දෙනි, මා වෙතින් ඉවත් වී යක්ෂයාට ද, ඔහුගේ දූතයන්ට ද සූදානම් කර තිබෙන සදාතන ගින්නට යන්න'. (මතෙව් 25:41).

දෙවියන් වහන්සේගේ විනිශ්චය අවතක්සේරු කිරීම හෝ සැහැල්ලුවට ලක් කිරීම අතිශයින්ම බරපතල පාපයකි. "මන්ද, අපගේ දෙවියන් වහන්සේ වනාහි සියල්ල දවාලන ගින්නකි" (හෙබ්‍රෙව් 12:29). "ජීවමාන දෙවියන් වහන්සේගේ අත් වලට අසු වීම භයංකර දෙයකි" (හෙබ්‍රෙව් 10:31). "උන්වහන්සේ සියලු අධිපතිකම් ද බලය ද පරාක්‍රමය ද අභිබවා උන්වහන්සේගේ රාජ්‍යය දෙව් පියාණන් වහන්සේට භාරදෙන සේක. මන්ද, දෙවියන් වහන්සේ සියලු සතුරන් උන්වහන්සේගේ පාද යට දමන තුරු ක්‍රිස්තුන් වහන්සේ රජකම් කළ යුතුමය" (1 කොරින්ති 15:24-25).

✍ **මහාචාර්ය ඇන්ටන් මීමන**

# මිනිසා මැව්වේ දේව ස්වරූපයටයි

**දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක. දෙවියන් වහන්සේගේම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක." (උත්. 1:27)**



මනුෂ්‍යයා මැවුම්කරුවාණන්ගේ ස්වරූපයයි. ඔවුන් වහන්සේ විසින් මනුෂ්‍යයාගේ සංරක්ෂණය සහ ප්‍රවර්ධනය මනුෂ්‍යයාටම භාර දී ඇත. එය නීති මතින් හා වගකිව යුතු ලෙසින් සෑම මනුෂ්‍යයකුම ණයෙන් බැඳී සිටී. ඒ අනුව දේව ස්වරූපය මෙලොව ප්‍රකාශ කිරීම මනුෂ්‍යයන් ලෙස අපගේ ප්‍රධාන කාර්ය විය යුතුය. පවුල තුළ මව පියා දරුවන් ශු. ත්‍රිත්වයේ කැඩපත වීම එතුමන්ගේ කැමැත්තයි.

එහෙත් වත්මන් තත්ත්වය එම උතුම් භාවයට අනුරූප නොවන බවක් දිස්වේ. ශු. පාවුළු තුමා පවසන පරිදි අපි භෞමික ස්වරූපයක් දරන්නා සේම දෙවියන් වහන්සේගේ ස්වරූපය ද දරන්නෝ වෙමු. එසේ වුවද භෞමික ස්වරූපය දරන මිනිසා තවත් මිනිසකු හා ඇතිවන ගැටුමක දී ක්‍රියාකරන අයුරු අපි දකිමු. තම පවුල් තුළත් නෑදෑ හිතවතුන් අතර හා ඉන් පිටත සමාජයේත් විවිධ අවස්ථා තුළ දී තමන් ප්‍රතික්ෂේප කළ, දියුණුවට බාධා පැමිණෙවූ, හොඳ නම කෙලෙසූ ද්වේෂ කළ අයට සමාව දීගත නොහැකිව පෙරළා වෛර කිරීමට පෙළඹෙන, ජීවිත පවා විනාශ කිරීමට පෙළඹෙන අවස්ථා විරල නොවේ.

එහෙත් ජේසු සමිඳුන්ගේ කාර්යය වූයේ මුළු මැවිල්ලම පූර්ණත්වය කරා ගෙන යාමයි. ඒ ප්‍රේමය - දයාව - කරුණාව තුළිනි. කිතුනු දයාව, කරුණාව යන ගුණ ධර්මයන් ක්‍රියාත්මක කිරීමේදී එයට දක්වන්නා වූ ප්‍රථමතාවය විශේෂ ස්වරූපයක් ගනී. එය දේව ස්වරූපයයි. මනුෂ්‍යයා ගත් කල වර්ග කිරීමකින් තොරව මූලික සමතාවයෙන් යුතු කෙනෙකි. ඔහු ක්‍රිස්තුන් වහන්සේගේ රුධිරයෙන් ගලවනු ලැබුවෙකි. ශුද්ධාත්මයාණන්ගේ ස්ථිර ක්‍රියාකාරිත්වය යටතේ තබනු ලැබුවෙකි. ඒ නිසාම ඔහු පියාණන්ගේ සජීවී ස්වරූපය බවට පැමිණේ. එබැවින් තම අසල්වැසියා සතුරකු වුවද කම් නැත. ඔහුට ප්‍රේම කළ යුතුය. ඒ දේව ස්වරූපය නිසාය.

එදා කුරුස ගසේ එල්ලී වද වේදනා විඳිද්දී තමන්ට සතුරුකම් කළ ජුදයින්ට සමාව දීමට තරම් ඒ දේව ස්වරූපය ඉස්මතු විය. "ඔබට වෛර කරන්නන්ට යහපත කරන්න..." (ලූක් 6:27-38)

එසේම තමන්ට සතුරුකම් කළ සාවුල් මරා දැමීමට අවස්ථා දෙකක්ම උදා වූ නමුත් අවස්ථාවාදියෙක් නොවීම තුළින් දාවිත්ගේ උදාර චරිත ලක්ෂණයක් හෙලි වෙයි. සාවුල්ගේ මරණයේ දී දාවිත් සිය සැබෑ හැඟීම් ගීතයකට පරිවර්තනය කර ඇත්තේ දේව ස්වරූපය ඉස්මතු වූ බැවිනි. (2 සාමුවෙල් 1:24)

දිව්‍ය සත්ප්‍රසාදය තුළ පෝෂණය වී එහි බලය අත්දුටු ස්ටීවන් තුමා තමන්ව ගල් ගසා මරණයට පත් කරන විටත් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි. මිනීමරුවන්ට සමාව අයැදීමට තරම් බලයක් ඔහු අයිතිකරගෙන තිබුනේ දේව ස්වරූපයේ බලයෙනි.

ක්‍රිස්තුන් වහන්සේ තුළින් තෝරා ගත් ජනතාවක් වශයෙන් කිතුනු අපව කැඳවා ඇත්තේ ද දෙවියන් වහන්සේගේ ස්වරූපය ප්‍රකාශ කිරීමට ය. ඒ සඳහා ඇති එකම ජීවිත ක්‍රමය වන්නේ විශ්වාසයේ බලාපොරොත්තුවේ ප්‍රේමයේ ජීවිතයක් ගත කිරීමය.

**කුලියාපිටියේ රීටා සේනානායක**

දෙවියන් හා බැතිබර සංවාද

ජන වන්දනාව

ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

# ශුද්ධාත්මාගමන මංගලෝත්සවය

උත්ථාන සමයේ අටවන ඉරුදින - 2015. 05. 24



ශු. සභා මාතාව උපන් මංගල්‍යය සමරන අද දින අපෝස්තුළුවරු මත ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනයේ ගාම්භීර මංගලෝත්සවය සමරන්නෙමු. මරණින් උත්ථාන වූ අප ස්වාමින් වහන්සේ ගෝලයන්ගෙන් වෙන් වී ගිය පසු සේනාකුළු ශාලාවේ දොරගුළු ලා ගෙන සිටි මෙම දුර්වල නූගත් ගෝලයන් ශුද්ධාත්ම බලය ලැබී අභීතව, චතුර ලෙසින් උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ගැන දේශනා කිරීමට පටන් ගත්තේ අද වාගේ දවසකය. ගෝලයන් තුළ සැබවින්ම මෙවැනි වූ පිබිදීමක් ඇති වූයේ කෙසේ ද? ශුද්ධාත්මයාණන් යනු කවරෙක් ද?

අද දින ශු. සුවිශේෂ ප්‍රකාශය තුළ ශු. ජුවාම් තුමා ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයෙන් පසු ගෝලයන්ට නැවත දර්ශනය වීමේ සිද්ධියක් ගෙනහැර දක්වයි. එහිදී උන්වහන්සේ ගෝලයන් පිට හුස්ම හෙළා "ශුද්ධාත්මයාණන් පිළිග න්න" යැයි පවසයි. (ජුවාම් 20:22) සැබවින්ම ක්‍රිස්තුන් වහන්සේ මරණින් උත්ථාන වූයේ සැබෑ ජීවමාන මනුෂ්‍යයකු ලෙසයි. අපගේ ජීවිත රැඳී තිබෙන්නේ මූලිකවම හුස්ම තුළ බව අපි හොඳාකාරවම දනිමු. මැරුණු පුද්ගලයෙක් ජීවමාන කෙනෙකුගෙන් වෙන් කර හඳුනා ගන්නේ ඔහු හෝ ඇය තුළ හුස්ම ඇති නැති බව තුළය.

සැබවින්ම ශුද්ධාත්මයාණෝ හෙවත් සුසුමාණෝ යනු දෙවියන් වහන්සේගේ හුස්මයි. උන්වහන්සේගේ ස්ප්‍රිතුවයි. එම ශුද්ධවූ ස්ප්‍රිතුව තුළ අපගේ ඇල්මැරුණු කිතුනු ජීවිත නැවත පණ ගැන්වීමටත්, ශු. සභාව තුළ ක්‍රියාකාරී සාමාජිකයන් ලෙස ක්‍රිස්තු උත්ථානයට සාක්ෂි දැරීමටත් සභා මාතාව විශේෂාකාරයෙන් අද දින අපට ආරාධනා කරයි. හුස්ම නැති තැන ප්‍රාණයක් නැතිවාසේම, ශුද්ධාත්මයාණන් තුළ නැවත ජීවන හුස්ම ලබා අප තුළ වරප්‍රසාදීය ජීවිතයකට ඇතුළු වීමටත්, ශුද්ධාත්ම ගින්නෙන් අපගේ හදවත් දවා අප තුළ සිරගතව සිටින ආත්මයාණන් මුදා හැර අප තුළ හා අප මගින් මහඟු ක්‍රියා හා හාස්කම් සිදුකිරීමට උන්වහන්සේට ඉඩ දිය යුතුය. පෙර සඳහන් කළ අන්දමට බයේ සැඟවී සිටි ගෝලයන් ශුද්ධාත්මාගමනයත් සමඟ නැවත ජීවය ලබා නොබියව දේව වචනය දේශනා කළා සේ කිතුනු අපගේ එදිනෙදා ජීවිතය තුළ ශුද්ධාත්ම බලය අපි අත්දැකිය යුතු වෙමු. විශේෂාකාරයෙන් කිතුනු අපගේ නිසි දැක්ම ගිලිහීමට නොදී අප තුළ යක්ෂයාගේ වහල්කම් අවබෝධ කරගැනීමට ශුද්ධාත්ම ගින්නෙන් අපගේ හදවත් දවාලන්න කියා අපි උන්වහන්සේට කන්නලව් කරමු.

✍ ගරු පී. දිලීප එරන්ද සහෝදරතුමා
ගොන්සාල්වෙස් සිංහල ආයතනය
අම්පිටිය ජාතික දෙව්සත්හල

## මා කෙරෙහි විශ්වාස කරන්න

| | |
|---|---|
| එපා එපා කැළඹෙන්නට මගෙ ආදර දුවේ | පුතේ |
| දුක් කරදර රෝ පීඩා ඇති වූ විට ගතේ | සිතේ |
| විශ්වාසෙන් මදෙස බලා එල්ලෙන්නකො මගේ | අතේ |
| සනසන්නම් ශාන්තියෙන් පුරවා ඔබ මගෙම | පුතේ |
| | |
| දුක් කරදර පැමිණෙන්නේ ඔබ පරිණත | කරවන්නයි |
| ලෝකය ගැන මිනිසුන් ගැන අවබෝධය ගෙන | දෙන්නයි |
| නැණ බලයෙන් විසඳාගෙන ඔබ බලවත් | කරවන්නයි |
| කෙළෙසින් හෝ ඒ සැම මගින් මම ඔබ වෙත | පැමිණෙන්නයි |
| | |
| මම ඔබ තුළ වැඩ සිටිනව දරුවනි ඔබ දන්නෙ | නැද්ද |
| ඒ හින්දද පව් කරන්නෙ මුළු ලෝකෙම රිද්ද | රිද්ද |
| මගෙ ආදර බල මහිමය පතුරවමින් වෙමි | සුද්ද |
| දිවි ගෙවන්න අන් සැම දෙන මගෙ තුරුළට ගන්න | ඇද්ද |
| | |
| ආදරයෙන් ඔබ තුළ මම වැඩ සිටීම නො | තැකීමයි |
| අතී දරුණු මහ පාපය මට ඇති ශෝකය | ඒකයි |
| මා සමඟම දිවි ගෙවන්න සව් බල ඇති දෙවිඳු | මමයි |
| නැතහොත් ඔබ නපුරට බිලි වෙන එක නම් | සිකුරුයි |

කැපුන්ගොඩ මා.කො. ජයමාන්න

# පාළුකරය ශුද්ධාත්ම ආරාධනාවකි
# පෙන්තකොස්තය එම සහභාගිත්වයේ ඵලයයි

පාස්කු මංගල්‍යය නිමවා සහනදායකයාණන්ගේ මංගල්‍ය සැමරීමට අප බලාපොරොත්තුවෙන් පසුවෙමු. මෙතෙක් ගත කළ චතාරිකයන්ට වඩා වෙනස්ම අත්දැකීමක් ලබමින් මෙවර පාස්කුව රස වින්දෙමි. ඊට පසුබිම් වූයේ ශු. දේශය නැරඹීමට ගිය වන්දනා ගමන විය. ක්‍රිස්තුස් වහන්සේ පාළුකරය ගත කළ කන්ද වෙත අපි ගියෙමු. එහි දී ක්‍රිස්තුන් වහන්සේ මෙම දින හතළිහ ගත කරන්නට වූයේ කෙසේ දැයි මම මෙනෙහි කළෙමි. එම කඳු මුදුනේ අවුරුදු 25 ක් පුරා යාච්ඤා ජීවිතයක් ගත කරන වයස් ගත වූ පියතුමකු අපට දැකගත හැකි විය. එය මට මා වෙත හැරී බලන්නට අභියෝගයක් සැලැස්වීය.

සමදර්ශක සුවිශේෂ වල ආත්මයාණන් වහන්සේ විසින් ක්‍රිස්තුන් වහන්සේව පාළුකරයට පැමිණෙවූ බවත් එහිදී යක්ෂයා ඔවුන් වහන්සේව පරික්ෂා කළ බවත් සඳහන් වේ. එහෙයින් පාළුකරය ශුද්ධාත්මයාණන්ගේ ආරාධනාවකි. ප්‍රසාදජනක කාලය ශුද්ධාත්මයාණන් හා සම්බන්ධ වන්නට එතුමන් විසින් අපව කැඳවන කාලයකි.

අප ජීවිත තුළ පාළුකර අත්දැකීම් ඇති බවත්, ජීවිතේ මුහුණ දෙන පීඩාකාරී තත්ත්වයන් හා පරික්ෂාවන් එම පාළුකරයන් ලෙසත් මම සිතුවෙමි. මෙවර මම ඒ රාමුව මා සිතින් ඉවතලුවෙමි. පාළුකරය නම් ශුද්ධාත්මයාණන්ට පමණක් විවෘත වීමකි. එහිදී ශුද්ධාත්මයාණන් සමඟ ගත කරන විට මිනිසුන්ට තම ප්‍රධාන පරික්ෂාවන් හඳුනාගත හැකි වේ. කුසගින්න (කායික අවශ්‍යතා), ධනය, බලය වැනි ලෞකික අවශ්‍යතා හා මහිමය සෙවීමට ඇතිවන පරික්ෂාවන් අවබෝධ කර ගත හැකි වේ. ශුද්ධාත්මයාණන්ගේ බලය අවියක් කරගත් විට එම පරික්ෂාවන් ජයගත හැකිවේ.

"මා බලවත් කරනා සමිඳාණන් තුළ සියල්ල කළ හැකි වේ." ශුද්ධාත්මයාණන්ට නතු වීම තුළ අප සාක්ෂාත් කරගත යුතු ක්‍රිස්තුන් වහන්සේ අනාවරණය කරනා මාර්ගය එය විය.

★ කුසගින්න නිවාලන්නට ආහාර අපට කොතෙක් ලැබුණද එයින් සියල්ල කළ හැකි බලයක් නොලැබේ.

★ අප මෙලොව තුළ කොතරම් ඉහළ බලයක් අත් කර ගත්ත ද ඉනිදු සියල්ල කළ හැකි බලයක් නොලැබේ.

★ ධනය ජීවිතයේ ප්‍රශ්න සියල්ලම විසඳන ලෙස බොහෝ දෙන හැසුරුන ද ධනයට ද සියල්ල කළ හැකි බලයක් සතු නොවන බව ට නිදසුන් බොහෝ ඇත.

ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වය, ශුද්ධවූ ත්‍රිත්වයේ ඒකත්වය නිසා ද එතුමන් පාළුකරය තුළ පසක් කර ගත් අත්දැකීම අප බුද්ධියට ගෝචර නොවේ. එහෙත් එතුමන් පාළුකරයට ගියේ ශුද්ධාත්ම ආරාධනයට කීකරුව බව අපි දනිමු. ප්‍රසිද්ධ ජීවිතය ඇරඹීමට පෙර ඒ තුළින් සන්නද්ධ වූ බව අපි දනිමු. එහිදී ලෝකයේ ආහාර, ධනය, බලය සොයනවා වෙනුවට ලෝකයට එය සපයා දෙන්නට බලය හිමිවන බව තමන් වහන්සේගේ ජීවිතාදර්ශයෙන් පෙන්වා දුන් සේක.

මෙලොව ජීවිතය තුළ අප අයිති කරගත යුතු වටිනාම සම්පත ශුද්ධාත්ම බලයයි. අප වෙහෙස විය යුත්තේ ශුද්ධාත්ම බලයෙන් පිරෙන්නට ය. දිනපතා මොහොතෙන් මොහොත ශුද්ධාත්ම බලයට අවදි වෙමින් ගත කරන ජීවිතයකට පරිවර්තනය වන්නට හැකි නම් අපගේ ජීවිත කොතෙක් නම් වාසනාවන්තද?

දේව මාතාවන් තම ජීවිතය ශුද්ධාත්ම මෙහෙයුමට නතු කළා ය. සියල්ල දේව හස්තයට නතු කළ ඕතෝමෝ ශුද්ධාත්මානුභාවය අයිති කර ගත්තා ය. අපෝස්තුළුවරු ක්‍රිස්තුන් වහන්සේ ඇසුරු කළ ද එම රහස වටහා නොගත් හ. "ශුද්ධාත්මයාණන් ඒ තාක් නොදෙන ලද්දේ ය. මන්ද ජේසුස් වහන්සේ ඒ තාක් මහිමයට පත් නොවූ බැවිනි". (ශු. ජොහාන් 7:39). පසුව පෙන්තකොස්ත දින ශුද්ධාත්ම බලය උරුම කරගත් ඔවුන් ලද පන්නරය ඔවුන්ගේ ක්‍රියා විදහාපෑහ. "ප්‍රේරිතයන් විසින් ජනයා අතර කරන ලද ලකුණු ද අරුම පුදුම දේ ද බොහෝ විය." (ක්‍රියා 5:12-16)

ශුද්ධාත්මයාණන්ගෙන් පිරෙන විට දෛනික ජීවිතයේ සාතන් අප පොළඹවන පරික්ෂාවන් හඳුනාගෙන ඉන් ජය ගැනීමට ශක්තිය ලැබේ. ක්‍රිස්තුන් වහන්සේ තම දුක් විඳීම, මරණය හා උත්ථානය හරහා අපට දුන් අවිය ශුද්ධාත්මයාණන් වහන්සේ ය. අප තුළ සදහටම වැඩවසන තැනැන් වහන්සේව හඳුනා ගැනීමට අපට නොහැකි වේ ද? වචන වලින් කිව නොහැකි අපගේ සුසුම්ලැම් පවා හඳුනන ඔවුන් වහන්සේ සමඟ ජීවත් වීම අතපසු වන අපහසු කාර්යයක් වූයේ කෙලෙසද?

සිතුවිලි ආකල්ප බවටත්, එම ආකල්ප ක්‍රියා බවටත් එම ක්‍රියා පුරුදු බවට පත්වන බව මිනිස් චර්යාවේ එක් සත්‍ය දහමකි. එම දහම ශුද්ධාත්මයාණන් පණ පොවන්නට අපගේ සිතුවිලි පොහොණි කරගතහොත් කිසිවෙකුට බිඳිය නොහැකි ක්‍රිස්තුන් වහන්සේ දානය කළ ශාන්තිය අප භුක්ති විඳින්නන් වනු ඇත. එහෙයින් ශුද්ධාත්ම ආරාධනයට නිතර නිතර අපගේ ජීවිත සහභාගි කරවමු.

යූ. රංගනි ශාලිකා පෙරේරා
එඬේරමුල්ල

## ශුද්ධාත්මයාණෝ පැමිණි කල...

"පෙන්ටිකොස්ට්" යන්නෙහි ග්‍රීක අර්ථය වනුයේ පනස් වැන්න යන්නයි. එනම් පාස්කු මංගල්‍යය හෙවත් උත්ථාන මංගල්‍යයට පසුව එළඹෙන පනස් වන දිනයයි. මෙය පෙන්තකොස්ත නමින් හඳුන්වයි. පාස්කු මංගල සැමරුම දුබල මිනිසාගේ ගැලවීම අත්පත් කරගෙන දේව පුත්‍රයාණන් ප්‍රතික්ෂේපය, දුක්විඳීම හා මරණය මඟින් ගැලවීම සිදුකිරීම සංකේතවත් කරයි.

ක්‍රිස්තුන් වහන්සේ ශුද්ධවූ රුධිරයෙන් කළාවූ සළකුණ ඊට වෙනස් ප්‍රසාද ස්නාපන සක්‍රමේන්තුව ශුද්ධාත්මයාණන් මගින් කිතුනු අපට අපගේ හදවත් තුළ මුද්‍රා තබනු ඇත. එමගින් දේව දරුකමේ උරුමය ලැබීම මේ මහා ප්‍රේමයේ කැමැත්තයි.

උන්වහන්සේ පෙන්වා වදාළ සේ "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" යන මේ මහා ප්‍රේමයේ පනත ගල් පුවරුවක සඳහන් කළා සේ අපගෙ හදවත් තුළ ශුද්ධාත්මානුභාවයෙන් සළකුණු කර ඒ තුළින් අපට සමාව දානය කරනු ලබයි. දෙවිඳුන් මෙන්ම අපත් එකිනෙකාට එම ආදර භක්තිය, සමාව ප්‍රදානය කිරීම තුළ ශුද්ධාත්මයාණෝ අප තුළ ක්‍රියා කරමින් ඇතුළාන්ත ප්‍රීතිය සාමය අපට ලබා දෙයි.

මෙම ශුද්ධාත්ම ආගමනය අප සංඝය තුළ සමාජය තුළ ප්‍රේමයේ පෙන්තකොස්තයක් කරගත යුතුයි.

සමිඳාණන් වහන්සේ අහස් නැගීමෙන් පසු ශ්‍රාවකයින් සියලු දෙනා එක්රැස්ව ජෙරුසලමේ නැවතී සිටියහ. එදා පෙන්තකොස්ත දිනයයි. උන්වහන්සේගේ පොරොන්දුව පරිදි ශුද්ධාත්මයාණන් බලාපොරොත්තුව, යාච්ඤා කරමින් සිටියදී සැඩ සුළඟක් අවුත් රැස්ව සිටි ශාලාවේ දොරවල් විවෘත වී එකිනෙකාගේ හිස් මත ගිනි දිව් සටහන් වනු පෙණිනි. එකෙනෙහිම ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව අන්‍ය භාෂාවලින් කතා කරමින් බියෙන් සැඟ වී සිටි තැනින් පිටතට පැමිණියහ. මෙය ඔවුන්ගේ ප්‍රථම සාක්ෂියයි. දෙවියන් වහන්සේගේ සැලැස්ම තුළ ජේසු සමිඳුන්ගේ ප්‍රේමයේ පොරොන්දුව ඉටු කිරීමකි.

ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ අප ලබා ඇති, අප වෙත පැමිණි ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වී පවුල තුළ, සමාජය තුළ ප්‍රීතිය, සමාදානය ඇතිකරලීම කිතුනු අපට පැවරෙන වගකීමකි.

ශුද්ධාත්මාගමනය තුළ අප ජීවිතද ශක්තිමත් කරගනිමින් එදා ශ්‍රාවකයන් මෙන් ජේසු සමිඳුන් හට සාක්ෂි දරන්නට නොබියව එඩිතරව ඉදිරිපත් වෙමු.

එස්. බර්නදෙත් පෙරේරා
එඬේරමුල්ල

# නිවාස බැහැදැකීම අමතක වී ගොස්ද?

**කතුතුමනි,**

ශ්‍රී සම් පියතුමා තම නිවසට ලඟාවන දිනයට සතියකට, දෙකකට පෙර සිට එතුමාව තම නිවසට පිළිගැනීමට නිවැසියන් ගෙමිදුල, ගෙවත්ත, සිය නිවස ශුද්ධ පවිත්‍රකොට නිවසට ගෙමිදුලට නව පෙනුමක් ලබාදෙමින් නිවසේ බැඳී ඇති මකුළුදැල් ඉවත්කොට අනවශ්‍ය දෑ නිවසින් බැහැරකොට එම උදාර මොහොත ලඟාවන තුරු පුල පුලා බලා සිටින්නේ දැඩි සතුටකිනි. සෑම කිතුනුවකුම ගරු පියතුමකු, ගරු පැවිදි සොයුරියක තම නිවසට පය තැබීම සළකන්නේ තමන් ලද භාග්‍යයක් ලෙසටය. ඇතැම් නිවෙස් වල සුරුවම් කූඩුවද පිළිසකර වී නොදැල්වෙන පොල්තෙල් පහනද දැල්වෙන්නට පටන්ගනී.

නුවාන නායකයකු / නුවාන මූලිකයකුද කැටුව එසේ සිය නිවසට ගොඩවදින පියතුමාව නිවැසියන් පිළිගන්නේ ඉතාමත් සුහදශීලිව, භක්තියකින් හා ගෞරවයෙන් යුක්තවය. එසේ නිවසට ගොඩවදින පියතුමා පවුලේ සියලුම දෙනා සමගම නිවසේ ප්‍රතිමාව අබියස කෙටි යැදුමකින් පසුව නිවැසියන් ආසිරිගන්වා සුහද පිළිසඳරකට පණදෙයි. එසේ නිවැසියන් හඳුනාග ැන්මෙන් පසුව පියතුමාගේ ප්‍රථම නිරීක්ෂණය වන්නේ පවුල් පොත වෙතටය. එමගින් පවුලේ සියලුම සාමාජික සාමාජිකාවන් ගැන විශේෂ දැනුමක් ලැබගන්නා පියතුමා පවුල් පොත් ලැබගෙන නොමැති අයට පවුල් පොත් ලබා දෙන්නටද, දහම් පාසල් එන/ නොඑන දරුවන් පිළිබඳවද, විවිධ හේතූන් මත දේවස්ථානයෙන් දුරස්වී සිටින අය පිළිබඳවද පවුලේ සාමාජික සාමාජිකාවන්ගේ විවිධ හැකියාවන්, විශේෂ දස්කම් දේවස්ථානයේ කිසිදු ක්‍රියාකාරිත්වයකට අත නොදෙන්නන් පිළිබඳවද මනා වැටහීමක් ලබාග න්නා අතර, දේවස්ථානයේ ක්‍රියාකාරී සංවිධාන, ගායනා හවුල, දහම් පාසල් සේවය. සඳහාද සහභාග ිවන්නට ඔවුනට ඇරියුම් කරයි. විවිධ හේතූන් මත අපගේ රැළෙන් බැහැරව දුරස්ව සිටින පවුල්වල සාමාජික සාමාජිකාවන් නැවත ක්‍රියාශීලි කරන්නටද මේ නිවස බැහැදැකීමේ උදාර සංකල්පය බොහෝදුරට උපකාරීවේ.

මේ ක්‍රියාවලිය සමග සංඝයේ සෑම නිවසක්/නිවැසියන් හා දේවස්ථානය අතර පවතින දුරස්වීම් මතභේද, මිශ්‍ර විවාහයන් තුළින් පල්ලියෙන් දුරස්ව සිටින විවිධ කොටස් මෙන්ම අනාගමික සාමාජික සාමජිකාවන් තුළටද ලබාදෙන්නේ කිතු දහම පිළිබඳව විශේෂ පණිවුඩයකි.

එහෙයින් එදා සිට පැවැත එන 'නිවාස බැහැ දැකීමේ' සාර්ථක ක්‍රියාවලිය නැවත පණගන්වා එමගින් සෑම කිතුනුවකුටම නව ජවයක්, නව පණක් දෙවියන් තුළ ලබාදීමට සභානීතිය මගින් හෝ නිසි නියෝග ලබාදෙන්නේ නම් එය විවිධ හේතූන් මත රැලෙන් දුරස්ව සිටින අපගේ සැදැහැවත් ජනතාව නැවත රැළ වෙත ගෙන්වා ගැනීමටත්, එමගින් විවිධ හේතුපාඨ කියමින් අපගේ ජනතාව ඩැහැගන්නට මාන බලමින් අප වටා දින දින සැරි සරන මූලධර්මවාදීන් වෙතට ඇදෙන සෑම කිතුනුවෙක්වම එම දුර්පරීක්ෂාවන්ගෙන් මුදාග න්නටද එම නිවාස බැහැදැකීමේ සාර්ථක ක්‍රියාවලිය මහ පිටිවහලක් වනවා නොඅනුමානය.

**එම්. ජෝ. පාරිස්**
වැලිවිට

---

පාඨකයින්ගේ ප්‍රතිචාරය

ජනතා හඬ

ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

---

# දේව මෙහෙයේ සම්මාදම කලින් කළ යුතුයි

**කතුතුමනි,**

අප දේවස්ථානවල දේව මෙහෙය මැද භාගයේ සිදුවන පඬුරු ඔප්පු කිරීමේදී එයට අදාල සම්මාදම් එකතු කිරීමට පටන් ගැනීම ආරම්භ කෙරේ. එහිදී යම්, යම් කියවීම් භාරගත් අය මෙන්ම සුවිශේෂී සේවා කරන අයට මෙන්ම සම්මාදම් එකතු කරන අයටද දිව්‍ය පූජාවේ යම්, යම් විශේෂ කොටස් වලට සහභාගි වීමටද බාධා පැමිණෙන බැව් සත්‍ය කරුණකි.

එබැවින් සෑම දේවස්ථානයකම, සෑම පදවියකම සම්මාදම් එකතු කිරීම පඬුරු ඔප්පු කිරීමට (පැය කාලක) විනාඩි 15 ක කාලයට පෙර එකතු කිරීම කරන්නට සලස්වන්නේ නම් මැනවි. මන්දයත් පඬුරු එකතු කර අල්තාරයට බාර දෙන අවස්ථාවේදී යාගය ඔප්පු කිරීම හමාරවී ඇති බැවිනි. මේ පිළිබඳව ශ්‍රී ලංකා රදගුරු මඬුල්ල ක්‍රියා කරනු ඇතැයි විශ්වාස කරමි.

**ජූඩ් ජේ. ප්‍රනාන්දු**
ගෙලිඔය

---

# නමට තැන නැති වැඩක්!

**කතුතුමනි,**

කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් නිල නිවේදන හා දැන්වීම් මගින් ජනතාව දැනුම්වත් කිරීම පැසසුම් සහගතය. මෙවර උන්වහන්සේගේ වැදගත් නිවේදනය වන්නේ අගරදගුරු පදවියේ මීසම් හෝ අධ්‍යාපනික ආයතනවල පූජක මාරු වීම් වලදී තිළිණ ප්‍රදානය සඳහා මොනයම් ආකාරයකින් හෝ මුදල් එකතු නොකරන ලෙසයි.

කාදිනල් හිමිපාණන්ගේ නිළ දැන්වීමට අනුව මීසම හෝ අදාල ආයතනය භාර පියතුමා මාරුවීම් ලබන විට ඇතැම් කණ්ඩායම් ලහි ලහියේ පියතුමාට තෑගි බෝග දීමට මුදල් එකතු කරති. සමරු පොත් සකස් කිරීමට මුදල් එකතු කරති. ඇතැම් විට එක පවුලක සාමාජිකයන් පස් දෙනෙක් මීසමේ සමිති සමාගම් පහක් නියෝජනය කරන්නේ නම් එම මාසයට ඒ පවුලේ සාමාජිකයන්ට ඉතිරිවන්නේ 'අතේ ඇඟිළි' පමණයි.

බොහෝ පියතුමන් කල් තියා ප්‍රකාශ කරන්නේ තමන්ට සමුගැනීමේ උත්සව හෝ සිහිවටන ත්‍යාග අනවශ්‍ය බවයි. එහෙත් සමිති සමාගම් වල නායකයෝ ඊට වඩා බලවත් වෙති.

දුප්පත් මීසම්වාසීන්ගේ පසුම්බිය සූරා කනවට වඩා ඔවුන් ගේ ජීවන තත්ත්වය අවබෝධ කරගත යුතුය. එය එසේ සිදුවන්නේ දැයි සුපරීක්ෂාකාරි වීම අප සැමගේ යුතුකමකි. එය එසේ වන දින කාදිනල් හිමිපාණන් වහන්සේගේ නිල දැන්වීම මල් ඵල දරනු ඇත.

**මංගල ජයවර්ධන**
ගිංතොට

---

# යක්ෂයාගේ හෝරාවේ හෘදය සාක්ෂිය

**කතුතුමනි,**



පසුගිය මැයි පළමුවැනි දින අපේ සහෝදර කම්කරු ජනතාව සමරා විශේෂ දේව මෙහෙයක් පැවැත්විණි. එදින බොහොදෙනෙක් මල්වත්ත දෙව්මැඳුරට ගියහ. ඒ ශු. ජුසේ මුනිඳුන්ගේ නාමයට කැපකර ඇති මීගමුවේ දෙව්මැඳුරවීමය. අප සැම දන්නා පරිදි ශු. ජුසේ මුනිඳුන් යනු කම්කරු ජනතාවගේ හා සමස්ත වැඩකරන වෙහෙසෙන මිනිසුන්ගේ මුනිවරයාණෝය. මල්වත්ත පල්ලිය කියා හඳුන්වන මේ දර්ශනීය දෙව්මැඳුර හා පරිසරය හරිමැ සුන්දරය. එහෙත් මේ පල්ලිය තුළින් සදා අමතක නොවෙන ඛේදවාචකය අපේ ගරු අබා පියාගේ අකල් මරණයයි.

ඒ මරණයේ අභිරහස දෙවියන්ට පමණක් භාරදී කිතුනු අප නිහඬවිය. අද ඒ දෙව්මැඳුර අසලින් වැටී ඇති මාවතක් ගරු අබා පියාගේ නමින් නම් කර ඇත. ගරු අබා පියා ගිය කිතුනු මාවත සත්‍යයේ මාවත දෙස බස රැසට ආදරය කළ අභිමානණීය මාවත හඬ දේශපාලකයින් පිටුදැක ගිය සරල නිවැරැදි මාවත දිළිඳු දනට පෙන්වූ ප්‍රගතිශීලි මාවත මව්බිමට ළබැඳී ගිය දේශප්‍රේමී මාවත පරකම හෙළාදැක හෙළකම වටා ගිය සංස්කෘතික මාවත මේ සියලු දේට වඩා ආගම දහම අනුව ගිය මාවත දකින්නට පුදන්නට පිළිගන්නට අකමැති ශාපලද්දන් ඒ නිරායුධ අහිංසක පැවිදි දිවිය අවසන් කළේ මොනතරම් සැහැසි ලෙසද?

පුංචි රෝමයේ නම සදා කැත කළ ඒ ඝාතනය සිදුවී දැන් කල්ගතවී ඇත. කාලය සියල්ල මතකයෙන් ඈත්කර ඇත. ඒ මරණය අබිරහසක් වුවද ඒ ගැන පැතිරගිය කට කථා විටින් විට මතුවේ.

මල්වත්ත දෙව්මැඳුර හා ඒ අවට ඇති ගහ කොළ ඒ බිහිසුණු රාත්‍රියේ යක්ෂයාගේ ක්‍රියාව හොඳින් දැන හැඳින අදත් ගොළුවන්සේ සිටී. එම ගොළු බව යක්ෂයින්ව හා යක්ෂයින් රැකි අධමයින්ට සතුටකි. එහෙත් යම් දිනෙක රජ කිරුළු පැළඳ උසස් තැන්වල සුදනන් සේ සිටියත් සිය හෘද සාක්ෂිය මොරගසා අවසන් මොහොතේ ගරු අබා පියාගේ හඬ හා රුව මනසේ ඇවැටෙනවිට මල්වත්ත දෙව්මැඳුරේ සීනු හඬ මුන්ගේ දෙසවනට හෙණ හඬක් නොවේද?

**මා. ජයවීර**
පිටිපන

---

# මඩු සිද්ධස්ථානයේ සනීපාරක්ෂ කටයුතු සඳහා වැඩි අවධානයක් ඕනෑ!




**කතුතුමනි,**

වසර ගණනාවක් පුරාවට පැවති යුද තත්ත්වය නිසා බොහෝ සේ අලාභහානියට පත්වූ මඩු සිද්ධස්ථානය මේ වන විට නැවත සියලු ප්‍රතිසංස්කරණ කටයුතු නිමවා පෙරටත් වඩා අලංකාර ලෙස නිමවා තිබීම ගැන අපි සතුටු වෙමු. ඒ සඳහා ඇප කැපවී කටයුතු කළ සිද්ධස්ථාන පාලක පියතුමාටත්, එතුමාගේ කාර්ය මණ්ඩලයටත් අපි ස්තුති වන්ත වෙමු. බොහෝ වන්දනා කරුවන් දැන් මේ වන්දනා ස්ථානය කරා පැමිණීමද එසේ පැමිණෙන වන්දනා කරුවන් සඳහා සීමිත නිවාස සංඛ්‍යාවක්ද මේ වන විට ගොඩනගා තිබේ.

ජූලි, අගෝස්තු මහා මංගල්ල සමයේ පැමිණෙන බැතිමතුන්ට නම්, කුමන හෝ නිවාසයක් ලබා ගැනීම ඉතා අසීරුය. බොහෝ වන්දනා කරුවන් මෙවැනි මංගල සමයන් තුළ පැමිණෙනුයේ, කඳවුර තුළ කුඩා කුඩාරමක් අටවා ගැනීමට සියල්ල සූදානම් කොට ගෙනයි. මෙසේ පැමිණෙන වන්දනා කරුවන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නය 'වැසිකිළි' ප්‍රශ්නයයි. ප්‍රමාණවත් යැයි සිතිය හැකි වැසිකිළි පද්ධති තිබුණද වරක් භාවිත කළ පසු තවෙකකුට එය භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක් උදාවීම ප්‍රධාන ගැටලුවයි. භාවිත කරන්නා රැගෙන එන කුඩා වතුර භාජනයෙන් තම අවශ්‍යතාවය පිරිමසා ගෙන පිටව යනුයේ අයෙකුට එය භාවිත කළ නොහැකි වන සේ අපවිත්‍ර කරමිනි. එය පිරිසිදු කිරීමට අවශ්‍ය වතුර ළඟ පාතක නොතිබීම ද ගැටලුවකි. මෙයට විසඳුමක් ලෙස අදාල වැසිකිළි කාමරවලට ජල සැපයුම ලබාදීම හෝ කිසියම් සාධාරණ මුදලක් අය කර හෝ සනීපාරක්ෂක සේවකයන් යෙදවීම කළ යුතුවේ.

**ජූඩ් සේනාධීර**
මට්ටක්කුලිය





# අඹරට පෑයූ දිනිසුරාණෝ

සිත් නො ගනී. එතුමන් ස්වකීය ආදරණීය ගුරුවරුන් උදෙසා ම සෑම විටෙකදී ම සිදු කළේ අලුත් දෙයකි. දරුවන් වෙනුවෙන් වියදම් දැරීමට එතුමෝ කිසි විටෙක පසුබට නොවූ හ. තම ආදරණීය ආචාර්ය මණ්ඩලයට ද එතුමෝ සංග්‍රහයෙහි පසුබට නො වූයේ තෘප්තිමත් මනසකින් යුතු ඇදුරු මඬුල්ලක් සිසු දරුවන්ගේ ජීවිතවලට අත්‍යවශ්‍ය වූ නිසාවෙනි. ගෞරවාන්විත ව පාසල වෙත ලැබෙන සියලු මුදල් ලෝභී සිතින් ගොඩගසා ගැනීමක් එතුමන් අතින් කිසිදා සිදු වූයේ නැත. පාසලේත් සිසු දරුවන්ගේත් අවශ්‍යතා සඳහා එම රැස් වූ මුදල් යළි ගෞරවාන්විත ව ක්‍රමානුකූල ව වියදම් කිරීම පමණක් මැ සිදු විය. මේ ලිපිය ලියන ලියුම්කරු මාරුවීමක් රැගෙන මේ පාසලේ ආචාර්ය මණ්ඩලයට එක් වන්නේ 2011 වසරින් පසුව ය. එතැන් සිට අද මේ ලිපිය ලියන මොහොත දක්වා එතුමන් මෙම විදුහල වෙනුවෙන් කළා වූ අපරිමිත මෙහෙවර මෙවන් ලිපියකින් සම්පූර්ණයෙන් ගෙන හැර පෑමට උත්සහ දැරීම අපට කිසිසේත් සිදු කළ නො හැකි ය. එපමණට, අපමණට එතුමන් කළ විස්මකුරු දෑ බොහෝ ය. ලංකාවේ පාසල් ඉතිහාසයේ ප්‍රථම වතාවට සිසු දරුවන් හට බහු ප්‍රක්ෂේපණ මාධ්‍යයෙන් ඉගෙනුම ලබනු වස් සෑම පන්ති කාමරයකට ම නවීනතම බහු කාර්ය රූපවාහිනී යන්ත්‍රය බැගින් සවි කරවා ඒ ඔස්සේ ඔවුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කරවීමට එතුමෝ දරුවන්ගේ දෙමාපියන් හා එක් ව පෙරමුණ ගත්හ. සිසු දරුවන්ගේ දැනුම් පිපාසය සන්සිඳුවීමට පුස්තකාලය සඳහා අවස්ථා කිහිපයක දී ම අධ්‍යාපනික පොත් මිල දී ගැනීමට වාර්ෂිකව වෙන් කෙරුණු මුදල අති විශාල ය. සරසවි නාට්‍ය නිර්මාණ තරගාවලිය, රාජ්‍ය ළමා නාට්‍ය තරගාවලිය සඳහා ඉදිරිපත් කෙරුණු නාට්‍ය නිර්මාණ සඳහා සියලු බර පැන දැරුණේ විදුහලෙනි. සරසවි නාට්‍ය නිර්මාණ තරගාවලියේ 2013 වසරේ "හොඳ ම ළමා නිළිය", "හොඳ ම සංගීතය", "හොඳ ම වේදිකා පසුබිම" ආදී සම්මාන රැසක් අප හිමි කර ගත්තේ අප සියල්ලට ම පසු







පසින් විහිද තිබූ ගරු පියතුමන්ගේ යුග දෑත් අපට සවියක් වූ නිසා ම නො වන්නේ ද? 2014 වසරේ රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ ද අවසන් වටය දක්වා ම අපි පැමිණියෙමු. ඊට අපි නවකයන් වීමු. මතු දිනෙක එය ද අපි දිනන්නෙමු. පියතුමෙනි, ඒදිනට ඇතින් හිඳ ඔබ අප දෙස බලා තුටු වනු නො අනුමාන ය. සිසු දරුදැරියන්ගේ නැටුමට රැඟුමට විදුහලෙහි අලුතින් ඉදි කළ අංග සම්පූර්ණ වේදිකාව සහ එහි සියලුම තිර සඳහා දැරූ වියදම අති විශාල ය.

වරෙක පාසල් දරුවන්ගෙන් පෙරදිග තූර්ය වාදක කණ්ඩායමක් නිර්මාණය කිරීමට සිත් වූ එතුමන් අවැසි සියලු තූර්ය භාණ්ඩ කට්ටල දෙගුණයක් බැගින් මිල දී ගැනීමට අපට උපදෙස් දුන්නේ මීගමුවේ ම එක්තරා විදුහලකට එම තූර්ය භාණ්ඩ කට්ටලවලින් ම කොටසක් පරිත්‍යාග කොට එම විදුහලෙහි ද අපගේ මෙන් ම තූර්ය වාදක කණ්ඩායමක් පිහිටුවීමට අත දීමේ අභිලාෂයෙනි. එය එපරිද්දෙන් ම සිදු විය. දයාවේ සේවාවන්ට එතුමාණෝ නිති අත දුන්හ. සිසු - ගුරු සියල්ලන්ම ඊට දිරි ගැන් වූහ. විදුහලේ තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ ප්‍රධාන අනුශාසකවරයාණෝ එතුමාණෝ ය. එතුමන්ගේ මූලිකත්වයෙන් 2014 වසරේ නත්තලෙහි සතුට තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයේ සිසු සිසුවියන් විසින් බෙදා හදා ගනු ලැබුවේ පුත්තලම දිස්ත්‍රික්කයේ අතිදුෂ්කර කනිෂ්ඨ පාසලක සිටි සිසු සිසුවියන් 54 ක් සමඟ ය. මුළු පාසලට ම සිටින එම සිසු සිසුවියන් සියලු දෙනාට ම අවශ්‍ය පාසල් උපකරණ පොත් පත් සෙල්ලම් බඩු පමණක් නොව නවීනතම පරිගණක දෙකක් ද පරිත්‍යාග කිරීමට අප විදුහල් දරු දැරියන් ව යොමු කර වූයේ එතුමන් ය. තම සසුන් එඬේරාණන් වන පළමු වන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් ව අනුග මනය කරන්නට එතුමන් පටන් ගත්තේ අද ඊයෙක නොවේ. සුදොතුම් පියාණන් සතු සරල අල්පේච්ඡ ජීවිතය ගරු සුදත් ගුණතිලක පියතුමන් වෙතිනුදු අපි නිතර දුටුවෙමු. අපි එහි සාක්ෂිකරුවෝ වන්නෙමු.

කඩොල් උයන, සාන්ත ජෝසප් ශාඛා විදුහල සම්බන්ධයෙන් එතුමන් මැවූ සිහින තවත් බොහෝ විය. නිශ්චිත ඉදිරි දැක්මක් එතුමන්ට තිබිණි. වසරින් වසර විදුහල මේ මේ අයුරින් ගොඩනැංවිය යුතු ය යන පැහැදිලි ඉලක්කයන් එතුමන් සතු විය. යාච්ඤා ගෘහය සහ සිසු දරුවන් සඳහා අවැසි උසස් පෙළ පන්ති අධික වේගයෙන් ඉදිවෙමින් පැවතිණි. එය ද සුවිසල් ව්‍යාපෘතියෙකි. විදුහලට ම කියා පිහිනුම් තටාකයක් ඉදි කිරීමට පිඹුරුපත් ද සැකසී තිබිණි. එහෙත් 2015 වසරේ දී නැවතත් ස්වාමීන් වහන්සේගේ පණිවුඩය එතුමන් වෙත ලැබී තිබිණ. දරුවන්ට, අපට එතුමන් දැක් වූ සෙනෙහස පසු ගිය මාස කිහිපය තුළ තව තවත් වැඩි වන්නට වූයේ එම පණිවුඩයේ ප්‍රතිඵලයක් ලෙස වග අපි නො දැන සිටියෙමු. සිසු දරු දැරියන් තව තවත් එතුමන් තුරුලට වූයේ ඔවුන් හැර යන්නට ඔවුන්ගේ පියතුමන්ට සිදු ව ඇති බව නො දැන ය. එහෙත් එදා මෙන් අදත් ගරු සුදත් ගුණතිලක පියතුමන් දේව අණට හිස නැමී ය. අතිගරු කාදිනල් නාහිමිපාණන්ට කීකරු ව පූජක කැඳවීමේ නියම අරුත පසක් කරවමින් අපගෙන් සමුගෙන, මීගමුව ලොයලා විදුහලෙහි අභිනව අධ්‍යක්ෂක පිය ධුරය භාර ගැන්මට එතුමන්ට සිදු විය. සැබැවින් ම එය එතුමන් කඩොල් උයනෙහි සාන්ත ජෝසප් ශාඛා විදුහලට සිදු කළ අනුපමේය සේවාව උදෙසා එතුමන්ට පිරි නැමුණු උසස් වීමක් වැන්න. නොසිතූ නොපැතූ මොහොතක පතිත වූ අකුණු සැරයක් මෙන් ලද "ගරු පියතුමන් අප විදු බිමෙන් සමුගෙන යන වග" සඳහන් පුවත ම අපි මල් වෙඩි සැර බවට හරවා ගත්තේ අප ආදරණීය පියතුමන් ලද නව දේව කැඳවීමට ඉතසිතින් ආශීර්වාද කරමිනි. අපට ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි ය. එහෙත් ගරු පියතුමන් ලද වටිනා ඇරයුමට බාධා පැමිණ වීමට අපට නො හැකි ය. අපි සැම හදවත් ඇති සම් ලේ ඇට මස් නහරින් සැදුණු මනුෂ්‍යයෝ වෙමු. මනුෂ්‍ය මට්ටමට බට දේව පුත්‍රයාණන්ගේ හදවතට පවා වේදනා ගෙන දුන් අවස්ථා පිළිබඳ ව අපි හොඳින් දනිමු. ගරු සුදත් ගුණතිලක අදියුරු පියතුමන්ගේ වෙන් ව යාම අප හදවත් සෝකුරු කරතත් ඒ සියල්ල සම සිතින් ඉවසා විඳ දරා ගැන්මට අපි යත්න දරමින් සිටිමු. එතුමන් අප විදු පියස පිළිබඳ දුටු සිහින සැබෑ කරන්නට ක්‍රියා කිරීමට එක මැ සාන්ත ජෝසප් විදු සංඝයක් ලෙස අපි එතුමන්ට ප්‍රතිඥා දෙමු. එදා 2006 වසරේ දී ගරු සුදත් ගුණතිලක පියතුමන්ගේ දෑතේ එල්ලී එතුමන්ට තුරුලු වූ ආදර පුතේ, දුවේ, තව එක් වරක් එතුමන් වටා හිඳ එතුමන්ට තුරුලු වන්නැයි මම ඔබ සියලු දෙනාගෙන් ම ඉල්ලා සිටිමි. දරුවෙනි, විදුහලේ පළමු සිසු කණ්ඩායම වශයෙන් ඉතිහාසගත වන ඔබ සියලු දෙනා අ.පො.ස. සා. පෙළින් අති විශිෂ්ට ලෙස සමත් ව එතුමන් ගොඩ නැඟූ ඔබේ දෙවැනි දිවිය බඳු මේ විදු බිම එකලු කරන්නට එතුමන්ට පොරොන්දු වන්න...

**"ඇල්මෙන් අකුරට ඇවිදින් - අකුරු හිඳගෙන**
**කවි - පදයක් එක් කරන්න - පාසල් ගීයට**
**ඔබ මෙ බිමෙන් අරගෙන යන - පස් පෙති මල් ඇට**
**යන්න ගිහින් පැළ කරන්න - ඔබ යන තැන් වල**
**ඒ බිජුවට දලු ලා මල් - පීදෙන දවසට**
**සුවඳ දැනේ සිය ගව් දුර අප ඇති තැනකට..."** ( රත්න ශ්‍රී විජේසිංහ )

යනුවෙන් එවිට කඩොල් උයන, සාන්ත ජෝසප් ශාඛා විදුහලේ පළමු විදුහල්පති අදියුරු වශයෙන් ඔබට සෙවණ දුන් ගරු සුදත් ගුණතිලක - අප ආදරණීය පියතුමන් ද නෙත රැඳුණු තුටු කඳුළින් යුතු ව කෙදිනක හෝ ඔබ සැමට පවසනු ඇත.

**ලහිරු දරණකුඹුර** – විද්‍යාලයීය ආචාර්ය

# ක්‍රිස්තුන් වහන්සේ භාරතයට වැඩි සේක් ද?



**යටගිය දවස**

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**202**

**පසුගිය සතියෙන්**

ආරම්භකොට මැක්ස් මුලර් මහාචාර්ය තුමා ලියා ඇත්තේ "නොටොවිච් නමින් කිසිම රුසියානු ජාතිකයකු ලඩාක්හි වැසියෝ නොහඳුනති. එහෙත් නොටොවිච් මුසාවක් නො කියන මහත්මයකු ලෙස සලකා බැලුවොත් ඔහු පළ කළ පාඨයන් අසත්‍ය හෙයින් එම ආරාමයේ විසූ අය ඔහු මෝඩයකු ලෙස සලකන්නට ඇත." කියාය.

ක්‍රි.ව. 1895 අග්‍රාහි රාජ්‍ය විද්‍යාලයේ මහාචාර්ය ජේ. ආච්බෝල්ඩ් ඩග්ලස් "Oriental Bibliography"නමැති සඟරාවේ "නොකටාවිච්ගේ මුසාව හෙළි කිරීම" සහ "අසරණ මොස්කව්වැසියා" යන මාතෘකා යටතේ ලිපි දෙකක් සපයා ඇත. එතුමන් පැහැදිලිව සහතික කැර ඇත්තේ, නොටොවිච් විස්තර කළ පරිදි ලඩාක් යන මාර්ගයේ ඒ සතුන් කිසිවකු ද, විශේෂයෙන් දිවියන් ගැන එහි මහලු පිරිස පවා නො දන්නා බවත් ය. තවද සුදු මහතකු ගැනවත් ඔහුගේ සේවකයකු දිවියකු විසින් මරා දමන ලද වගවත් අසාවත් නැති බවය.

එසේ ම මහාචාර්ය ඩග්ලසයන් හේමිස් හි ආරාමයට ගොස් එහි පසළොස් වසරක් තුළ අධිපතිව සිටි ආරමාධිපති හමු වී ඇත. ආරාමාධිපති තුමන් පැහැදිලි ව ප්‍රකාශකොට, ලියා නිල මුද්‍රාවද යොදා සහතික කොට දක්වා ඇත්තේ "මම ඉකුත් පසළොස් වසර තුළ කකුල කැඩුණු කිසිදු යුරෝපීයකුට නවාතැන් නොදුන්නෙමි" කියා ය. එසේ ම සුදු මහතකු විස්තර කැර ඇති කිසිදු තිළිණයක් තමන් නොලද බවත් "උණ කටුවක්" කියන්නේ කුමක්දැයි තමා නො දන්නා බවත් හෙතෙම පවසයි.

අවසානකොට ජේසු සමිඳුන් ගැන කිසිදු යුරෝපීයයකුට තමා පොතකින් කිසිවක් කියවා දී නැති බවත් එවැනි ග්‍රන්ථයක් තම ආරාමයේ නැති බවත් ඉකුත් වසර 42 තුළ එවැනි කිසිම ග්‍රන්ථයක් ගැන තමා අසා නැති බවත් ජේසු සමිඳුන් ගැන එහි බුදුනුවන් කිසිවක් අසා නැති බව ද එතුමෝ සහතික කොට ප්‍රකාශ කළහ. එදා ක්‍රියා කළ පරිවර්තකයා ද ඉහත සඳහන් වාර්තාව සහතික කර තිබේ.

නොටොවිච්ගේ ග්‍රන්ථයේ සඳහන් වන සෙසු විස්තර ගැන ආරමාධිපති ගේ උරණ ප්‍රචාරය වූයේ "මුසාවක්, මහා මුසාවක්" යනු යි.

නිර්මාණශීලී කිතුනු දනව්

කලා සංග්‍රහය

ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

ප්‍රදීපය කෙටි කතාව

# සදහටම ඔබයි අම්මා!

ඇන්තනි ජයලත් - රාගම

"අනෙ අප්පේ, පුදුම ගිරිස්මයක්නෙ බං, කෙලියෙ. වතුර උගුරක් බීම නම් පංකාදුයි." කට හඬින් ඒ මරිය නෝනක්කා බව හඳුනාගත් සමනලී මහා දොර විවර කොට මුළුතැන් ගෙය කරා පිය මැන්නේ වතුර වීදුරුවක් ගෙන ඒමටය.

"දවසම මහ පාරෙ. හතර හන්දි රිදෙනව බං. කොහෙද ඉතින් අපේ කාරියට වැඩියෙ දේව කාරිය ලොකුයිනේ....."

"ඔය තරම් අමාරු නම් ඔය දේව කාරිය වෙන කෙනෙකුට පැවරුවා නම් අහවරයිනේ. ඔය ඕනි තරම් ඉන්නෙ හයි හත්තිය තියෙන තරුණ අය. තැන තැන කැඞී ඉහිරුනු ලණු ඇඳට බරවු ඈ උගුරට දෙකට වතුර වීදුරුව හිස් කරද්දී සමනලී ගේ ඇනුම් පදය ඇයට ඉවසුම් නොදුන්නත්, තත් ඒ යටපත් කළ ඈ කට හඬ අවදි කළාය.

"මේව එහෙම හැම එකාලටම කරන්න පුලුවන් කාරියක් නෙමේ මේක අපේ පරම්පරාවෙන් පරම්පරාවට ආපු දේව කාරියක්. උඹට කීව්වට මොකෑ කෙලියෙ අපේ අප්පල, මුත්තල, කිරිකිත්තල....." මරිය නෝනක්කාට එතැනින් එහාට වචනයක දු කථා කරන්නට ඉඩ නොතැබූ සමන්මලී කට හඬ අවදි කළාය.

"මීසම් කාසි එකතු කරන්ට වෙන්ටැ ආවේ. නැතුව කොහෙද උඹලට අපිව මතක් වෙන්නෙ.

"පල්ලියෙ වැඩ කටයුත්තක් ඇරුනහම අහවල් එකකටැයි මම ගෙවල් ගානෙ රිංගන්නෙ. ඊට පස්සෙ උඹලාම කියාවි මම ඕපා දූප හොය හොයා ඇවිදිනව කියලා."

සමනලී මුදල් සහිත පවුල් පොත ඇය අත තැබුවාය. පොතේ පිටු පෙරලමින් මුදල් සටහන් කළ මරිය නෝනක්කා උපැස් යුවල ගලවා යන්න සූදානම් වුවත් සමනලී කථාව නැවතත් පටන් ගත්තාය.

"පවුල් කාසි එකතු කළාය කියල විතරක් දේවකාරිය ඉටු කරන්න බැහැ. වගකීමක් ගන්න කෙනෙක් හැටියට ඒකකයෙ මිනිසුන්ගෙ දුක සැපත් හොයා බලන්න ඕනි.

බලාපොරොත්තු නොවු මොහොතක තමා ඉදිරියේ ඇද වැටුණු මේ බෝම්බය කුමක් දැයි මරිය නෝනා අක්කාට සිතා ගත නොහැකි විය. ඒ නිසාම කථාව වෙනතකට යොමු කළ ඈ සමනලී අස්වසාලන්නට උත්සාහ කළාය.

"මේ මාසෙ මැයි මාසෙ නොවැ. මේ පාරත් දේව මෑණියන්ගෙ සුරුවම ගෙවල් වලට වැඩමවනව."

සමනලී ඒ නොඇසුනාක් මෙන් ආලින්දයේ කෙලවරට යන්නට හැරෙද්දී මරිය නෝනක්කාද ඇය ලුහුබැන්දාය.

"මේ පාර සුරුවම උඹලගෙ ගෙදරින්ම පටන් ගන්නයි මම හිතාගෙන ඉන්නෙ."

"බොරු බේගල් ඇද බාන්නෙ නැතිව හිටහල්ල. උඹද එහෙම නැත්නම් සුවාමිද ඒක වෙනස් කළේ."

සියල්ල පැටලී තමා පිටම කඩා වැටෙන්නට යන බව වටහා ගත් ඈ ඉතා ඉක්මනින් මෙතැනින් පිට වී යා යුතුව ඇති බව තේරුම් ගත්තත් ඉඳි කඩුල්ල පනිමින් නිවසට එන පබෝධා කෙලී දැක විමසිලිමත් වූවාය.

"මේ මරිය අම්මනේ..... මම බැලුවෙ කවුද කියල. තේ ටිකක් වත් දුන්නද අම්මෙ." අම්මාගේ නිහඬතාවයෙන් එය තේරුම් ගත් පබෝධා මුළු තැන් ගෙට ගියේ ඈ සඳහා තේ කෝප්පයක් පිළියෙළ කරදීම සඳහාය.

"පබෝද කෙලී දැන් යස හැඩයිනේ බං. සිරියාවන්ත කෙලි පොඩ්ඩි. නැද්ද තාම පිළිවෙලක් කරන්න බැලුවෙ."

"ඊට ඉස්සර හිතන්න කොයි තරම් දේවල් තියෙනවද? මං කියල කොහොමෙයි කෙලිගෙ වැඩ කටයුතු තනියම කර ගහන්නෙ. සෙනරත් හිටිය නම් අපිට මෙහෙම කලක් යන්නෙ නැහැ."

තම සැමියාගේ අකල් වියෝව නැවතත් ඈ අතීතයට ගෙන ගියාය. රැකියාවක් නොකොට ගෙදර දොරට කොටු වී සිටි තමාට සැමියාගේ වියෝවෙන් පසු වත්තේ රබර් කිරි කපන්නට යන්නට වූයේ කුඩා පබෝධා ලොකු මහත් කර ගැනීම සඳහාය. එහෙත් එදා පටන් මේ වන තුරුත් කිසිවකුට හෝ අතපාන්නට හෝ නැති බැරිකම් කියා පාන්නට ඈ උත්සුක නොවුයේ පබෝධාට කවදා හෝ එය පහරක් වෙතැයි සිතු නිසාමය. උගත් කම තිබුනත් හරි හැටි රැකියාවක් නොමැති කම නිසා තම දුවනියගේ අනාගතය ගැන සමහර විට ඇයට බියක් දැනුනත් දේව මෑණියන් කෙරෙහි ඈ තුළ ඇති විශ්වාසය ඒ හැම බියක්ම යටපත් කරන්නට සමත් විය.

තේ කෝප්පයක් වෙනුවට තැඹිලි වීදුරුවක් මරිය නෝනක්කා අත තැබූ ඈ නැවත හැරුනේ නිවසින් පිට වීමටය.

"වැඩි දොහක් නෑ, පහල ලියැද්දෙ රාළහාමිගෙ කමියුනිකේෂන් එකේ වැඩට යන්න අරන්. නිකන් හිටියොත් ඒකත් නැහැනෙ." සමනලි තම දුවනිය පිළිබඳ තොරතුරු ඈ හමුවේ තැබුයේ පහන් ස්වරූපයකිනි.

"මෙහෙම ඇහැව්වට අහිතක් එහෙම හිතනව නෙමි ඕන්. මොකද කෙලිගෙ කන් දෙකම පාලු වෙලා. කනේ තුවාලයක්වත්ද?"

"කෙහෙල් මල් තුවාලයක් නෙමි. කරාබු ජෝඩුව උගස් පලේ. අවුරුද්දක් ගත වුනා. සින්න වෙන්න කොලෙත් ඇවිල්ල."

".... රත්තරං බඩු නම් උගස් කරන එක නරකයි. අපේ අම්මල කවදාවත් ඔය වැඩ වලට ඉඩ දුන්නෙ නැහැ. ලුණුයි බතුයි කැවත් රත්තරං බඩුවක් අප උගස් කළේ නැහැ."

සමනලී කෝපය තද කර ගත්තේ මහත් ආයාසයකිනි. නෝනක්කා ඈ දෙස බලා සිටියාය.

"මම සුවාමිටවත් කියල බලන්නම්කො. කෙලීට මොකක් හරි රක්‍ෂාවක් හොයල දෙන්න කියල."

ඇයට කථා කරන්නට තවත් ඉඩ නොතැබූ සමනලී නෝනක්කා වෙත කඩා පැන්නාය.

"බොලා ඉතින් හැමදාමත් කළේ ඔය ටිකමනේ. ඒත් කරපු දෙයක් නම් නැහැ."

ලණු ඇඳේ අත තැබූ ඈ වහා නැගී සිටියේ තව දුරටත් එහි රැඳී සිටීම අවදානම් බව වටහාගත් නිසාය. එහෙත් ඒ බව නොපෙන්වූ ඈ බොරු සිනාවක් නංවා ගනිමින් කට හඬ අවදි කළේ යන්නට සැරසෙමිනි.

"සුරුවම ගෙදරට එන දවස මම හරියටම දැන ගෙන කියන්නම්කො."

"සුරුවම ගෙනාවය කියල මිනිස්සු අලුතින් වෙනස් කොරන්න බැහැ නෝනක්කෙ. ඔය වැඩවලින් තියෙන එකමුතුකමත් සමහර විට නැතුව යනව."

"අහල පහල අය පවුලක් වාගෙ එකට එකතු වෙලා යාච්ඤා කරන කොට, බෙදා හදා ගෙන කන බොන කොට එතන එකමුතු කමක් ඇතිවෙන්නෙ නැද්ද මම අහන්නෙ. අනික මේ වතාවෙ සුරුවම් දහයක්ම ගම වටේ සංචාරය කොරනව."

"ඕව නම් හැබෑවටම බොරු වැඩ."

"බොරු වැඩ.....?"

පසුගිය වසරේදී ද ගම වටා සුරුවම් අටක් සංවිධානාත්මකව සංචාරය කළ අයුරු සමනලි මතක් කළාය. එහෙත් ගෙන්ගෙට අනුපිළිවෙලින් යා යුතුව තිබූ එම සුරුවම සමහර අවස්ථා වලදී දුප්පත් මිනිසුන්ගේ පැල්පත්වලට කොකා පෙන්වමින් ලොකු ගෙවල් පසුකර යන්නට වූයේ ලොකු ලොකු අයට එම ගෙවල් තුළට එන්නට තිබූ නොහැකියාව නිසා නොවේදැයි සමන්මලී මරිය නෝනක්කාගෙන් විමසුවාය.

එසේම තවත් එක් සුරුවමක් ලොකු ලොකු නිවෙස් වලට පමණක් සීමා වූයේ පල්ලියේ සුවාමිටවත් නොදැනෙන පරිදි මීසම් සභා නායකයින්ගේ වුවමනාව මත නොවේදැයි ඈ ප්‍රශ්න කරද්දී මරිය නෝනක්කාට දෙවියන් සිහි විය.

එපමණක්ද නැත. වලව්වේ කුමාරි හාමිලාගේ හා අල්ලපු වත්තේ සෙල්ලයියාගේ පරම්පරා අතර කාලාන්තරයක් තිස්සේ කෙළවරක් නොවු ඉඩම් ආරවුල තාමත් එසේ පවතිද්දී ගිය වසරේ සුරුවම ගෙන ආ විටදි කුමාරි හාමිලාගේ වලව්වට සෙල්ලයියා සහභාගි වූයේ එම විරසකය සමතයකට පත් කරන්නට පිළියමක් ලෙස වුවත් කුමාරි හාමිලා ඔහුව ගණනකට නොගෙන ආලින්දයේ තනිවම තනි වන්නට තිබූ අයුරු හරිදැයි අසමින් සමනලී මරිය නෝනා විමසද්දි යමක් මතකයට ආ විලසින් ඇය ද පිළිතුරු දුන්නාය.

අපරාදෙ කියන්න බැහැ ජාතියෙන් පිට උනත් සෙල්ලයියා හොඳ මිනිහ" මරිය නෝනක්කාද සෙල්ලයිගෙ හොඳ පවසද්දි සමන්මලි තවත් සිද්ධියක් මතකයට නැගුවේ වලව්ව කෙරෙහි තිබූ පිළිකුල නැවත ඉස්මතු කරමිනි.

"නෝන අක්කට මතකද? වලව්වට පස්සේ සුරුවම තියන්න තිබුනෙ සෙල්ලයියගෙ ගෙදර. උන් මොකද කළේ පාරෙ යන එකියකගේ අයත් බෑග් එකක දාල සුරුවම සෙල්ලයියලගෙ ගෙදරට එව්ව ඒ මිනිස්සුන්ගෙ තියෙන බැහැපත්කමට සුරුවම බාර ගත්ත. අපේ මිනිස්සු මොකද කළේ සුවාමිටවත් දැන ගන්න ඉඩ නොතියා වලව් කාරයෝ ආරක්‍ෂා කළා.

තව තවත් කථා කරන්නට මරිය නෝන අක්කාට පුලුවන් කමක් නැත. ඈ උත්සාහ කළේ කෙසේ හෝ මේ මර උගුලින් පැන යාමටය.

"පිට ගෑනියෙක් උනාට මමත් හොඳ තෙම්පරාදු කතෝලික ගෑනියෙක්. අපේ මීසමේ නම් සුරුවම ගෙන ගිය අවුරුද්දක ජම්මාන්ත වෛරක්කාර පවුල් දෙකක් කිරියි පැණියි වාගෙ එකමුතු උනා."

"ඒ මනුස්සයොන්. අපේ උන්ට කොහෙද මනුස්සකමක්. සත්ව කරුණාවක්. "සල්ලි කොහෙද? එතැන තමයි දෙවියෝ."

"සුරුවම මෙදා පාර අපේ ගෙදරින් පටන් ගන්නව කීව්වම මගේ ඇඟ සීතල උනා."

"ඒ මොකක්ද බං ඒ හරුපෙ."

"මේ අවුරුද්දෙත් ගිය පාර වාගෙ සංග්‍රහය එහෙම තියෙනවයැ."

"නැතිව නැතිව. අවුරුද්දකට සැරයයිනේ බං අහල පහල උන් එකතු වෙන්නෙ. ඈ මොහොතක් නිහඬව මරිය නෝනා දෙස බලා සිටියාය.

"ගිය අවුරුද්දෙ සුරුවම අපේ ගෙදරට වැඩමවන දවසෙ හාල් ඇටයක්, මිරිස් කරලක් නෙමි පොල් අඩලයක්වත් තිබ්බෙ නැහැ. කෙලිගෙ කරාබු දෙක උකස් කරල තමයි නෝනි අක්කෙ මම ආපු අයට සංග්‍රහ කළේ ලජ්ජාවෙන් බේරෙන්න.

"උඹ මේ කියන්නෙ මෙදා පාර ඒ සංග්‍රහය නවත්තමු කියලද. කොහොමද ඒක නවත්තන්නෙ. මිනිස්සු සර්දාවෙන් කරන එකනේ."

"මම දන්න සමහර මීසම් වල නම් ඔය මළ විකාර නැහැ. ඇල් වතුර විතරයි."

"උඹ ඔය කතා කරන්නේ මුකුත් දන්නෙ නැතිව. දැන ගනින් උඹයි මමයි දෙන්නම ඉන්නෙ ලොකු මීසමකයි කියල."

තවත් විස්තර කිරීම ගඟට ඉනි කැපීමක් පමණක්ම බව තේරුම් ගත් සමනලී කිසිත් නොදොඩාම ඉඳි කඩුල්ල පනින මරිය නෝනක්කා පසු පස ගොස් ඇය අස්වැසුවාය.

"නෝනක්කෙ, මේක හොඳට අසා ගනින් අපිට තවත් බැහැ ලජ්ජාව වහගෙන දස අතේ ණය වෙන්න. ඔය සුරුවම අපේ ගෙදරට නොදුන්නාට අපි තරහ වෙන්නෙ නැහැ."

"බයිබල් කාරයෝ. ඕකම තමයි බොලාට ඔහොම වෙලා තියෙන්නෙ. කිසිම විශ්වාසයක් නැති මහ ලොකු ආගම් කාරයෝ."

මරිය නෝනක්කා යන්නට ගියේ හතර වටේටම ඇසෙන්නට සමනලීට දොස් පවරමිනි.

කිසිවක් කියා ගත නොහැකි වූ සමනලි ආලින්දයෙන් මැද සාලයට පිවිසියේ දැඩි වේදනාවකින් තෙරපෙමිනි. බිත්තියේ සවි කොට තිබූ දේව මාතාවන්ගේ පිළිරුව නෙත ගැටුනු ඈ මොහොතකින් ඊට අවදි වූවාය.

තමා තුළ කිසි විටක අවිශ්වාසයක් දෙවියන් කෙරෙහි නොමැති බව ඈ හොඳාකාරවම දන්නීය. තම පවුල මේ වන තුරු ඉදිරියට ගෙන ආ දෙවිඳුන් හැම විටම තමාත් සමගම බව ඈ තරයේ විශ්වාස කළාය.

නො දැනුවත්වම ඈ දෙව්මව් පා මුල වැඳ වැටුනේ දෙනෙතින් ගලා යන කඳුලු ධාරාවන් පිස දමමිනි "ඔබයි අපේ අම්මා සදහටම ඔබයි අපේ අම්මා" කීප විටක්ම හදවතින් කෑ මොර දුන් සමනලි ජපමාලය අතට ගත්තේ සදා ගැළවීම හා සැනසීම ලැබෙන්නේ ජපමාලය තුළින්ම පමණක් බව තරයෙ විශ්වාස කරන හෙයිනි.

---

ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 297

## යලිත් සුදත් සුරිඳුන් අරබයා

"දැනගැන්මේ ආලෝකයෙනි වඩිනු" යයි හඬගා ගයාවත් සන්ධිත සුදත් සුදුතුම් වදන් තේරුම් ගනිමු. පළමුව අප නතර කළ යුතු වන්නේ ලතින් ස්ප්‍රීතු සාන්තුට නැති හල් න යන්නක් ඇමීමත් සංස්කෘත ශුද්ධ වචනයේ ඇති හල් ද යන්න හැළීමත්ය.

විශේෂණ රැසකින් රත, නිල, මිහිර, අඳුර, ගැඹුර, නපුර ලෙස නාම පද සෑදේ. ඇහේ සුද කොකාගේ සුද, සක් සුදක් ලෙස ඇති සුද සන්ධිගත වී මේදී සුදු විය යුතුය. රත්+උපුල්, නිල්+උපුල්, අඳුරු+ඉ=ඇඳිරි බලන්න. සුදත් සුදුතුම් පදනම සුද නාම පදය නොව සුදු විශේෂණයයි.

අපි සංස්කෘත වචන බහුලව භාවිත කරමු. එහෙත් ඒවා ශුද්ධ සිංහලට බිඳ ගැනෙන්නේ පාලි වචනයෙනි.

| සංස්කෘත | පාලි | සිංහල |
|---|---|---|
| උත්තම | උත්තම | උතුම් |
| ආත්ම | අත්ත | අත් |
| අනාත්ම | අනත්ත | අනත් |
| මනුෂ්‍යාත්ම | මනුස්සත්ත | මිනිසත් |
| ස්වර්ග | සග්ග | සග |
| කල්ප | කප්ප | කප |
| ග්‍රීෂ්ම | ගිම්හාන | ගිම්/ ගිමන් |
| වර්ෂා | වස්ස | වැස්ස |
| වර්ෂ | වස්ස | වස |
| දරිද්‍ර | දළිද්ද | දිළිඳු |
| වෘක්ෂ | රුක්ඛ | රුක |
| ඥාන | ඤාණ | නැණ |
| ශ්‍රාවස්ති | සාවත්ථි | සැවැත් |
| කාශ්‍යප | කස්සප | කසුප් |
| ද්‍රවිඩ | දමිළ | දෙමළ |

මා සතු ක්‍රිස්තියානි ගීතිකා පොතක ගීතිකා 607 කි. මෙහි කොහිවත් ශුද්ධාත්ම, සුද්දාත්ම, සුදත් මිස වෙන කිසි නමකින් සුදත්හු නොනැමදෙති.

යොර්දාන්හිදී අහස් ඇරී - වැඩිසේක සුදත් දෙව්
අප සිත් පුබුදු කරන් සුද්දාත්ම දෙව්ඳුනි දැන්
පිය පුත් සුදත් දෙව් හට - වේවා පසස් සදාකල්ම

---

## නෝමන් පළිහවඩනට දෙව්මැඳුර පිටුව බාරයි

උපාලි පුවත්පත් ආයතනයෙ මාධ්‍ය උපදේශක ප්‍රවීන මාධ්‍යවේදී නෝමන් පලිහවඩන දිවයින පුවත්පතේ "දෙව්මැඳුර" කිතුනු පිටුවේ සංස්කාරක වරයා ලෙස පත්ව සිටී.

ඥානාර්ථ ප්‍රදීපය පත්‍රයෙන් බිහිවු මාධ්‍යවේදින් අතර නෝමන් පලිහවඩන ප්‍රමුඛස්ථානය ගනී. 'දෙව්මැඳුර' පිටුව තුළින් නව විශේෂාංග බිහි කිරීම ඔහුගේ අරමුණ වී ඇත. මේ අනුව මීසම් සේවක පියතුමන් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම ඔහුගේ බලාපොරොත්තුවයි. සෑම දෙව්මැඳුරක ගීතිකා කණ්ඩායම්වලට සුවිශේෂි තැනක් ලබාදීමටද ඔහුගේ ඉලක්කය වී ඇත. නෝමන්ට ප්‍රදීපය සුපැතුම් !

හෙන්රි ප්‍රියශාන්ත මෙන්දිස්

ලොව විහිදුණු කතෝලික හඬ

විශ්ව සභාව

ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

# දයාවේ වසරේ නිල ලාංඡනය එළිදකී




**දයාවේ ශුද්ධ වූ වසරේ නිල ලාංඡනය, යාච්ඤාව ඇතුළු ඒ පිළිබඳ සියලු තොරතුරු වතිකානය මගින් අනාවරණය කර ඇත.**

2015 දෙසැම්බර් 8 වැනිදා ආරම්භ වී 2016 නොවැම්බර් 20 දා ක්‍රිස්තු රාජ මංගල්‍යයෙන් මේ විශේෂ ජුබිලි වසර නිමාවට පත්වේ. 'පියාණන් මෙන් දයාබරිත' යන්න මේ වසරේ තේමාවයි.

මේ නිමිත්තෙන් වතිකානයේ පැවැති පුවත්පත් සාකච්ඡාවේදී නව ධර්මදානය ප්‍රචලිත කිරීමේ සසුන් පිය කොමිසමේ සභාපති අතිඋතුම් රිනෝ ෆිසිචෙල්ලා අගරදගුරු හිමිපාණෝ ජුබිලි වසරේ ඒ ඒ අංශයන් සඳහා වෙන්වූ ජුබිලි මංගල දිනයන් ඇතුළත් වාර්ෂික කාල සටහනද ප්‍රකාශයට පත්කළහ. මේ ජුබිලි වසර 'සැබෑ වන්දනා ගමනක් දෙපයින් යන වන්දනා කරුවකු සේ ජනතාවගේ සැබෑ අවශ්‍යතා සඳහා ශක්තිමත් විසඳුම් ලබාදෙන්නට සැදී පැහැදෙන්නැයි ඇරියුම් කළේය.

අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා 'දයාවේ මුහුණුවර' මැයෙන් ලේඛනයක් ශුද්ධවූ වසර නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා ලියා ඇති අතර වසරේ නිල දිනයන්ද අගරදගුරු හිමි ප්‍රකාශයට පත් කළේය. 2016 වසර සඳහා පෞද්ගලික ජුබිලි උත්සව දුසිමකට වඩා යොදාගෙන ඇති අතර පැවිදි අය සඳහා පෙබරවාරි 2 දා පැවිදි වසර නිමාකරන්නට යොදා ගැනේ. රෝම ක්‍යුරියාව සඳහා පෙබරවාරි 22 දා, දේව දයාව සඳහා අධ්‍යාත්මිකව කැපවූ අය සඳහා අප්‍රේල් 3 ට යෙදෙන දේව දයාවේ ඉරුදිනද යොදා ගැනේ. යෞවනයන්, තේවාචාර්ය තුමන්, පූජකතුමන් රෝගී හා ආබාධිතයන් හා දහම් ගුරුවරුන් සඳහා වෙනම දිනයන් වෙන්කර තිබේ. කම්කරුවන් සහ දයාවේ ස්වේච්ඡා සේවකයන් සඳහා භාග්‍යවන්ත කල්කටාහි තෙරේසා තුමියගෙ මංගල්‍ය දින වන සැප්තැම්බර් 05 වැනිදා ද බන්ධනාගාර ගතවූවන් සඳහා නොවැම්බර් 6 වැනිදා ද ජුබිලි දින යොදා ඇත.

අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමාට සිරකරුවන් සමග බන්ධනාගාරයේදී පමණක් නොව වතිකානයේ සාන්ත පීතර බැසිලිකාවේදීද ජුබිලිය සමරන්නට අවශ්‍ය වී ඇති බැවින් සසුන් පිය කොමිසම රජයේ බලධාරීන් සමග මේ සඳහා අදාල කටයුතු පිළියෙළ කරගන්නට කටයුතු කරමින් සිටී. කෙසේවෙතත් එවැන්නක් සඳහා අවකාශ ලැබේ දැයි යන්න දැන්ම සහතික ලෙස ප්‍රකාශ කළ නොහැකි යැයි අගරදගුරු හිමි කියයි.

මේ අතර දේව දයාවේ ජුබිලි වසරේ නිල ලාංඡනය ජේසු නිකායික ගරු මාර්කෝ රුපිනික් පියතුමා නිර්මාණය කර තිබේ. මේ අතර සසුන් කොමිසම එක්සත් බයිබල් සංගම් සමග එක්වී ශුද්ධවර මාක් තුමාගේ සුවිශේෂය පොත් දස ලක්ෂයක් වන්දනාකරුවන් අතර බෙදා දීමට දායක විය. භාෂා 7 කින් මේ සුපුවත සම්පාදනය වී තිබිණ.

# ශුද්ධවූ දේශයෙන් සාන්තුවරියන් දෙනමක්!



සා. මාරි අල්පෝන්සයින් ගට්ටාස් මුනිතුමිය



කුරුසියේ ඇණ ගැසූ ජේසු තුමන්ගේ සා.මරියා මුනිතුමිය

**සාන්ත මාරි අල්පෝන්සයින් ගට්ටාස් සහ කුරුසියේ ජේස්තුමන්ගේ සාන්ත මරියා නම්වූ ශුද්ධ වූ දේශයෙන් බිහිවූ නව සාන්තුවරියන් දෙනම ඉකුත් ඉරිදා වතිකානයේදී සාන්තුවරයට එසැවිණ. ජෝර්දානයේ ලතින් ප්‍රේතියාක් අනුනායක හිමිගේ ප්‍රධානත්වයෙන් ජපමාල සොයුරියන්ගේ පාසලේ දී විශේෂ උත්සවයක්ද පැවැත්විණ. තුන් දහසකට අධික සැදැහැවතුන් පිරිසක් ඊට එක්වී සිටියහ.**

භාග්‍යවන්ත මාරි අල්පෝන්සයින් ගට්ටාස් 1843 ඔක්තෝබර් 4 පලස්තීන ඔටෝමාන් සම්භවයකින් උපත ලැබුවාය. පලස්තීනයේ මුල්ම පැවිදි නිකාය වන ජෙරුසලමේ අති ශුද්ධ වූ ජපමාල නිකායේ නිර්මාතෘ වරිය වන එතුමිය සිය මුළු දිවියම පලස්තීනයේ දිළිඳුන් උදෙසා කැප කළාය. 14 වැනි වියේදී දර්ශනය වූ සා. ජෝශප් මුනි නිකායට එක්වී 1862 පොරොන්දු දීමෙන් පසු බෙත්ලෙහෙමේ ධර්මෝපදේශය උගැන්වූවාය. එහිදී කීප වරක් දේව මාතාවන් දර්ශනය වීමට වරම් ලද්දීය. ගරු ජෝශප් ටැන්නායුස් පියතුමා සමග ජෙරුසලම් ජපමාල නිකාය පිහිටුවීමට රෝමයේ අවසර ඇතිව සිය නිකාය හැර දමා නව නිකාය ඇරැඹුවාය. 1927 මාර්තු 25 වැනිදා සගසුව දිනූ ඇය අතිඋතුම් සොළොස්වන බෙනඩික්ට් සසුන් පියාණන් විසින් 2009 නොවැම්බර් 22 වැනිදා භාග්‍යවරයට එසවිය. එතුමියගේ නිකාය මැදපෙරදිග රටවල පාසල්, ධර්මෝපදේශය වැඩසටහන්, සායන හා අනාථ නිවාස ආරම්භ කර පවත්වාගෙන යන්නීය.

කුරුසියේ ඇණ ගැසූ ජේසු තුමන්ගේ මරියා නම් සාන්තුවරිය 1846 ජනවාරි 5 වැනිදා දකුණු සිරියාවේදී උපත ලැබුවාය. පවුලේ 13 වැනි දරුවා මෙන්ම එකම දියණිය වූ ඇයගේ එකම සහෝදරයකුවත් උපතින් පසු වැඩිකල් ජීවත් වූයේ නැත. මේ නිසා ඇගේ දෙමාපියන් කි. මී 70 ක් දුර බෙත්ලෙහෙමට පයින් ඇවිද ගොස් වූ බාරයකින් පසු ඇය උපත ලැබුවාය. ඇයට බාල සොයුරකුද පවුලට එක්විය. 1848 දී දෙමාපියන් හදිසියේ මිය යාමෙන් දරු දෙදෙනාව ඥාතින් විසින් හදාවඩා ගන්නා ලදී. සිය සහෝදරයාව ඉන්පසු කිසි දිනක එතුමිය නොදුටුවාය. දැඩි ආගමික නැඹුරුතාවයකින් හැදී වැඩුණු ඇය අවුරුදු පහේ සිට උපවාස ශීලය ආරක්ෂා කළාය.

පසු කලෙක කාන්තාරයේ කාර්මෙල් පැවිදිවරය තුළින් යැදුමට බර දිවියක් ගත කළ එතුමියගේ සිරුරේ වණ කැළැල් ඇතිවී ඒවායින් ලේ ගලන්නට විය. 1878 අගෝස්තු 26 වැනිදා බෙත්ලෙහෙමේදී සගසුව දිනුවේ පිලිකාවකිනි. 1983 නොවැම්බර් 13 වැනිදා සාන්ත දෙවැනි ජුවාම් පාවුළු හිමිපාණන් විසින් භාග්‍යවරයට ඔසොවන ලදී.

# අතිඋතුම් ඔස්කා රොමේරෝ අගරදගුරු හිමි භාග්‍යවරයට එසවේ



**වර්ෂ 1980 මාර්තු 24 වැනිදා දිව්‍ය පූජාව පවත්වමින් සිටියදී වෙඩිතබා ඝාතනය කළ එල්සැල්වදෝරයේ අගරදගුරු අතිඋතුම් ඔස්කා රොමේරෝ හිමිපාණන් මැයි 23 වැනිදා එරටදී භාග්‍යවරයට එසවීමේ මෙහෙයට සැදැහැවතුන් 260,000 ක් සහභාගි වෙතැයි අපේක්ෂා කැරේ.**

1979 සිට ඇරැඹි එරට සිවිල් යුද්ධය හේතුකොටගෙන 70,000 කට අධික පිරිසක් ඝාතනය වූ අතර දිව්‍ය පූජාව පවත්වමින් අතිඋතුම් ඔස්කා රොමේරෝ අගරදගුරු හිමිපාණන් ඉල්ලා සිටියේ භීෂණය සහ ප්‍රචණ්ඩත්වය නතර කරන ලෙසත්, සිවිල් ජනතාව අමු අමුවේ මරා දැමීම නතර කරන ලෙසත්ය.

එදින පෙ.ව. 10 ට භාග්‍යවරයට එසවීමේ මෙහෙය පැවැත්වෙන අතර අල්තාරයෙ අගරදගුරු හිමිපාණන්ට වෙඩි වැදුණු මොහොතේ හැඳ සිටි කමිසයේ කොටසක් ශුද්ධ වස්තුවක් ලෙස තබනු ඇත. එහි උන්වහන්සේගේ රුධිරය තැවරුණ කොටස්ද ඇතැයි සංවිධායකයෝ පවසති. මේ භූමියේ විශේෂ අමුත්තන්ගේ පරිශ්‍රයේ දිළින්දන් අඳ ගොවීන්, ස්වදේශික ජනතාව ආදී රොමේරෝ හිමිපාණන්ගේ වෙසෙස් සැලකිල්ලට හා ආදරයට පාත්‍ර වූ කොටස් සඳහා වෙන්කැරේ.

මේ අතර එරට කතෝලික රූපවාහිනිය මේ උලෙළ සජීවී ලෙස විකාශනය කරන අතර රදගුරු හිමිපානන් 200 නමක් කාදිනල් හිමිපාණන් සයනමක්, ගරු පියතුමන් 1200 ක් සහභාගි වෙතැයි අපේක්ෂා කරති. එතුමන් රත් පැහැති පූජා ඇඳුම් ඇඳ ප්‍රාණපරිත්‍යාගිවරය සංකේතවත් කරන අතර රොමේරෝ හිමිපාණන්ගේ ආදර්ශ පාඨය වූ 'සභාව සමග හැඟීම' 'සභාව සමග සිතන්නට ලෙස' පරිවර්තනය කැර තිබේ.

## අපේ කතෝලික උරුමය

# ලොව විශාලතම රෝමානු කතෝලික දෙව්මැඳුර වූ අයිවරි කෝස්ට්හි සාමයේ රැජින බැසිලිකාව

**වර්ෂ 1985 සහ 1989 අතර කාලවකවානුවේදී ඇමෙරිකාන ඩොලර් 3,000,000 වැය කරමින් ඉදිකළ සාමයේ අප ස්වාමිදූ වෙනුවෙන් කැපකළ බැසිලිකාව අයිවරි කෝස්ට් යමුස්සුක්රෝ රදගුරු වසමේ පිහිටා ඇත.**

ගිනස් වාර්තා පොතට අනුව මේ දෙව්මැඳුර ලෝකයේ විශාලතම දේවස්ථානය වන්නේය. වතිකානයේ සාන්ත පීතර බැසිලිකාව ඒ දක්වා ලොව විශාලතම දෙව්මැඳුර ලෙස නම්කර තිබේ. මේ බැසිලිකාව වර්ග මීටර් 30,000 වපසරියක් ඔස්සේ පැතිර ඇති අතර උස මීටර් 158 කි. මේ බැසිලිකාව තුළ 18,000 පිරිසකට ඉඩ ඇතත් සා. පීතර බැසිලිකාවේ 60,000 ඉඩකඩ තිබේ. මෙහි දිග මීටර් 195 වන අතර පළල මීටර් 150 කි.



මෙහි මුල්ගල 1985 අගෝස්තු 10 වැනිදා තැබූ අතර 1990 සැප්තැම්බර් 10 වැනිදා සාන්ත දෙවන ජුවාම් පාවුළු මුනිඳුන් විසින් ආසිරි ගන්වා අභිෂේක කරන ලදී. කෙසේ වෙතත් මෙය ගොඩනැගීමේ දී ජාත්‍යන්තර ලෙස තදබල කතාබහක් පැතිර ගියේ එවකට අයිවරි කෝස්ට් ජනාධිපති ෆීලික්ස් බොයිග්නි තමන් සිහිවීම සඳහා මේ බැසිලිකාව උපයෝගි කරගන්නට වෑයම් කිරීම නිසාවෙනි. කෙසේ වෙතත් රදගුරු වසමේ ආසන දෙව්මැඳුර මෙය නොවන අතර සා. අගුස්තීනු මුනිඳුන්ට කැප කළ ආසන දෙව්මැඳුරක් එම පදවියේ පවතී.



# සාමයෙන් වැළඳගැනීම....

පලස්තීන ජනාධිපති මෙහෙමුද් අබ්බාස් ඉකුත් මැයි 16 වැනිදා අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා බැහැදුටුවේය. ඊට පසුදින සසුන් පියාණන් විසින් පලස්තීන පැවිදි සොයුරියන් දෙනමක් ඇතුලු සිවුනමක් සාන්තුවරයට එසවූ අතර ඒ අවස්ථාවටද පලස්තීන රාජ්‍ය නායකයා සහභාගි විය. මේ අතර ජනාධිපතිවරයා හා සසුන් පියා අතර හමුව ඉදිරියේදී වතිකානය සහ පලස්තීනය අතර සමීප සබඳතා ගොඩනගා ගැනීමට හේතු සාධක වන බවට ජාත්‍යන්තර විචාරකයෝ විශ්වාසය පළ කරති.

ශිරාන් මෛත්‍රී

ඥානාර්ථ ප්‍රදීපය
විවිධත්වයේ කෝණමානයෙන් බලා
විශේෂාංග
ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

# අනතුරෙන් බිහිවූ වෛද්‍යවරයා





**පෙන්සිල්වේනියාවේ, ඇලෙන්ටවුන්හි, ජිම්නාස්ටික් පලස මත සිට රොබට් ලි, ඔලිම්පික් රන් පදක්කම් සිහින මැවීය.**

1983 ජූලි මස හතරවන දින ඔහුගේ දහඅටවන උපන් දිනයට දින දෙකකට පෙර අවාසනාවන්ත නිමේෂයක දී එය සිදුවිය.

ලොස් ඇන්ජලිස් හි ඔලිම්පික් තරගාවලියට වසරකට පෙර සිටම ඔහු ඉතාමත් වෙහෙසකර ජිම්නාස්ටික් ඉරියව්වල පුහුණු විය.

නමුත් එදින සන්ධ්‍යා භාගයේදී ඔහුගේ පිම්ම වැරදී ගියේ ය. ඔහුගේ නිකට පොළොවෙහි ගැටෙමින් ඔහු බිම ඇද වැටුණේ ය.

“ටොන් ගණනක බරක් කවුරු හරි මගේ ඇඟට අත්හැරලා දැම්මා වාගෙයි මට දැනුනෙ... ඔලුවෙ රිදිල්ල ඉවසගන්න බැරිව ගියා. මගේ ඇඟ කොහෙද තියෙන්නෙ කියල මට තේරුනේ නැහැ” ලී සිහිපත් කළේ ය.

කොඳු ඇට පෙළේ හත් තැනකින් ඔහුගේ ස්නායු රැහැන් වලට ආබාධ වී තිබුණි. අනතුර නිසා ඔහුගේ අත් පා අප්‍රාණික වීම නිසා පුනරුත්ථාපනය සඳහා යොමු විය.

එම සිදුවීමට පෙර රොබට් ලී, තම පියා, මව, සහෝදරයා සහ සහෝදරිය සමඟ දකුණු කොරියාවේ සිට එහි පැමිණියේ ය.

“මගේ දෙමාපියන්ට වුවමනා වුණා ඇමෙරිකාවේ දී වඩාත් සෞභාග්‍යසම්පන්න ජීවිතයක්. නමුත් එය අසීරු වුණා” ඔහු පැවසීය.

සෝල් හි වඩාත් ඉඩකඩ සහිත නිවසක ජීවත් වූවත්, නිව්යෝක්හි ජීවත් වීමට සිදුවූයේ එක් නිදන කාමරයක් පමණක් ඇති නිවාස කොටසකය.

ඖෂධවේදියකු වූ ලීගේ පියාට ඇමරිකාවේ දී ඒ සඳහා අවසර ගැනීමට නොහැකි විය. එහිදී ඔහුට ලබා ගැනීමට හැකි වූයේ රෝහලක පොළොව සේදීමේ කටයුත්තක් ය. නිවසේ නැවතී දරුවන් බලා කියා ගත් මවට අසළ කම්හලක සේවයට යෑමට සිදුවිය. ලී ඉංග්‍රීසි නොදත්තේ ය.

මව් භාෂාවෙන් වඩාත් හඬ නගා කතා කළහොත් අනික් දරුවන් එය වටහාගනී වී යැයි ඔහු සිතුවේ ය.

බත්, කුඩා කරවල කැබැල්ලක්, කුළු බඩු යෙදූ එළවලුවක් සහිත මව විසින් සකස්කර දුන් දවල් කෑම වේල විවෘත කළ විට, පංතියේ සගයෝ එයට එබී “මොනවද ඔහු කන්නෙ” ඇසූහ.

එහි ජීවිතයට ගැලපීම සඳහා නොඉවසිලිමත් වූ ලී සෑම දිනකම නිවසට ගොස්, තමන්ට වටහා ගැනීමට නොහැකි වූ වචනවල අර්ථය ශබ්ද කෝෂය බලා ලියා ගත්තේ ය.

ඔහු ඇමරිකාන ලේබල් සහිත ඇඳුම් මිලදී ගත්තේ ය. නමුත් තමන් පිටස්තරයකු යන හැඟීම ඔහුට නැති නොවීය.

“මොකක් දෝ මහා හිස්කමක් මගෙ ඇතුළෙ තිබුණා. ඒක පුරව ගන්න මොකක් කරන්න ඕනද කියල මට තේරුනේ නැහැ” ඔහු සිහිපත් කළේ ය.

1976 ග්‍රීෂ්ම සෘතුවේ එක් දිනක ඔහු තම පවුලේ කුඩා රූපවාහිනි යන්ත්‍රයෙන් මොන්ට්‍රියල්හි ඔලිම්පික් තරගය නරඹමින් සිටියේ ය. ලී ගේ පැනයට පිළිතුරු ලැබුණි.

රෝම ජිම්නාස්ටික් ක්‍රීඩක, නාදියා කොමන්සි පදක්කම් හතක් දිනා ගන්නා විට ලී මෙසේ සිතුවේ ය. “මම මේ රන් පදක්කම් ඔක්කොම දිනා ගන්න ඕනෙ. එතකොට මට හිරිහැර කරන අනිත් අය තේරුම් ගනීවි මමත් ප්‍රෞඪ දකුණු කොරියානුවකු බව”

එවැනි හැඟීම්වලින් යුතුව තරුණ ක්‍රිස්තියානි ආයතනයේ දොරටුව අබියස සිටි ලී, ජිම්නාස්ටික් පුහුණුව සඳහා දොරටුව විවෘත කර එයට ඇතුලු විය.

“මුල ඉඳලම ඒ සඳහා මගෙ ලොකු ආශාවක් තිබුණා” ඔහු පැවසීය.

ඔහු තම පාඩම් කටයුතු වලින් ඉතිරි කරගත් කාලයෙන් වැඩි වේලාවක් තම පුහුණු කටයුතු සඳහා යෙදවීය. ඔහු තම නිවස අසළ වූ තණ පිට්ටනියේ ද තම පුහුණුවීම් කටයුතු සිදුකළේ ය.

වයස අවුරුදු පහළොවේදී ලීට, පෙන්සිලිනියාවෙහි, ඇලන්ටවුන්හි ඔලිම්පික් පුහුණු මධ්‍යස්ථානයට ඇතුලුවීමට හැකිවිය. එහි නොයන ලෙස ඔහුගේ දෙමාපියෝ ඔහුට බලකර සිටියහ.

ඔහු ඔවුන්ගේ වැඩිමල් පුත්‍රයා ය. එනිසා ඔහුගේ යුතුකම වන්නේ අධ්‍යාපන කටයුතු දිගටම සිදුකර විශ්ව විද්‍යාලයට ඇතුලුවීමය. “ඔයා ලාබාල හැඟීම් වලින් පෙලෙන්නෙ” පියා පැවසීය.

නමුත් ලී ව නතර කිරීමට නොහැකි විය. අසූවේ මුල් කාලයේ ඔහු ඇමරිකාවේ ජාතික කණිෂ්ට රන් පදක්කම් දෙකක් දිනා ගත්තේ ය. ලී දරුණු අනතුරට ලක් වූ දිනයේ ම 1984 ඔලිම්පික් තරගයට සහභාගි වීමට නියමිත දකුණු කොරියානු කණ්ඩායමට ලී නම් කෙරුණි.

අනතුරෙන් පසුව රොබට් ලී ව, ලිග්වැලි ආරෝග්‍ය ශාලාවට ප්‍රතිකාර සඳහා ගෙන යන ලදි. ඔහුගේ සිරුර පුරාම විවිධ නල සවිකර තිබුණ අතර වෛද්‍යවරු පිරිසක් ම ඔහු වටකරගෙන සිටියහ. ඔහුට සිහිය ලැබුන එක් අවස්ථාවක සාත්තු සේවකයකු, ඔහු ඇඳ සිටි, ඔහු වඩාත්ම ආශා කළ ජිම්නාස්ටික් ඇඳුම කපන විට “අනේ ඒක කරන්න එපා” යනුවෙන් අයැද සිටි අන්දම ඔහුට මතකය.

“මගේ හිතේ තවමත් ලොකු ඔලිම්පික් සිහිනයක් තියෙනවා. ඒක නැතිවෙලා නැහැ” ඔහු පවසයි.

පැය කීපයකට පසු ඔහුගේ නිවසේ අය ඔහු බැලීමට රෝහලට පැමිණියහ. මව සහ සොහොයුරිය ඔහු දැක කඳුළු සැලූහ.

“මේක වුණේ ඔයා, ඔයාගෙ දෙමාපියන්ට කීකරු නොවුන නිසා” තමන් දෙස බලමින් තම පියා පැවසූ වදන් ලී ට කිසිම දිනක අමතක කිරීමට නොහැක. තවත් මාස තුනක්ම ඔහු රෝහලෙහි ගත කළේ ය.

“ඔවුන් මාව ඔබල තද කරල, ඔවුන්ගෙ භාෂාවෙන් කතා කරල යනවා. මට තේරුනේ මගේ ශරීරය පර්යේෂණාගාරයක් වගේය කියලයි” ලී සිහිකරයි.

ඔහුගේ කෝපය සහ බලාපොරොත්තු සුන් වීම වෛද්‍ය ක්ෂේත්‍රය කෙරෙහි ඔහු තුළ ඇල්මක් ඇති කළේ ය. “මම සිතුවා කවදාහරි දවසක, මිනිස්සු තුළ බලාපොරොත්තු ඇති කරන වෛද්‍යවරයකු වෙනවා කියලා” ඔහු රෝහලෙන් බැහැර වීමට මොහොතකට පෙර අවසානයේ වෛද්‍යවරු එම දරුණු පුවත ඔහු වෙත දැන්වූහ. ඒ අනතුර ඔහුව පක්ෂගාත තත්ත්වයට පත්කර ඇති බවය.

“මගේ ඔලිම්පික් සිහිනය එදා නිමාවට පත්වුණා. මගේ ජීවිතයට මා ලබා දී තිබුණ අරුත නැතිවුණා” ලී පැවසීය. ඊළඟ වසරේ ඔහු මැන්හැටන් ෆේම් රස්ක් ආයතනයහි පුනරුත්ථාපන වෛද්‍ය කටයුතු සඳහා ගත කළේය. ඔහු එයට වෛර කළේ ය. . “මගේ මැණික් කටුවෙහි කිලෝ එකක බරක් සවිකරල මට අභ්‍යාස කරන්න සිදුවුණා. ඔලිම්පික් පුහුණුව වෙනුවට” ඔහු පැවසීය.

නමුත් මෙම වෙහෙසකර අභ්‍යාසවලින් පසුව ඔහුට ඔහුගේ අත ස්වල්පයක් සෙලවීමට හැකි විය.

ඔහු අතෙහි පෑනක් රඳවාගෙන ලිවීමට පුහුණුව ලැබීය. ඔහුගේ පුහුණුකරුවකු ඔහු සමඟ මැන්හැටන්හි මිනිසුන්ගෙන් පිරුණු බස් වලට නැගීම සහ බැසීම පුහුණු කළේය. අවසාන අවස්ථාවෙහි ඒ සියලු කටයුතු ඔහුට තනිවම කර ගැනීමට හැකි විය.

1984 ග්‍රීෂ්මයෙහි ඔහු තම දෙමාපියන්ගේ නිවසේ සිට ඔලිම්පික් ක්‍රීඩා රූපවාහිනියෙන් නරඹමින් සිටියේ ය.

“මෙන්න මගේ පවුලේ වැඩිමහල් පුතා, මගේ පවුලේ නම ගෙනයාමට සිටි. බිඳුන ජයග්‍රහණයකුත් සමඟ සිය රෝද පුටුවට වී...” මගේ තාත්තා ඔහුගේ බලාපොරොත්තු සුන්වීම වචනවලින් කිව්වෙ නැහැ. නමුත් මට ඒක තේරුණා.” ඔහු පැවසීය.

එම වසර අවසානයේ ලී නිව්යෝර්ක් විශ්ව විද්‍යාලයට ඇතුලු විය. බිම ඇද නොවැටී තම රෝද පුටුවේ සිට බසයට ඇතුලුවීම වැනි විවිධ අභියෝගයන්ට මුහුණ දීමට ඔහුට දිනපතා සිදුවිය.

“බස් මගීන්ට නම් ඒක හරිම විහිළුවක් වුණා. නමුත් සමහර මගීන් නම් ඒක අමුත්තක් කියලා සැලකුවෙ නැහැ” ඔහු සිනහවෙමින් පැවසීය. “ඔබ මේක කොහොමද කරන්නෙ? රෝද පුටුවක ඉඳගෙන කොහොමද කරන්නෙ?” අවසාන වර්ෂයේ සිටි ලී වෛද්‍ය විද්‍යාලයට නිර්දේශ කිරීම පීඨාධිපති විසින් ප්‍රතික්ෂේප කළ අවස්ථාවේ නම් ලීට අමුත්තක් දැනුණි.

කොලොම්බියා විශ්ව විද්‍යාලයට ඇතුලු වී මහජන සෞඛ්‍ය පිළිබඳ හැදෑරීමට ඔහු තීරණය කළේ ය. නමුත් ඔහුගේ සහෝදර සිසුන් පැවසුවේ වෛද්‍ය විද්‍යාව අත් නොහරින ලෙසය.

මේ නිසා 1993 ඩර්ට් මවුන් වෛද්‍ය විදුහලට ඉල්ලුම් කළ අතර ඔහුගේ ඉල්ලීම පිළිගැනුණු හෙයින් එහි රෝද පුටුවකින් ඉගෙන ගත් පළමු සිසුවා බවට ඔහු පත්විය.

1990 මැද භාගයේ ඔහුගේ දෙමාපියන් නැවතත් දකුණු කොරියාවට ගියහ. මෙ නිසා 2001 ඔහු උපාධි ලබන උත්සවයට පවුලේ කිසිවෙකුට සහභාගි වීමට නොහැකි විය.

“ඔවුන් නොපැමිණීම මගේ විශාල බලාපොරොත්තු සුන්වීමක්. ඒ දවස උදාකරගන්න මම හරියට මහන්සි වුණා” ලී පැවසීය.

තමන් භෞතික පුනරුත්ථාපන ක්ෂේත්‍රයෙහි නිරත බව ලී දනිතත් රෝගීන්ගේ ප්‍රතිචාරය කෙසේවිය හැකි දැයි ඔහුට සිතා ගැනීමට නොහැකි විය. ලී, ජෝන් හොප්කින්ස් වෛද්‍ය විද්‍යාලයේ අනේවාසික සේවය කරද්දී, ඔහුගේ ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයා, ස්නායු බිඳීමේ රෝගින් තුළ බලාපොරොත්තු ඇති කිරීමේදී වෙනත් වෛද්‍යවරුන්ට වඩා ලී සමත්කම් දක්වන බව දුටුවේය.

තම අනතුර සිදුවී වසර විසි දෙකකට පසු තම අනේවාසික කාලය ද 2005 දී සම්පූර්ණ කළ විට රටේ විවිධ ප්‍රදේශවලින් ඔහුට රැ කියා ආරාධනා ලැබුණත් ඔහු තෝරා ගත්තේ බැල්ටිමෝර්හි කෙනඩි කීගර් ආයතනයේ අලුතෙන් විවෘත කරන ලද ස්නායු ප්‍රතිකාර අංශය ය.

අද ලී ඇමරිකාන පුරවැසි බව ලබා ඇත. තනිව ජීවත්වන ඔහු සෑම උදෑසනකම තම රෝහල වෙත අතින් ක්‍රියාත්මක කරන මෝටර් රථයෙන් යයි.

සතියෙන් සතිය ඔහු තම වෛද්‍ය සැලසුම් දියුණු කරගනී. ස්නායු ආබාධ වලින් පෙළෙන රෝගීන් ලී හමුවේ වඩාත් විවෘත වීමට කැමැත්තක් දැක්වීය.

“මොනවහරි අවස්ථාවක් ලැබුණොත් මම එහි ප්‍රථමයා වෙනවා. මම කරන දෙය ප්‍රයෝජනවත් විදියට කරනවා. මම මගේ ජීවිතයේ දීමනාව හොයාගෙන තියෙනවා” දකුණු කොරියාවට ගොස් ස්නායු ආබාධ රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ඔහු බලාපොරොත්තු වෙයි.

වරක් ඔහුගේ දෙමාපියෝ ඔහු සම්මන්ත්‍රණයක දේශනයක් පවත්වනු බැලීමට දකුණු කොරියාවේ සිට පැමිණියෝ ය. එදින රාත්‍රියේ හෝටලයේ සිටියදී ලී ජීවිත කාලය පුරා බලාපොරොත්තුව සිටි වදන් ඔහුගේ පියා පැවසීය.

“මට උඹ ගැන ආඩම්බරයි පුතා”

**පීටර් කැනියුට් පෙරේරා**

## පැලේ කවිය



පිලෙන් පිලට පැන කුණු කන්දල් අදින  
දේස්පාලනය ගැන හොඳ හැටි දැන හැඳින  
කල්ගත කරන ජනතාවට නම් මෙදින  
මහතුන් වගේ සිවුපාවුන් තණ බුදින

දෙන්නම් කියා යහපාලන කල් කිරිය  
ඇතැමුන් පැමිණ යන මග පිළිගනු බැරිය  
සිටියත් කොතැන අයියෝ නරිනම් නරිය  
කපටින් කුමට හොඳ ගතිගුණ අත් හැරිය

රාළ මීගමුවේ

# රත්තරන් වෙළෙඳපොළේ
# අනිසි හැසිරීම

ශ්‍රී ලංකාවේ රත්රන් වෙළෙඳපොළ සකස් වී ඇත්තේ විශ්වාසය පදනම් කරගෙනය. ආණ්ඩුවේ මැදිහත්වීමක් ඇත්තේම නැත. අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය, බලශක්තිය ප්‍රවාහනය ඇතුළු කර්මාන්ත ව්‍යාපාර සහ සේවා යනාදිය තරගකාරීව මෙහෙයවන්නට රාජ්‍ය සහ පුද්ගලික අංශය නැඹුරු නමුත් මෙරට රන් වෙළෙඳපොළ තරගකාරීත්වය පුද්ගලික අංශයට සීමා වී තිබේ. යම් ආකාරයකට නියාමනයක් ඇත්තේ රන් භාණ්ඩ නිපදවා විකුණන වෙළෙඳුන්ට පිරිසිදු රත්රන් බලපත්‍ර ක්‍රමයකට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කිරීමේ ක්‍රියාවලියෙන් පමණකි.

පසුගියදා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය නීති ගණනාවක් පනවන ලද්දේය. පනවන ලද නියම අනුව මෙතෙක් පැවති පාරිභෝගික විශ්වාසයට අමතරව මිලදී ගන්නා රන් ආභරණයෙහි එහි ඇති බර, මිශ්‍ර රන් ප්‍රමාණය සහ නිෂ්පාදකයාගේ මුද්‍රාව පාරිභෝගිකයාට පමණක් දැක බලාගත හැකි තැනක ඔබ්බවා තැබිය යුතුය. එසේ කරන්නට නියම වන්නේ ඇයි? පිරිසිදු රන්වලින් ස්වර්ණාභරණ නිපදවා පාවිච්චි කළ නොහැකි හෙයින් මිශ්‍ර කරන අනෙක් ලෝහයක අනුපාතය දෝෂ සහිතව ඉදිරිපත් කර ගනුදෙනුකරුවන්ට වංචා කිරීම වැළැක්වීමටය. නියම ස්වර්ණාභරණ කියන නමුත්, නියම ස්වර්ණාභරන නම් ඒවා අමිශ්‍ර විය යුතුය. මිශ්‍ර කරන අනුපාතය සියයට දෙක එළිපිට ප්‍රසිද්ධ කරන නමුත් එයට අඩු රන් ප්‍රමාණයක් භාවිත කර නියම කැරට් විසිදෙක යනුවෙන් දක්වා විකිණීම වරදකි. පාරිභෝගික විශ්වාසය පළුදු කිරිමකි. ස්වර්ණාභරණ වෙළෙන්දා කියන රන් අනුපාතය පමණක් නොව එහි බර ගැන ද විශ්වාස කරන්නට මෑතක් වනතුරුම ජනතාව හුරු පුරුදු වී සිටියේය. එහෙත් රන් වෙළෙඳාමේ දී අතිවිශාල ලාභයක් ලබන්නට නම් වංචා කරන්නට සිදුවන අතර වංචනික වෙළෙඳුන්ට තමන් ගොදුරු වී ඇති බව පාරිභෝගිකයන් දැනගන්නේ හදිසි අවස්ථාවක එම රන් භාණ්ඩය අකස්කර යම් මුදලක් ණයට ගන්නට සූදානම් වූ අවස්ථාවේ දීය. බැංකු සහ මූල්‍ය ආයතන ඒවා රසායනිකව පරීක්ෂා කර බලා එහි ඇති රන් ප්‍රමාණය පමණක් නොව එහි අමුණා ඇති දිලිසෙන කෘත්‍රිම ගල් අතහැර වටිනාකම් තීන්දු කරන විට ගනුදෙනුකරු බලවත් අපහසුතාවකට පත්වෙයි. තමන් මිලදී ගන්නට වියදම් කරන ලද වටිනාකමට අඩු සහ නොසෑහෙන තක්සේරුවක් බව වැටහෙයි.

නොයෙක් උපක්‍රම යොදන රන් භාණ්ඩ නිෂ්පාදකයෝ ඒවා නිපදවන විට කියන කැරට් ගණනට වඩා සහ රන් බර නියම ලෙස ගණන් ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයට නිපදවීමෙන් වෙළෙඳපොළ වංචා කරමින් සිටින අතර පාවිච්චි කරන ලද රන් මිලදි ගැනීමේ දී වැඩ කුලිය රහිතව මිලදී ගැනීමෙන් සහ අලුත්වැඩියා කරන අවස්ථාවේ දී ශ්‍රම වියදමට වැඩිපුර මිල නියම කිරීමෙන් ගනුදෙනුකරුට විකල්පයක් නැති එකක් බවට ස්වර්ණාභරණ වෙළෙඳාම හරවාගෙන තිබේ.

රන් වෙළෙඳපොළ ඉසුරුමත් සමාජයට සීමා වූ එකක්යැ'යි සමාජය හිතන්නට හුරු වී සිටී. එය එසේ නොවේ, ඕනෑම දරු පවුලක් තමන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථාවලදී යම් ප්‍රමාණයකින් රන් භාණ්ඩ මිලදී ගැනීමට සංස්කෘතික පෙළැඹවීමක සිටියි. දරුවෙකු ඉපැදුණ, වැඩිවියට පත් සහ විවාහය යන අවස්ථාවලදී තමන්ට හැකි ආකාරයට ඉතාම සුළුවෙන් හෝ රන් සංකේත භාවිත කරන්නට ජාති ආගම් භේදයකින් තොරව හුරු වී ඇති හෙයින් මෙය සමාජයේ පැතිර ඇති ව්‍යාපාරික අවස්ථාවක් බව වටහා ගැනීම වැදගත්ය. ධනවත් සමාජයට පුළුල් මිලදී ගැනීමක දී ස්වකීය රන් ගැන යම් තක්සේරුවකට යා හැකිය. රන් භාණ්ඩ ගැන සහතිකයක් ඉල්ලා සිටින්නට හැකියාව තිබේ. එහෙත් දුප්පත් ජනතාව තම දැරියගේ කන



පළඳින කරාබු කුට්ටමක් ගන්නා විට එය අඩුම මිලක් සහ තවත් කීයක් හරි කේවල් කරන්නට උත්සාහ කරයි. සුළු වෙළෙන්දා කරන්නේ පාඩු ලබන වෙළෙඳාමක් නොවේ. මෙවැනි පසුබිමක් තුළ රත්රන් නිෂ්පාදනය සහ වෙළඳාම තද නියාමනයකට යටත් කිරීම ඉතාම වැදගත්ය. මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය නීති පැනවීම පමණක් නොව ඒවා බලාත්මක වන ආකාරයට ක්‍රියා කිරීමට ද පියවර ගත යුතුය. සෑම නගරයක් පාසාම සාමාන්‍ය ආකාරයට ආරම්භ කරන රන් භාණ්ඩ වෙළෙඳාම කෙටි කාලයක් ඇතුළත විශාල ලෙස දියුණු වන ආකාරය සහ ඒ තුළ ඇති අක්‍රමිකතා හඳුනා ගැනීම අවශ්‍යය. එපමණක් නොවේ. ඕනෑම පාරිභෝගිකයෙකුට තමන් මිලදී ගන්නා රන් ආභරණ සම්බන්ධව බර හෝ ප්‍රමිතිය සම්බන්ධ ගැටලුවක් ඇත්නම් එය ස්වර්ණාභරණ අධිකාරියට පැමිණ විමසා බලන්නට හා නීති පියවර ගැනීමට ඇති අවකාශය ගැන පුළුල් සන්නිවේදනයක් ස්වර්ණාභරණ වෙළෙඳසැල් තුළින්ම පතුරවන්නට අවශ්‍ය පියවර ගත යුතුව ඇත. රන් බඩු විකුණන සාප්පුවක එම රන් ගැන සැකයක් ඇත්නම් සොයා බලා තීරණයකට යා හැකි තැන ගැන පූර්ව දැනුම් දීමක් කරන්නට හැකිනම් යම් ප්‍රමාණයකට වංචා අඩුකර සාමාන්‍ය ජනතාවට පවතින විශ්වාසය රැකවරණයක් දක්වා තවදුරටත් තහවුරු කරගත හැකිවනු ඇත.

ඉතාම මෑතක දී මෙරට රත්රන් සම්බන්ධව දේශපාලන වේදිකාවේ දී කරන ලද ආන්දෝලනාත්මක ප්‍රකාශයක් සහ එය ප්‍රායෝගිකව ක්‍රියාවට නැගීමට අසමත්වීමත් මෙම කර්මාන්තය තුළ විමසා බැලිය යුතු පැත්තකි. ජනාධිපතිවරණය අවස්ථාවේදී පොදු අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වූ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ දේශපාලන වේදිකාවේදී රන් භාණ්ඩ උකස් කර ඇති ගනුදෙනුකරුවන්ට බැංකුවලින් පොලී සහනයක් ලබාදෙන බව සඳහන් කෙළේය. අලුත් ජනාධිපතිවරයා ජය ගැනීමෙන් පසු ඉදිරිපත් කරන ලද අතුරු අයවැය යෝජනාවලදී රුපියල් ලක්ෂ දෙකක් දක්වා උකස් කර ඇති රන් භාණ්ඩවල පොලිය කපා හැර ජනතාවට සහනයක් දෙන බව පැහැදිලිව දක්වන්නේය. මූල්‍ය පද්ධතියට බලපෑමක් වන ආකාරයට දේශපාලන වේදිකාවේ දී ජනප්‍රිය තීන්දු ප්‍රකාශයට පත් කළ හැකි නමුත් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි බව දැනෙන්නේ පැහැදිලි විග්‍රහයකට ගමන් කරන අවස්ථාවේ දීය. රන් වෙළෙඳාම පමණක් නොව රන් භාණ්ඩ උකස් කිරීමේ ව්‍යාපාරයද මෙරට වාණිජ බැංකු අතිවිශාල ආකාරයකට ලාභ උපයන අංශයක් වන අවස්ථාවක උකස් පොලිය කොතැනකින් හෝ ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව කපාහැරීම බැංකු ක්ෂේත්‍රය අර්බුදයකට යන තීරණයකි. පුද්ගලික බැංකුවලට බලපෑමක් කළ නොහැකි සහ පුද්ගලික අංශයේ රන් උකස් සේවාවලට පොලිය අඩුකරන ලෙස බල කළ නොහැකි පසුබිමක එය සෑජුව ආණ්ඩුවේ බැංකු පද්ධතිය අකර්මන්‍ය කරන යෝජනාවකි.

රජයට සම්පූර්ණ අයිතිය ඇති සහ රජයේ කොටස් හිමි පුද්ගලික බැංකු සියල්ලක්ම රන් උකස් ව්‍යාපාරයෙහි නිරතය. රන් උකස් ගැනීම වෙනුවෙන් 2013 වසරේ දී මෙරට වාණිජ බැංකු වෙන් කරන ලද මුදල රුපියල් බිලියන 292.9 දක්වා සැලකිය යුතු ප්‍රමාණයක් බව මහ බැංකුවේ දත්ත පෙන්වයි. 2011 වන විට මෙරට වාණිජ බැංකු තුළ සම්පූර්ණ ණය මෙහෙයුම්වලින් සියයට 9.3 ක් උකස් ණය ය. 2012 වසරේ දී එය සියයට 19 ක ප්‍රතිශතයක් දක්වා දෙගුණයකින් වැඩිවීමෙන් පෙන්වන්නේ දුප්පත් මහජනතාව තමන් සතු රන් භාණ්ඩ උකස් තබා මුදල් ගැනීමට දක්වා ඇති වැඩි නැඹුරුවයි. බැංකුවලින් නිකුත් කරන ලද වාර්තා අනුව සියයට අසූ පහකට වඩා වැඩි ප්‍රමාණයක් රුපියල් ලක්ෂ දෙකකට අඩු ප්‍රමාණයේ රන් භාණ්ඩ උගස් තැබූ ඒවාය. මෙම සියලුම උකස්වලින් පොලිය කපා හරින්නට සිදුවුවහොත් එය මගින් බැංකු පද්ධතියට අහිමි වන ආදායම රුපියල් බිලියන තුනක් පමණ වනු ඇත. දේශපාලනයේ දී ඡන්ද ගන්නට රන් පොලිය කපා හරින බව උකස්කරුවන්ට කියන නමුත් එය ක්‍රියාත්මක කිරිමේ දී බැංකුවලට රුපියල් බිලියන තුනක් උපයා දෙන්නට අන් මගක් නැති අවස්ථාවක මහ බැංකුව උපක්‍රමශීලිව ගනුදෙනුකරුවන් නොමග යවා තිබේ. රන් උකස් පොලී සහනය ලැබෙන්නේ සියයට දොළහකට වැඩි පොලියකට උකස් තබා ඇත්නම් පමණකි. එහි දී කරන්නේ වැඩි පොලිය වෙනුවට සියයට දොළහක පොලියක් ගෙවා රන් භාණ්ඩ බේරා ගැනීමට ඉඩදීමය. 2014 ජූනි 17 වැනිදා ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව උකස් පොලී අනුපාතිකය සියයට 12 ක මට්ටමක තබා ගන්නා ලෙස සියලුම බැංකුවලට නිල වශයෙන් දැනුම් දෙයි. එහෙම කරන්නේ ආර්ථික වර්ධනයට යම් පිටුබලයක් ලබාගැනීමේ උවමනාවෙන්ය. සාමාන්‍යයෙන් බැංකු උකස් නීතිය අනුව අවුරුද්දක් ඇතුළත රන් භාණ්ඩ බේරා නොගතහොත් හෝ පොලිය ගෙවා අලුත් නොකළහොත් ඒවා වෙන්දේසි කර බැංකුව සිය ණය අය කරගනී, 2015 ජූනි මාසයට පෙර උකස් තබන ලද බේරා නොගත් රන් උකස්කරුවන් සුළු පිරිසකට පොලී අනුපාතය සියයට දොළහක් දක්වා සහනයක් සපයන බව දැන් නිල වශයෙන් නිවේදනය කර හමාරය.

මෙයින් පෙනෙන්නේ රන් වෙළෙඳපොළ තිබිය යුතු විශ්වාසය ස්වර්ණාභරණ වෙළෙඳුන් විසින් උල්ලංඝනය කරන අතර දේශපාලන තීන්දු හෙයින් ද රන් භාණ්ඩ හිමිකරුවන්ගේ විශ්වාසය පළුදු වී ඇති බවයි. වේදිකාවේ දී දෙන පොරොන්දු සහ ඒවා ඉටු කරන්නට යෑමේ දී ඇතුළත් කරන වගන්ති හෙයින් සහනයක් නැති මිථ්‍යාවක් පමණක් ඉතිරිවීම මෙරට පුරවැසියන් අත්විඳ ඇති කාරණයකි. ඉතිහාසය පුරා සිදුවන්නේ එයයි. අද මෙරට බැංකු පද්ධතිය හරහා රන් උකස් තබා ඇති ගනුදෙනුකරුවන් පත් වී ඇති අසරණභාවයත් එයමය. ස්වර්ණාභරණ නිෂ්පාදකයන්ගේ වංචා සහ දූෂිත උපක්‍රම ගැන මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙන් සහතිකයක් ඉල්ලා සිටිය හැක. දේශපාලන වේදිකාවේ දී වංචාවලට ගොදුරු වූ උකස්කරුවන් තමන්ගේ අයිතිය වෙනුවෙන් සහතිකයක් ඉල්ලා සිටින්නේ කොතැනකින්ද?

---

ආර්ථිකය දෙස කිතුනු ඇසින්

## ආර්ථික සංග්‍රහය



ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

---



මාසික ආර්ථික විමසුම

## මෑත කාලීන සාර්ව ආර්ථික දියුණුව යහපාලනයෙන් උදාකර ගත හැකිද?

ඉදිරිපත් කිරීම ප්‍රවීන ආර්ථික විශ්ලේෂක **වින්සන් මර්වින් ප්‍රනාන්දු**

**2014 මහ බැංකු වාර්තාව නිකුත් විය. එය මහින්ද රාජපක්ෂ හිටපු ජනපතිගේ, අජිත් නිවාඩ් කබ්රාල් හිටපු අධිපතිගේ පී. බී. ජයසුන්දර හිටපු භාණ්ඩාගාරික ලේකම්ගේ ආර්ථික තීරණවල ප්‍රතිඵල රැගත් අවසාන වාර්තාව විය. එම වාර්තාව හරහා 2014 ශ්‍රී ලංකා ආර්ථිකයට කුමක් වී ද? යන්න විමසා බැලීම සහ නව රජය යටතේ ආර්ථිකය කවර මඟකට යොමුවේද? යන්න 2014 මහ බැංකු වාර්තාව ඇසුරින් විමසීමක් කිරීම මෙම ලිපියේ අරමුණයි.**

2005 බලයට පැමිණ 2010 වන විට රටේ පැවැති දැවන්ත යුද්ධයට තිත තැබීමට නායකත්වය ලබාදී 2010 දෙවැනිවර බලයට පැමිණ රටේ දැවැන්ත ආර්ථික පරිවර්තනයකට මුලපිරූ හිටපු ජනපති මහින්ද මහතාට තෙවනවර බලයට පත්වීමට ජනවරමක් ඉල්ලුවද එය ලැබුණේ නැත. 2016 වන තුරු බලයේ සිටීමට වරම් ලබා සිටි ජනපති මහින්ද 2015 ජනපති වරණයෙන් පරාජයට පත්වූයේ ඇයි ද යන්නට මේ වනවිට විවිධ අය විවිධ හේතු ඉදිරිපත් කොට ඇත. එම පරාජයට ආර්ථික හේතු, බලපෑවේ ද? යන්න විමසා බැලීමට ඔහුගේ පාලන සයේ අවසාන වර්ෂයේ ආර්ථික ක්‍රියාකාරිත්වය දැක්වෙන 2014 මහ බැංකු වාර්තාවෙන් හෙළිවන කරුණු මගින් විමසා බැලිය හැකිය. ඔහුගේ ආර්ථික වැඩ පිළිවෙළට සහය වූ ප්‍රබල චරිත දෙකක් ද ඔහු සමග ඉවත්විය. එයින් එක් චරිතයක් වූයේ 2006 මහ බැංකු අධිපති ධූරයට පත්ව 2014 දක්වා අඛණ්ඩව එම ධූරයේ කටයුතු කරමින් රටේ "මූල්‍ය ප්‍රතිපත්තිය" (Monetary Policy) මැනවින් ක්‍රියාත්මක කළ මහ බැංකුව තුළ විප්ලවීය වැඩ කොටසක් ඉටුකළ අජිත් නිවාඩ් කබ්රාල් මහතාය. දෙවැනි චරිතය වූයේ රටේ "රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය" (Fiscal Policy) මැනවින් මෙහෙය වූ මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පුංචි බණ්ඩා ජයසුන්දර මහතාය. මෙම තිදෙනාගේ සුසංයෝගයෙන් සහ ඊට සහය වූ ශ්‍රම බලකායෙන් රටේ ආර්ථිකය තුළ සිදුවූ පෙරළිය අප මීට පෙර මහබැංකුවේ වාර්ෂික වාර්තා යටතේ ලියූ ලිපිවලින් විග්‍රහ කරන ලදි. අද අපට ලියන්නට සිදුවී තිබෙන්නේ ඒ ප්‍රබල චරිත තුන නිහඬ වී තිබෙන කාලයක ඔවුන් අවසන්වරට රටට අත්කර දුන් ආර්ථික ප්‍රතිඵල විමසීමය.

රටක ආර්ථිකයක කාර්යසාධනය විග්‍රහ කිරීමේදී යොදා ගනු ලබන ප්‍රධාන විචල්‍යයන් කිහිපයකි. ආර්ථික වර්ධන වේගය (Rate of economic growth) එයින් ප්‍රධාන තැනක් ගනී. 2014 ආර්ථික වර්ධනවේගය 7.4% ක් විය. එය 2014 අපේක්ෂා කළ 7.8% ක වර්ධන වේගයට වඩා අඩු වුවද, 2013 වර්ෂයේ වාර්තා වූ 7.2% ක වර්ධනයට සාපේක්ෂව වැඩි වර්ධන වේගයක් විය. මේ අනුව යුද්ධයෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකය 6% කට වඩා වැඩි වර්ධනයක් පිට පිට පස් වතාවක් වාර්තා කරමින් (2010-2014 වසර 5 තුළ සාමාන්‍ය ආර්ථික වර්ධනය 7.4% ක්), ශ්‍රී ලංකා ආර්ථිකය දේශීය හා විදේශීය කම්පනවලට සාර්ථකව මුහුණ දීමට ඇති හැකියාව පෙන්නුම් කර ඇත.

ඉහළ ආර්ථික වර්ධන වේගය නිසා රටේ සමස්ත ආදායම (GDP) ඉහළ යයි. 2010 ඩොලර් බිලියන 50 ක් වූ ශ්‍රී ලංකාවේ සමස්ත ආදායම 2014 දී ඩොලර් බිලියන 75 ක් බවට පත්වී ආර්ථිකයේ ආදායම් 50% කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම 2010 වන විට ඩොලර් 2397 ක් වූ අතර 2014 වන විට ඩොලර් 3625 ක් බවට පත්විය. ඒ අනුව 2016 දී ඩොලර් බිලියන 100 ක ආර්ථිකයක් ඩොලර් 4000 ක ඒක පුද්ගල ආදායමක් ළඟාකර දීමේ ඉලක්කය ලබා ගැනීමටත් පෙර එම කර්තව්‍යයට අතගැසූ ප්‍රබල චරිත තුනට ගෙදර යෑමට සිදුවිය.

මේ හරහා අඩු මැදි ඒක පුද්ගල ආදායමක් ලබන රටක් ව තිබූ ශ්‍රී ලංකාව ඉහල මැදි ආදායම් රටක් බවට පත් කිරීමට කටයුතු කළ ඒ චරිතයන්ට එහි ගෞරවය හිමිකරගන්නට වරම් අහිමි විය. එහෙත් එම චරිත අතර නිහඬව සිටි තවත් ප්‍රබල චරිතයක් වූ මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන් අද ජනපති බවට පත් වී රට තුළ යහපාලනයකට මුල පුරමින් තම බලතල අඩුකර ගනිමින්, විදේශිය වශයෙන් රට තුළ යහපත් ප්‍රතිචාරයක් ගොඩනගමින්, රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ එජාපයේද සහය ලබා ගනිමින් මෙතෙක් ලබාගත් ආර්ථික ජයග්‍රහණ ඉදිරියට ගෙන යෑමට කටයුතු කිරීමට සැදී පැහැදි සිටින ආකාරයද 2014 මහ බැංකු වාර්තාවේ සංඛ්‍යාවලින් පැහැදිලි වේ. නව ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා යටතේ ද ඉහළ ආර්ථික වර්ධන වේගවත් හා ඒක පුද්ගල ආදායම ඉදිරි වර්ෂ 4 ට ලබාගැනීමට පුරෝකථනය කොට තිබෙන්නේ මෙසේය.

| වර්ෂය | වර්ධන වේගය | ඒක පුද්ගල ආදායම (ඩොලර්) |
|---|---|---|
| 2015 | 7% | 4009 |
| 2016 | 7.5% | 4469 |
| 2017 | 8.0% | 4997 |
| 2018 | 8.0% | 5624 |

මූලය මහ බැංකු වාර්ෂික වාර්තාව 2014

රටේ ආර්ථික කාර්ය සාධනය මැනීමේදී ඊළඟට වැදගත් වන්නේ "මිල ස්ථායිතාව" (Price Stability) යි. එනම් උද්ධමනය ඉතා අඩු මට්ටමකින් ස්ථාවරව පවත්වාගෙන යෑමයි. ඒ අනුව මහ බැංකු අධිපති ධූරය ඉසිළූ අජිත් නිවාඩ් කබ්රාල් මහතා 2009 මුලසිට අඛණ්ඩව වසර 6 ක් රටේ උද්ධමනය තනි මැදි ඉලක්කමකින් පවත්වාගෙන යෑමට කටයුතු යොදමින් සිටියදි, ජනපතිවරණයත් සමග එම කාර්යය අතහැර යන්නට සිදුවිය. 2009 දී 3.5% ත්, 2010 දී 6.2% ත්, 2011 දි 6.7% ත්,, 2012 දී 7.6% ත් ලෙස තනි මැදි උද්ධමන තත්ත්වය තවදුරටත් යහපත් මට්ටමකට පත්කොට 2013 දී 6.9% ත් හා 2014 දී 3.3% ක මට්ටමක් පවත්වාගෙන යෑමට සමත්විය.

එම යහපත් තත්ත්වය නව මහ බැංකු අධිපති ඇතුළු කාර්ය මණ්ඩලය යටතේ පවත්වාගෙන යෑමට පුරෝකථනය කර ඇත්තේ මෙසේය.

| වර්ෂය | උද්ධමන වේගය | වර්ෂය | උද්ධමන වේගය |
|---|---|---|---|
| 2015 | 3% | 2015 | 3% |
| 2016 | 4% | 2016 | 4% |
| 2017 | 4% | 2017 | 4% |
| 2018 | 4% | 2018 | 4% |

මේ අනුව තනි මැදි ඉලක්කමකට පත් වූ ශ්‍රී ලංකාවේ උද්ධමන වේගය ඉදිරි වර්ෂවලදී ද ඉතා අඩු මට්ටමකින් පවත්වාගෙන යෑමට පුරෝකථනය කිරීමද සුබ පණිවුඩයකි.

දසත ආලෝකය විහිදුවමින්

## දැල්වෙන පහන්

ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 24 ඉරිදා

# වසර 92 ක් පුරා සමිඳු කෙත අස්වද්දන දහම් දූතිකාව පමුණුගම ඇනීමේරි මහත්මිය

වසර 1922 සැප්තැම්බර් මස 29 වන දින පමුණුගම බෝපිටියේ සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක්ව සිටි ඩී. ඩී. නිකුලස් හා කේ. ඩී. රෝස මරියා යුවලට දාව උපන්



ඇනීමේරි මහත්මියගේ පවුලේ පිරිමි සහෝදරයන් තිදෙනෙකු හා ගැහැනු සහෝදරියන් තිදෙනෙක් විය. එතුමියගේ එක් සහෝදරයෙක් වූ ඩී. ඩී. ඇන්ඩෘ මහතා නොහොත් ඇන්ඩෘ ගුරුනාන්සේ වේයන්ගො ඩ මධ්‍යමහ විද්‍යාලයේ සම්මානනීය ජනහද ජයගත් ආචාර්ය වරයෙක් ලෙසත් පමුණුගම. බෝපිටිය හා අවට ග්‍රාමයන් හීද ප්‍රබල සමාජ සේවකයෙක් හා මහා විද්වතකු ලෙස සුප්‍රසිද්ධව සිටියේය.

පමුණුගම බෝපිටිය රෝ. ක. බාලිකා විද්‍යාලයේ දීප්තිමත් සිසු දැරියක ලෙස එවකට පැවැති ජ්‍යෙෂ්ඨ විභාගයෙන් උසස් ලෙස සමත් වී රාජ්‍ය අංශයේ උසස් රැකියාවලට යාමට අවස්ථාව තිබුණත් ගම තුළ රැඳෙමින් ගමේ විවින් පාසලේ ගුරුවරියක් ලෙස ගමේ දැරියන් සමග සැබෑ ක්‍රිස්තු චරිතයක් කුඩාකල සිටම ප්‍රදර්ශනය කරමින් සමාජය තුළ හා දහම තුළ සංවේදී වෙමින් ග්‍රාමීය නායකත්ව සංකල්පය ගොඩ නැගුවාය.

1943 වසරේ එවකට විශාල පමුණුගම මීසමේ මීසම් පාලකව සිටි ලීනස් එප් ද සිල්වා ගරු පිය යුගයේ සමස්ත පමුණුගම මීසම් ජාලයේ දහම් පාසල් වල දහම් දැනුම තරගයෙන් සියට සීයක් ලකුණු ලබා වාර්තා ගත ප්‍රථම ස්ථානය ලබාගැනීමට සමත් වූවාය. ලාබාල අවධියේ සිටම ගමේ සුභ සාධන සංවිධාන හා දෙව්මැඳුරේ දහම් සංවිධානවල රැඳෙමින් සැබෑ ක්‍රිස්තු ජීවනය ග්‍රාමය තුළත් දරු දැරියන්ගේ මනස තුළත් සංවේදී කරවීමට පෙරමුණ ගෙන ක්‍රියා කළාය.

1948 වසරේ පමුණුගම ඇලෙන්එගොඩ කීර්තිමත් රණවීර පවුලේ ඇන්ටනි පීටර් රණවීර පාඨශාලාචාර්ය මහතා හා විවාහ දිවියට ඇතුලත් වූ එතුමිය පිරිමි දරුවන් තිදෙනෙකුගේ දයාබර මාතාවකි. ඇගේ දරුවන්ටද නිසි අධ්‍යාපනය ලබා දී දහම තුළ සැබෑ ලෙසම පෝෂණය කළ එතුමියගේ වැඩිමහල් පුත්‍ර රත්නයවූ මර්වින් රණවීර මේවන විට එංගලන්තයේ ලන්ඩන් නුවර දක්ෂ විශේෂඥ වෛද්‍යවරයෙකි. එතුමියගේ දෙවැනි පුත්‍රයා වූ ගාමිණී රණවීර ද රාජ්‍ය අංශයේ උසස් තනතුරු දරමින් දහමට දෙව්මැඳුරට සමීපව කැපවූවෙකි. එතුමියගේ බාල පුත් දක්ෂ කාර්මිකයකු චන්ද්‍ර රණවීර තරුණ වියේදීම සමිඳු සෙවනේ සැතපින.

එතුමියගේ ස්වාමි පුරුෂයාවූ ඇන්ටනි පීටර් රණවීර ස්කෝල මහත්මයා උස්වැටකෙයියාව හා පමුණුගම රෝ. ක. පාසල් වල සේවය කළ දහම තුළ, ග්‍රාමය තුළ කාගේත් ජනප්‍රසාදය ලබාගත් සිල්වත් දැහැමි යුග පුරුෂයෙක් විය.

මීසම තුළ දහම් සේවා සංවිධානවල අවංකවම ඇප කැප වු එතුමිය මේ වන විට පමුණුගම දිව්‍ය හෘදය සමිතියේ 53 වසරක් අති විශිෂ්ට ලෙස දිවා රාත්‍රි පවා සේවාවටම කැපවූ දහම් සේවිකාවියක හා සමාජ සේවිකාවියක් ලෙස කළ කැපවූ අමිල සේවාව අති විශිෂ්ඨය. දිව්‍ය හෘදය සමිතියේ 50 වසරක විශිෂ්ඨ සේවා සම්මානයද සභා ප්‍රධානින් අතින් හිමිකරගත් එතුමිය, පමුණුගම ඇලෙන් එගොඩ සා. සෙබස්තියන් දෙව්මැඳුරේ දිව්‍ය හෘදය සමිතිය පිහිටුවීමට ද පුරෝගාමි වූවාය. තවද කුඩාකල සිටම කාන්තා මරිය හමුදාව තුළ කැප වෙමින් සමිඳු දහම් කෙත අස්වද්දන්න විවිධ අංශවලින් කළ අමිල දයා සේවාවද එතුමියගේ චරිතය තුළ ඉහලින් කැපී පෙනෙන ලක්‍ෂණයකි.

වසර 92 ක එතුමියගේ දිවිගමනේ තවමත් දහම් සේවාවේ යෙදෙමින් නිතරම දෙව්මැඳුර තුළ යැදුම් භාවනාවේ යෙදෙමින් බාලයන්ට උපදෙස් ගුරුහරුකම් දෙමින් කා අතරත් මානව දයාවෙන් හැමවිට එතුමිය නිහතමානීව සිටින්නීය.

තවමත් පැහැදිලි දෙනෙත් පෙනුම හා ඥන ශක්තිය හා මතක ශක්තිය දෙවිඳු වරමින් නොඅඩුව ඇති එතුමිය තව කලක් නිදුක් නිරෝගීව දහම් කෙතේ වැජඹීමට දෙව් ආසිරි පතමු.

**ජෝ. සංගපාලආරච්චි**
පමුණුගම



දෙවියන් වහන්සේ දානය කළ තලෙන්තු උපරිම ප්‍රයෝජනයට ගනිමින් චිත්‍රකලාවට යොමුව ඇති පමුණුගම පුල්ලුහේන පදිංචි ආනන්ද ජයලත් තරුණයා මෙවර වෙසක් උත්සවය නිමිත්තෙන් උසම හා විශාලතම තොරණ වන තොටලඟ තොරණ සැලැසුම් හා චිත්‍ර නිර්මාන කිරීම කර ඇත. කතෝලික තරුණයකුවූ මොහු ආගමික ස්ථානවල නොයෙකුත් චිත්‍ර ඇඳ ඇති අතර මෙවර වෙසක් උත්සවය නිමිත්තෙන් තොටලඟ, මැනින්මාකට්, කොස් ගස් හන්දිය දැවැන්ත තොරණ තුන සඳහාම සිය සැලැසුම් චිත්‍ර ඉදිරිපත් කර ඇත. අඳින ලද චිත්‍ර සමග ආනන්ද ජයලත් මහතා මෙහි දැක්වේ.

**සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි**

# දහමට ලැදිවූ ජැනට් බාලසූරිය

රූප සෞන්දර්යය ගැඹුරින් හදාරා රූපලාවන්‍යාගාර රාශියක් ලංකාවේ පවත්වා ගෙන ගිය පළමු පෙළේ රූපලාවන්‍ය ශිල්පිනියක වූ ජැනට් බාලසූරිය අපෙන් සමුගෙන මැයි මස 16 වෙනි දිනට පුරා වසරක් සම්පූර්ණ වීම නිමිත්තෙන් එතුමියට මෙම උපහාරය පුදමි.



උපතින් ක්‍රිස්තු භක්තිකයකු වූ මෙම ශ්‍රේෂ්ඨ කාන්තාව බොහෝ දින උදෑසන වැල්ලවත්ත සාන්ත ලෝරන්ස් දෙව් මැඳුරේ පූජාවට සහභාගිවීම දවසේ ප්‍රධාන අංගය වශයෙන් පිළිපැද්දාය. ඇයගේ දහම පිළිපැදීම එයට සීමා නොවීය.

කරුණා ගුණයෙන් පිරුණු ඇය දිළිඳුන්ට බොහෝ උපකාර කළාය. ශ්‍රවණාබාධිත දැරියන්ට ඇය ඉතා ඇලුම් කළාය. මිළ අධික වූ ඇයගේ රූප ලාවන්‍ය පාඨමාලාව එම දැරියන්ට නොමිළේ පුද කළාය. එම දැරියන් තම සේවයට බඳවා ගත්තාය. ඔවුනට සෙසු අයට මෙන් සාධාරණ වැටුපක් ගෙව්වාය. මෙලෙසින් ඇයගේ ක්‍රිස්තු පැවැත්ම මනාව දිස්වුනි. රූපසුන්දරියක් ලෙස කිරුළු පැළඳීමට ඇයට නොහැකි වූවත් රූපශ්‍රීයෙන් අගතැන් වූ ඇය

කෙරෙහි කගේත් සිත් ඇදී ගියේ ඇයගේ බැල්ම, සිනාව හා හැමදෙනා කෙරෙහිම දක්වන ගෞරවාන්විත මිත්‍රශිලිභාවය නිසයි. ඇය අපෙන් සමුගත්තත් ඇයගේ මතකය අප සිත්සතන් තුළ දීර්ඝ කාලයක් නොමැකී පවතින බව ඒකාන්තය.

**බී. ආර්. එම්. රුද්‍රිගු**
සභාපති, බිහිරි ළමා දෙගුරුන්ගේ සංගමය

# නැණරුත් පහනේ වැලිවිට ප්‍රදීපය



වැලිවිට මීසම් සංඝය පුරා ඥානාර්ථ ප්‍රදීපය, ළමා ප්‍රදීපය, Messenger, භක්ති ප්‍රබෝධනය ආදී කිතුනු ප්‍රකාශන ගම වටා බෙදා හැරීම සඳහා වැලිවිට යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ ගරු මේරි සෙලින් පෙරේරා පැවිදි සොයුරිය සියළුම බර පැන සිය කර මතට ගෙන. අවශ්‍ය සියලු කළමනාකරණයද සිදු කරමින් විශිෂ්ට මෙහෙවරක නියැලී සිටින්නීය.

එයට අමතරව වැඩිහිටි බෞතිස්මය සඳහා අන්‍යාගමිකයින් දැනුම්වත් කොට පෙළගස්වමින්ද, වාර්ෂිකව සංඝයේ ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබනට පෙළගැසෙන දු දරුවන් ඒ සඳහා ආධ්‍යාත්මිකව පෙළග ස්වමින්ද වැලිවිට ශාන්ත මරියා දේවස්ථානයේ මෙන්ම නවගමුව ශාන්ත ආනා මුණිවරියගේ දේවස්ථානයන්හි දේව මෙහෙයයන් ඇතුලු සියලුම කර්තව්‍යයනට අතහිත දෙමින් විශිෂ්ට මෙහෙවරක යෙදී සිටින්නීය.

1939 මාර්තු මස 25 දින වැලිවේරිය ගම්පියසේ පෝරුතොටගේ සෙලෙස්තීනු පෙරේරා සහ ඇඩ්ලින් ප්‍රනාන්දු යුවලට දාව හය දෙනෙකුගෙන් යුත් පවුලක දෙවැන්නා ලෙසින් උපත ලද ගරු සෙලින් සොයුරිය සිය මූලික අධ්‍යාපනය වැලිවේරිය රෝමානු කතෝලික විදුහලින් අරඹා, 1958 වසරේදී පැවිදිවරයට ඇතුලත්ව මැහුම්, ගෙතුම් උපදේශිකාවක් ලෙසින්ද, පුහුණු ගුරුවරියක් වශයෙන්ද දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි සේවය කොට 1997 වසරේ දී රජයේ සේවයෙන් ඉසිඹු ලැබීය. 2006 වසරේ සිට වැලිවිට මීසම් සංඝයට එක්ව විවිධ ක්‍රියාමාර්ග ඔස්සේ ධර්මය ප්‍රචලිත කරනට උරදෙන එතුමියට තව තවත් දේව සේවය ජනතාව අතර බෙදා හරිනට ඇවැසි දිරිය, ශක්තිය හා නීරෝගී සුවය ලැබේවා යැයි ප්‍රදීපයේ එකම පැතුමයි.

**වැලිවිට එම්. ජෝ. පාරිස්**

# ප්‍රවීන කිතුනු ක්‍රීඩකයා රටට රන්, රිදී පදක්කම් දිනා කීර්තිය ගෙන එයි

රාගම මීසමේ, ශු. පේදුරු පාවුළු මුණිඳුන්ගේ දෙව්මැඳුරට අයත් බැතිමත් කතෝලිකයකු වන, රාගම ගනේ පාරේ, 'සාලිය' නිවසේ පදිංචි ක්‍රිස්ටි මෙන්ඩිස් මහතා පසුගියදා සිංගප්පූරුවේ ටොආ පායා ජාතික ක්‍රීඩාංගනයේ දී පැවැති 34 වන සිංගප්පූරුව විවෘත ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා තරගාවලියෙන් රන් පදක්කම් දෙකක් හා රිදී පදක්කමක් දිනා ගැනීමට සමත් විය.

හෙල්ල විසි කිරීම හා යගුලිය විසි කිරීම තරගවලින් රන් පදක්කම්ද යගුලිය වීසි කිරීම තරගයෙන්



රිදී පදක්කමක්ද දිනා ගත් ක්‍රිස්ටි

වත්තල සාන්ත අන්තෝනි විදුහලේ ආදි ශිෂ්‍යයෙකු බව ගෞරවයෙන් සඳහන් කරයි.

යුද හමුදා පොලිසියේ විශ්‍රාමිකයකු වන හෙතෙම සර්විස් ලංකා ආයතනයේද සේවය කරැ'ති අතර එම ආයතනය දෙන සහයට තුති පුදයි.

තමන් කවදත් දිරිගන්වන තම ආදර බිරිඳ සිල්වියා මෙන්ඩිස් මහත්මිය හෙතෙම කෘතවේදීව සිහිපත් කරයි. 'ඥානාර්ථ ප්‍රදීපය' ද ක්‍රිස්ටි මෙන්ඩිස් මහතාට ශුභාසිංසන පුද කරයි.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

ප්‍රදීප දසත තොරතුරු




ක්‍රිස්තු වර්ෂ 2015
මැයි 24 ඉරිදා

# ශුද්ධවූ සභා මාතාවගේ උපන් මංගල්‍යය අදයි

ශු. සභා මාතාව අද ශුද්ධාත්ම ආගමන මංගලොත්සවය හෙවත් පෙන්තකොස්ත මංගල්‍යය සමරන්නීය. "පෙන්තකොස්ත" යන වදන ග්‍රීක් භාෂාවෙන් බිඳී එන්නකි. එහි අර්ථය "පනස්වැනි දින මංගල්‍යය" යන්නයි.

ලෙවී 23:15-22 ට අනුව එදා ජුදා සම්ප්‍රදාය අතර විශේෂිත වූ මංගල්‍යයක් සමරනු ලැබිණි. නුඹලා පිළිගැනීමේ පිළිවෙතින් පළමුවෙන් කපාගත් ගොයම් මිටිය පඬුරු ලෙස පුද කළ දිනට පසු සබත් දවසේ සිට සම්පූර්ණ දින 7 ක් ගණන් කළ යුතුය. හත්වන සබත් දවසට පසු පැමිණෙන පනස්වන දිනයේ දී නුඹලා නව ධාන්‍ය පූජාවක් සමිඳාණන් වහන්සේට පිදිය යුතුය. මෙසේ එදා ජුදා ජනතාව අස්වැන්න මංගල්‍යය හෙවත් පෙන්තකොස්ත මංගල්‍යය සිදුකරන ලදි.

අප සභා මාතාව ද එම මංගල්‍යයට සමගාමීව යමින් ජේසු සමිඳාණන් වහන්සේගේ උත්ථානය නමැති මහා ජයග්‍රාහී නාඹුල් එලය නෙලා ගැනීමේ සත් සතියට පසු පනස් වැනි දිනයේදී ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩමකිරීමේ මංගලෝත්සවය පවත්වන්නීය. එදා ප්‍රථම පෙන්තකොස්ත දින සේනාකුළු ශාලාවේදී ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරීමත් සමඟම ජීවමාන ශුද්ධවූ සභාවේ උපත සිදුවිය. එබැවින් අද දින අපි සභා මාතාවගේ උපන් මංගල්‍යය සැමරීම ද සිදු කරන්නෙමු.

මෙවන් දිනක අප කිතු සමිඳාණන් ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟ තිබුණු සමීප සබැඳියාව පිළිබඳව අවදි විය යුතු අතරම ඔවුන් වහන්සේ සමඟම අපගේ ඇති ගැඹුරු බැඳීම, මෙහෙයවීමට නතු වීම පිළිබඳ කතෝලිකයන් ලෙස කොතෙක් දුරට අවදි වූවාදැයි හැරී බැලීම හොබනේය. ශුද්ධාත්මයාණන් වහන්සේ නොමැතිව කිතුනු ජීවිතයක් ගැන කතා කරනවා නම් එය අපගේ ජීවිතවල තිබෙන්නාවූ ලොකු අඩුවකි. හිස් ජීවිතයකි. "දේවාත්මයාණන් විසින් මඟ පෙන්වනු ලබන්නෝ දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය." (රෝම 8:14) යන වචනය අප තුළ ඉටුවෙනු සඳහා ජීවිත ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේට පවරමු. ඔවුන් වහන්සේට ඉඩ දෙමු. අද දින අපි ඒ සඳහා වැඩි වැඩියෙන් අවදි වෙමු.

"ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි කල නුඹලා බලය ලබන්නහුය"යි ජේසු සමිඳාණන් එදා ප්‍රකාශ කළ වදන් සත්‍යය බව සේනාකුළු ශාලාවේ දෙවිඳුන් අභියස පෙනී සිටි භාග්‍යවන්ත අම්මා මෙන්ම ශ්‍රාවකයෝ ද අත්දුටහ. එලෙසම ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමත් සමඟම ඔව්හු ශුද්ධාත්ම වරම් දීමනා අත්දැකීමට ද පටන් ගත්හ.

එපමණක් නොව යම් කෙනෙක් තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩසිටින සේක්ද? එතැන නව මැවිල්ලක් සමූලික පරිණාමයක් සිදුවන්නේ ය. එසේ වීමේදී පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නට ඔහුව හෝ ඇයව ශුද්ධාත්මයාණෝ මෙහෙයවන සේක. තවද තමන් ලබන ඒ මහා ජීවිත වෙනස කිසිවකුට සැඟවිය නොහැකිය. එය ප්‍රකාශ වන්නේම ය. එබැවින් ශ්‍රාවකයන් යම් තැනක සිටියේ ද ඔවුන් තුළ නිතැතින්ම ජීවත් වූයේ ප්‍රකාශ වූයේ සමිඳු සුපුවතයි. ඔහු එය නොබියව ප්‍රකාශ කිරීමට පටන් ගත්හ. එබැවින් දවසින් දවස මෙම සුපුවත ලැව්ගින්නක් සේ ඇවිලුනි. දිනෙන් දින අප සභා මාතාව වටා දේව ජනතාව ඒකරාශී වූහ.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව තම ජීවිතයේ එකම සමිඳාණන් ලෙස පිළිගත් පාවුළු තුමා ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවනු ලබන ජීවිතයකට ඇතුළු විය. ශු. පාවුළු තුමා අපගේ ශරීරය ගැන දක්වමින් එය සනාථ කරයි. එනම් මිනිස් සිරුරේ බොහෝ අවයව තිබුණත් එකම ශරීරයක් වන්නාසේම කිතුනු සංඝය ද එකම ශරීරයක් බවයි. එකම ආත්මයාණන් වහන්සේගේ මෙහෙයවීමට කිතුනු සංඝයට ඉඩ දෙන විට විවිධ වූ වරම් දීමනා අත්දුටුවන් සිටින්නේ සියල්ලන් තුළ ක්‍රියා කරන එකම දෙවියන් වහන්සේය"යි පාවුළු තුමා පවසයි. ඒ දේව ප්‍රේමයට එකිනෙකාගේ හදවත් සුව කරමින්, ශුද්ධාත්ම ගින්න දස දෙස ඇවිලිය හැකි බව එතුමන්ගේ අත්දැකීමයි. එබැවින් අද අපට ඇරියුම් කරනු ලබන්නේ ජේසු සමිඳාණන් වහන්සේව අපගේ ජීවිතය තුළ එකම සමිඳාණන් කර ගනිමින් ශුද්ධාත්මයාණන් වහන්සේට මෙහෙය වන්නට ඉඩදීමය.

**ටී. එච්. අජිත් ශාන්ත**
**බොරලැස්ස**



කොළඹ පදවියේ මරිය හමුදා අධ්‍යක්ෂ වශයෙන් ගරු රොනී පොන්සියස් පෙරේරා පියතුමාව පත්කර ඇත. කොළඹ මරියහමුදා මූලස්ථානයේ පැවති කොළඹ දිසාවේ මරිය හමුදා උසස් පාලක සභාවට ප්‍රථම වරට පැමිණි එතුමා මරිය හටයින්ට අනුශාසනාවක් පැවැත්වීම මෙම සේයාරුවෙන් දැක්වේ. **(බෙන්ජමින් කිරිහෙට්ටි)**



පමුණුගම සුසාන භූමිය සංවර්ධනය කෙරේ. සුසාන භූමියේ ඉඩකඩ නොමැති බැවින් එවකට අනුනායකව සිටි ගරු ජෝ වික්‍රමසිංහ පියතුමා සුසාන භූමියට අවශ්‍ය ඉඩම් කොටසක් ශු. පවුලේ කන්‍යාරාම භූමියෙන් ගැනීමට සාකච්ඡා කළත් එය ව්‍යර්ථ විය. මෙම කන්‍යාරාමය පමුණුගම මීසමෙන් ඉවත් කරගත් පසු මෙම ඉඩම අගරදගුරුතුමා බාරයට ගත් අතර එම ඉඩම් කොටස පමුණුගම දෙව්මැඳුරට අයත් බව පැහැදිලි විය. ඒ අනුව අවශ්‍ය ඉඩම් ප්‍රමාණය ලබා ගත් මීසම් සේවක ගරු ආනන්ද විතාන පියතුමා මෙම ඉඩම් කොටස සුසාන භූමියටම යා කර ජනතා අයිතියට පවරන ලදි.



බදුල්ල පදවියේ මහියංගනය මීසමට අයත් උල්හිටිය සා. අන්තෝනි සිද්ධස්ථානයේ කල්වාරියේ ස්ථාපිත පාද නමස්කාර ස්ථාන ප්‍රතිමා කිහිපයකට පසුගියදා වල් අලි ප්‍රහාරයක් එල්ල විය. මෙම ප්‍රතිමාවන් නැවත ස්ථාපිත කිරීම සඳහා මහියංගනය මීසම් සේවක ගරු ප්‍රියන්ත ප්‍රනාන්දු පියතුමා සැදැහැවත් ඔබගේ ආධාරය පතයි. විමසීම් දු. අංක 0718417870

## අගරදගුරු පදවි ධර්මෝපදේශ අපෝස්තලික සේවාව මඟින්
# දහම් ගුරුවරුන් සඳහා ආචාර ධර්ම පද්ධතියක්

දහම් ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය, පොදු නීති මාලාව හා දහම් ගුරුවරුන් බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳව අගරදගුරු පදවි ධර්මෝපදේශ අපෝස්තලික සේවාව විසින් සම්පාදිත පොත් පිංච දැන් නිකුත් වී ඇත.

මෙය අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු දිනේෂ් ප්‍රියශාන්ත පියතුමන්ගේ මඟ පෙන්වීමෙන් සම්පාදනය කොට ඇත.

# පවුල සහ සන්නිවේදනය පිළිබඳ නේවාසික සම්මන්ත්‍රණය

පවුල සහ සන්නිවේදනය පිළිබඳ නේවාසික සම්මන්ත්‍රණයන් මැයි මස 8,9,10 තෙදින පුරා පිළියන්දල සුබෝධි මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. SIGNIS ශ්‍රී ලංකා සහ ජාතික කතෝලික ජනසන්නිවේදන කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද මෙම සම්මන්ත්‍රණයට ශ්‍රී ලංකාවේ පදවි නවයක් සහ පැවිදි නිකායන් නියෝජනය කරමින් ගරු පියවරුන් පැවිදි සොයුරියන් සහ ගිහි නියෝජිතයින් 60 දෙනෙක් සහභාගි වූහ.

මෙහිදී පවුල තුළ සන්නිවේදනයේ ඇති වැදගත්කම පිළිබඳව ජාතික කතෝලික ජනසන්නිවේදන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ, ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමන් ද, පවුල තුළ ඵලදායි ලෙස සන්නිවේදනය කරන්නේ කෙසේද? යන්න පිළිබඳව කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය සරත් විජේසූරිය මහත්මාණන් ද, ළමුන් සහ තරුණ තරුණියන් වෙත සමාජ මාධ්‍යයේ ඇති බලපෑම පිළිබඳව ප්‍රවීන උපදේශක චන්දන තිසේරා මහත්මාණන් ද, නිවසේ මාධ්‍ය පරිසරය මැද දෙමාපිය වගකීම පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා සහ මානව විද්‍යා අංශයේ මහාචාර්ය ප්‍රනීත් අභයසුන්දර මහත්මාණන් ද දේශන පැවැත්වූහ.

මෙම මාතෘකා ඔස්සේ පැවති සාකච්ඡා මණ්ඩප මෙහෙයවන ලද්දේ ගරු ජූඩ් බර්නාඩ් පියතුමා, ජෙනට් නෙත්තසිංහ පැවිදි සොයුරිය, චන්දිමා නිශ්ශංක මහත්මිය සහ නුවන් ලියනගේ මහත්මාණන් විසිනි.

## 30 වසරක යුග දිවි සැමරුම



ප්‍රදීප ලේඛක ගෝනවල ලූෂන් එඩ්වඩ් පෙරේරා සහ ටෙක්ලා රංජනී සමරවික්‍රම යුවළගේ යුග දිවියේ 30 වන විවාහ සැමරුම මෙම මැයි මස 25 දිනට යෙදේ. එම දෙපළට දුව හංසනී, පුතා උදාර ඇතුළු සියලු නෑ හිත මිතුරන් සමඟ "ප්‍රදීපය" දෙවිඳු ආසිරි පතමු.

## දෙවර්ෂ පූර්ණ සිහිකිරීම!



| උපත | | විපත |
|---|---|---|
| 1934 - 05 - 17 | | 2013 - 05 - 24 |

නො:109, පේරලන්ද, රාගම නිවසේ විසූ

**බී.පැට්‍රීෂියා සිල්වා**

ආදර අම්මේ, ඔබ අපෙන් සමුගෙන දෙවිඳුන් වෙත ගොස් මැයි මස 24 වන දිනට දෙවසරක් සපිරේ. කාලය ගෙවී ගියත් ඔබ නැති පාළුව තුලින් මතු වූ වේදනාව සමගින් ඔබ පිළිබඳ මතකයන් අප හදවත් තුල සැමදා ජීවමානයි.

ඔබ වෙනුවෙන් දෙවිඳුන් යදින්නේ,
ඔබගේ ආදර දූ පුතුන්, බෑණාවරුන්, ලේලිවරුන්, සහ මුණුබුරු මිණිබිරියන්

## දෙවර්ෂ පූර්ණ සිහිකිරීම



| මනු උපත | සග උපත |
|---|---|
| 1943 | 2013 |
| 12 | 05 |
| 17 | 26 |

ජා-ඇල, තුඩැල්ල විසූ

**එම්. සනී රුද්‍රිගු මහතා**

ඔබ අපෙන් සමුගෙන දෙවිඳුන් වෙතට ගොස් වසර දෙකක් සපිරුණ ද සැමදා අප හදවත් ඔබ ළඟමය. දෙවිඳුන්ගේ සිරිවත දකිමින් එතුමන් අභියස සදා රැඳෙන්න වරම් පතන්නේ ආදර බිරිඳ, ආදර දුව ඇතුළු පවුලේ සැමයි.

# ගුරු පත්වීම් සඳහා අධ්‍යාපන විද්‍යාපීඨ වලට ඇතුළත් කර ගැනීම

අධ්‍යාපන විද්‍යාපීඨ වලට ඇතුළත් වීමට අවශ්‍ය අයට ඒ සඳහා ඉල්ලුම් කරන ලෙස 2015. 05. 08 වන සිකුරාදා දින අංක 1,914 දරණ ගැසට් පත්‍රයෙන් දැනුම් දී ඇත.

කතෝලික ධර්මය, ප්‍රාථමික අධ්‍යාපනය, විද්‍යාව, ගණිතය, පළමු බස, ඉංග්‍රීසි, චිත්‍ර, විශේෂ අධ්‍යාපනය ඇතුළු විෂයන් 32 ක් සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් ඉල්ලුම් කළ හැකිය. 2013 වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස. උ.පෙළ විභාගයේ දී විෂයන් තුනකින් සමත් වූ අයට ඉල්ලුම් කළ හැකි අතර ඉල්ලුම්පත් යැවීමේ අවසාන දිනය 2015. 05. 29 වේ. විමසීම් අශාන්ති - දුරකථන 0112699129

# සොබාදහමේ දෙව් දහම පිළිබඳ සංවාදය

පරිසරයට ආදරය කිරීම, ගරුකිරීම, රැකගැනීම, වැඩිවර්ධනය කිරීම බයිබලීය දේව ධර්මය සමඟ විග්‍රහ කරමින් පාරිසරික දෙව්දහමක් ගොඩනගන්නට මේ දරන වෑයම ලාංකේය කතෝලික සභාව තුළ ආරම්භක පියවරක් ලෙස හොඳ මඟපෙන්වීමක් ලබා දීම පිණිස මහින්ද නාමල් සොයුරා විසින් රචිත, 'සොබාදහමේ දෙව්දහම' කෘතිය එළිදක්වා ජනගත කිරීම 2015 මැයි 25 සඳුදා සවස 3.00 ට මරදාන සමාජ හා සාමයික කේන්ද්‍රයේදී පැවැත්වේ.

සොබාදහමේ දෙව් දහම පිළිබඳ සංවාදයට පරිසරයට ආදරය කරන කිතුනු ඔබ සැමට ආරාධනා!